# දහම් පාසල

## 7 ශ්‍රේණිය



# දහම් පාසල

## 7 වන ශ්‍රේණිය

### ලේඛක මණ්ඩලය

ශාස්ත්‍රපති අතිපූජ්‍ය ගන්තුනේ අස්සජි මහනායක ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති පූජ්‍ය ඇස්වත්තේ රේවත ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති පූජ්‍ය වදමල්දෙණියේ සෝමාලෝක ස්වාමීන් වහන්සේ
ආචාර්ය ධර්මසේන හෙට්ටිආරච්චි මහතා
ශාස්ත්‍රපති ගුණසේන මහතන්ත්‍රිගේ මහතා
ආචාර්ය දේශප්‍රිය ගුණසේන මහතා

සම්පාදනය හා ප්‍රකාශනය
**බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා ජනරජයේ පරිත්‍යාගයක් වූ මෙම පොත නිසි ලෙස පරිහරණය කර සහෝදර සිසුවෙකුට පිරිනැමීම සඳහා වසර අවසානයේ ආපසු භාරදීම ඔබේ යුතුකම වන්නේය.

## උපදේශක මණ්ඩලය

අතිපූජ්‍ය තෙරිපැහැ සෝමානන්ද මහානායක ස්වාමීන් වහන්සේ
අතිපූජ්‍ය ගන්තුනේ අස්සජි මහානායක ස්වාමීන් වහන්සේ
ආචාර්ය පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේ
මහාචාර්ය බෙල්ලන්විල විමලරතන ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති පූජ්‍ය ගෝණදූවේ ගුණානන්ද ස්වාමීන් වහන්සේ
ආචාර්ය පූජ්‍ය තුඹුල්ලේ සීලක්ඛන්ධ නායක ස්වාමීන් වහන්සේ
පූජ්‍ය ත්‍රිකුණාමලයේ ආනන්ද අනුනායක ස්වාමීන් වහන්සේ
පූජ්‍ය දික්වැල්ලේ තිස්ස නායක ස්වාමීන් වහන්සේ
පූජ්‍ය මැදගම ධම්මානන්ද ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති ගුණසේන මහතන්ත්‍රිගේ මහතා
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් - චන්ද්‍රප්‍රේම ගමගේ මහතා
බෞද්ධ කටයුතු කොමසාරිස් - එච්.එන්. කුමාරි මහත්මිය

## පිටකවරය සහ චිත්‍ර

ජයලත් රූපසිංහ මහතා

## සංස්කරණය හා මුද්‍රණ කටයුතු සම්බන්ධීකරණය

ව්‍යාපෘති නිලධාරි කේ.එස්. අශෝක මංජුල බණ්ඩාර මහතා
ව්‍යාපෘති නිලධාරී ජේ.පී. චමිලා රෝහිණී ජයලත් මහත්මිය

## පරිගණක පිටු සැකැස්ම

ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති නිලධාරී ජයසුන්දර පෙරේරා මහතා

## මුද්‍රණය

චම්පිකා ප්‍රින්ටර්ස් - කුරුණෑගල

**ශ්‍රී ලංකා ජනාධිපති**

**இலங்கைச் சனாதிபதி**

**President of Sri Lanka**

## අතිගරු ජනාධිපතිතුමාගේ ශුභාශිංසන පණිවුඩය

අධ්‍යාපනය මඟින් කෙනෙකුට තමා තුළ ඇති හැකියාවත්, ශක්තියත් මතුකොට ගෙන ගුණාත්මකව හා සාර්ථකව ඉහළ තලයකට ගමන් කිරීමේ හැකියාව ලැබේ. ගුණ නැණ බෙලෙන් යුතු දරුවෙකු බිහිකිරීමට පාසලෙන් පමණක් ලබා ගන්නා අධ්‍යාපනය ප්‍රමාණවත් නොවන බව තර්කයෙන් තොරව පිළිගත යුතු සත්‍යයකි. එබැවින් දරුවාගේ ජීවිතය යහමගට යොමු කිරීමේ කේන්ද්‍රීය ස්ථානය වන්නේ දහම් පාසලයි.

තම දරුවාට දහම් අධ්‍යාපනය ලබාදීම දෙමාපියන් සතු සුවිශේෂ වගකීමකි. තම දරුවා උගතෙකු, දක්ෂයෙකු පමණක් නොව සාරධර්ම හා ගුණ දහමින් හෙබි සදාචාර සම්පන්න පුද්ගලයෙකු කිරීමට පියවර ගැනීම ද දෙමව්පියන්ගෙන් ඉටුවිය යුතු වටිනා කාර්යභාරයකි.

යහපත් සමාජයක් උදෙසා 1895 දී උදාර සත්පුරුෂයින්ගේ පුරෝගාමීත්වයෙන් ඇරඹුන දහම්පාසල් සේවාවෙන් එදා මෙදා තුර සමාජයට දායාද කර දුන් දරු පරපුර අප රටේ අගනා වස්තුවකි. සමාජයට වැඩදායි දරු පරපුරක් ගැනීමෙහි ලා ලාභ අපේක්ෂාවෙන් තොරව තම කාලය ශ්‍රමය ස්වෙච්ඡාවෙන් කැප කරන සමස්ත දහම් පාසල් ගුරු පරපුරට අප සියලු දෙනාගේම ප්‍රණාමය හිමිවිය යුතුය. යහ ගුණ වැඩීමට අමතරව භාවනාව තුළින් දරුවාගේ විනය සහ පෞරුෂත්වය වැඩීම දහම් පාසල තුළින් සිදුවන තවත් සුවිශේෂි කර්තව්‍යයකි.

ආදරණීය දූවේ, පුතේ, දහම්දැනුම ලබාගැනීම උදෙසා ඔබ වෙත පිරිනැමෙන මෙම අගනා කෘතිය හොඳින් පරිශීලනය කොට ලබන දහම් දැනුම ඔබේ ජීවිතය ඔපවත් කර ගැනීමටත් ඔබට ජීවන මඟ හමුවන විවිධ දුක් ගැහැට උපේක්ෂාවෙන් විමසා ජයග්‍රහණය කරා ළඟාවීමටත් හේතුවේවායි ඉත සිතින් ප්‍රාර්ථනය කරමි !

ඔබට තෙරුවන් සරණයි !

2015 මාර්තු මස 16 වැනි දින

මෛත්‍රීපාල සිරිසේන

# ගුරුභවතුන්ගේ අවධානය සඳහා

මෙය දහම් පාසල් හත්වන ශ්‍රේණියට නියමිත පාඨ ග්‍රන්ථයයි. මෙහි මුල් කොටසේ පාඩම් විසි පහකි. පාලි සහ අභිධර්ම විෂයන් ද මෙම ශ්‍රේණියේ සිට ආරම්භ වන අතර ඒ සඳහා ද පාඩම් කිහිපයක් ඇතුළත්ය.

මෙහි දැක්වෙන සියලු පාඩම් ජීවිතයට ප්‍රයෝජනවත් වන පරිදි ප්‍රායෝගිකව ඉගැන්වීමට අපේක්ෂිතය. විශේෂයෙන්ම චරිත කතා ඇසුරෙන් මතු කර ගත හැකි ආදර්ශ සිසුන්ට පෙන්වා දීම අවශ්‍යය. පාලි ගාථා හා කවි නිවැරදි උච්චාරණයෙන් යුතුව ගායනා කිරීමට හුරු කිරීමත් අවශ්‍යය. දිනපතා විනාඩි කිහිපයක් භාවනා පුහුණු කිරීමත් කළ යුතු අතර ඒ පිළිබඳ පුහුණුවක් ද ලබා දිය යුතුය.

ඒ ඒ දිනට නියමිත පාඩම් කියවා පූර්ව සූදානමක් ඇතිව පන්තියට යාමට පුරුදු වන්න. හැමවිටම ගුරුවරයාගේ යුතුකම් විය යුත්තේ මීළඟ සතියේ පාඩම් මොනවාදැ යි ශිෂ්‍යයන් දැනුවත් කිරීමය. පෙළ පොතේ පාඩම් අවසානයේ දක්වා ඇති ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කිරීම ද අවශ්‍යය.

මෙම පාඨ ග්‍රන්ථයට පදනම් කරගෙන ඇති නිපුණතා සහ අදාළ පාඩම් පහත දැක්වේ. එම නිපුණතා ඉටුවන පරිදි ඉගැන්වීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

| *නිපුණතාව* | *පාඩම්* |
|---|---|
| නිපුණතාව 02 | 2, 3,8,15,18,22 |
| නිපුණතාව 03 | 19,20,21 |
| නිපුණතාව 04 | 7,9,17 |
| නිපුණතාව 05 | 4,5,11 |
| නිපුණතාව 06 | 12,13,16,24 |
| නිපුණතාව 07 | 6,10 |
| නිපුණතාව 09 | 14,23,25 |
| නිපුණතාව 10 | පාලි හා අභිධර්මය |

**ලේඛක මණ්ඩලය**

# දහම් පාසල් අධ්‍යාපනයේ පරමාර්ථය හා නිපුණතා

## පරමාර්ථය

බුදුදහම පදනම් කර ගෙන තමා සහ අවට පරිසරය පිළිබඳ අවබෝධයක් ඇති, එම අවබෝධය අනුව හැසිරෙන සහ එසේ හැසිරීමේ ප්‍රතිඵල අත්දකින ගුණ නැණ දෙකෙන් පිරිපුන් දරු පිරිසක් බිහි කිරීම.

## නිපුණතා

### දහම් පාසල් දරුවා

1. දහම් පාසල් අධ්‍යාපනයේ වටිනාකම හැඳින ගෙන තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි.
2. බුද්ධචරිතය හා වෙනත් ශ්‍රේෂ්ඨ චරිත හැඳින ඒවා චාරිතායනය කරයි.
3. පන්සිල් සුරකිමින් සඟරුවනට හා ගුරු දෙගුරුන්ට ගරු බුහුමන් දක්වයි.
4. ධර්මය පිළිබඳ නිවැරදි, නිරවුල් දැනුමක් ඇති ව තමන්ටත්, අනුන්ටත් හිත පිණිස වන පෞරුෂයක් ගොඩනගා ගැනීමට ක්‍රියා කරයි.
5. කායික හා මානසික සෞඛ්‍යය පිළිබඳ සැලකිලිමත් වෙමින්, විවේකය ඵලදායී ලෙස ගත කරයි.
6. දේශාභිමානයෙන් යුතුව ශාසනික උරුමය සහ බෞද්ධ සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කරයි.
7. බෞද්ධ නිර්ණායක අනුව කළයුතු නො කළයුතු දේ නිවැරදිව හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.
8. බෞද්ධ ආර්ථික හා දේශපාලන දර්ශනය හැඳින ගෙන ඊට අනුගත වෙයි.
9. බෞද්ධ සිරිත් විරිත්, වත් පිළිවෙත් හා පරිසරය හැඳින ඊට අනුරූපී ව ක්‍රියා කරයි.
10. පාලි භාෂා කුසලතාව සහ අභිධර්මය පිළිබඳ මූලික දැනුම ඇති කර ගැනීමට ක්‍රියා කරයි.

පිටුව

පාලි


පාලි භාෂාව ඉගෙනීමේ අවශ්‍යතාව 118

01. පාලි අක්ෂර මාලාව හැඳින ගනිමු 120
02. තෙරුවන් සරණ යෑම 124
03. පන්සිල් සමාදන් වීම 128
04. ත්‍රිවිධ චෛත්‍ය වන්දනාව 131
05. පහන් පූජා කිරීම 134
06. මල් පූජා කිරීම 138


අභිධර්මය


01. සිත 142
02. කාමාවචර සිත් 145
03. මහග්ගත සිත් 150
04. ලෝකෝත්තර සිත් 153

# 1 පාඩම

## ඉසිපතනයෙන් ඇරඹුණු සදහම් චාරිකාව

මඳ පවන් මැද සිලි සිලි හඬින් සැලෙන තුරු ලිය පත් ඇති ගත නිවන සිසිල රැඳුණු බරණැස ඉසිපතන මුව වනයෙහි බුදුරජාණන් වහන්සේ සක්මන් කරමින් වැඩ සිටි සේක. පසෙක විවේක සුවයෙන් කල් ගෙවන පස්වග මහණුන් වහන්සේලාය. මේ අතරේ වැසි සමය උදාවිය. එබැවින් බුදුරජාණන් වහන්සේ රහතන් වහන්සේලා සමඟ ප්‍රථම වස් කාලය ගත කරන්නේ බරණැස ඉසිපතනාරාමයේ ය.

පස්කම් සුවයෙහි කළකිරී සිටි බරණැස සිටු පුත් යස ඉසිපතනයට පැමිණියේ මේ කාලයේදී ය. සතුටු සාමීචි කතාබහෙන් පසුව බුදුරජාණන් වහන්සේ ඔහුට චතුරාර්ය සත්‍යය දේශනා කළ සේක. බුද්ධිය මුහුකුරා සිටි හෙතෙම බුදුබණ ඇසූ සැණෙකින්ම සෝවන් විය. පසුදා උදෑසන සිටුතුමා මාළිගාවේ පුතු නැති නියාව දැන ඔහුගේ පා සටහන් අනුව ඉසිපතනයට පිවිසියේය. එහිදී බුදුරජාණන් වහන්සේගෙන් බණ ඇසූ බරණැස් සිටුතුමා තෙරුවන් සරණ ගිය ප්‍රථම උපාසක බවට පත්විය. යස සිටුපුත් රහත්වූයේ එසේ තම පියාට දෙසූ ධර්මය ඇසීමෙනි. ඉන්පසු සිටුතුමා තම පුතු දැක ඉමහත් සතුටට පත්ව පසුදින දානයට බුදුරජාණන් වහන්සේට ආරාධනා කෙළේය. අනතුරුව යස කුමාරයා පැවිද්ද හා උපසම්පදාව ලැබුවේ ය.

සිටු මැදුරට වැඩමවා බුදුරජාණන් වහන්සේ සහ රහතන් වහන්සේලා දන් වැළඳූහ. අනුමෝදනා බණ ඇසූ යස තෙරණුවන්ගේ මව ද, ගිහිකල බිරිඳ ද සෝවන් ව තෙරුවන් සරණ ගියහ. මෙම දෙදෙනා තෙරුවන් සරණ ගිය ප්‍රථම උපාසිකාවෝ ය.

යස කුලපුත්‍රයා පැවිදි වූ පුවත අසා ඔහුගේ මිතුරන් පනස් හතර දෙනා ද පැවිදිව රහත් වූහ. ඒ වන විට බුදුරජාණන් වහන්සේගේ

පැවිදි ශ්‍රාවක පිරිස හැට නමක් විණි. එම හැමදෙනා වහන්සේ අමතා බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ.

"චරථ භික්ඛවේ චාරිකං, බහුජන හිතාය බහුජන සුඛාය ලෝකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දේව මනුස්සානං මා ඒකේන ද්වේ අගමිත්ථ"

වැඩි පිරිසකට හිත සුව සලසනු පිණිස
ලෝ වැසි දනට අනුකම්පා වන පිණිස
දෙව් මිනිසුන්ට යහපත සලසනු පිණිස
හැසිරෙනු ගම් දනව්වල තනිවම පිවිස



මෙලෙස බොහෝ දෙනකුට යහපත උදාවනු පිණිස එම සැටනම ප්‍රදේශ සැටක සදහම් චාරිකාවෙහි යෙදවූහ. මේ බුදු සසුනේ පළමු ධර්ම දූත පිරිස යි. ඉක්බිතිව බුදුරජාණන් වහන්සේ ද උරුවෙල් දනව්ව බලා වැඩම කළ සේක. නායකයා කියන ආකාරයට ම කරන, කරන ආකාරයට ම කියන අයකු විය යුතුය යන ආදර්ශය තමන් වහන්සේ ද චාරිකාවෙහි යෙදීමෙන් පෙන්වා දුන්හ.

උරුවේලාවට වැඩමවන අතරමගදී උන්වහන්සේට තවත් තරුණ පිරිසක් හමුවූහ. ඒ භද්දවග්ගිය කුමාරවරුන්ය. බුදුරජාණන් වහන්සේ

කාන්තාවක සෙවීමට වඩා තමන් ගැන සෙවීම වැදගත් බව ඔවුනට පෙන්වා දුන්හ. කුමාරවරුන් බුදු සච්චන් බවට පත්වූයේ ඒ සත්‍යය අවබෝධ කරගත් බැවිනි. මෙසේ නිවැරදි දර්ශනය බුදුරජාණන් වහන්සේ ඔවුනට දායාද නොකරන්නට ඔවුන් වල්මත් වන්නට ඉඩ තිබුණි. නොපසුබට ව අභීත ව ක්‍රියා කිරීම, ගැටලුවල නියම තත්ත්වය හඳුනාගැනීම, ඒවාට විසඳුම් සෙවීම වැනි ගුණාංග භද්‍ද වග්ගිය රහතන් වහන්සේලාගෙන් අපට උගත හැකි ආදර්ශ අතර වේ.

දෙවන ධර්මදූත පිරිස ද දහම් චාරිකාවේ යෙදවූ බුදුරජාණන් වහන්සේ උරුවේලාවේ නේරංජරා නදිය අසබඩට වැඩම කළහ. එකල එම ගංතෙර විසූ උරුවේල කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප යන තුන් බෑ ජටිලයෝ දහසක් වූ තම පිරිස සමඟ බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය අසා පැවිදි වූහ. සියලු දෙනාම රහත් වූයේ ආදිත්ත පරියාය සූත්‍රය ඇසීමෙනි.

සරු බිමක ධාන්‍ය වගා කර සරු අස්වනු නෙළාගන්නාක් මෙන් පැවිදි වන බුද්ධිමත් තරුණයෝ වැඩි වූහ. එසේ වූයේ නිවැරදි මග පෙන්වීම, අගතිගාමී නොවීම, නම්‍යශීලීවීම වැනි මහඟු නායකත්ව ලක්ෂණ බුදුසිරිතෙහි පැවතුණ බැවිනි.

බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවන්නේ ද මේ සමයේදීම ය. ලක්දිව මහියංගණයට වැඩමවා බුදුරජාණන් වහන්සේ යක්ෂයන් දමනය කළහ. එකල සුමන දෙව් පුතුගේ ඉල්ලීම මත කේශ ධාතූන් වහන්සේලා ලබාදී නැවත උරුවේලාව බලා වැඩි සේක. අනතුරුව බුදුරජාණන් වහන්සේ දහසකට අධික වූ භික්ෂූන් වහන්සේලා සමඟ රජගහ නුවරට වැඩම කළහ. ඒ භික්ෂු පිරිස අතර පෙර ජටිල නායකයා ලෙස සිට පැවිදි වූ උරුවෙල කාශ්‍යප තෙරණුවන් සිටිනු දැක බිම්බිසාර රජතුමා ඇතුළු ජනතාවට ඇතිවූයේ විමතියකි. ඔවුහු බුදුරජාණන් වහන්සේට තම ප්‍රසාදය හා ගෞරවය පුද කළහ.

බුදුරජාණන් වහන්සේ රජතුමා ඇතුළු පිරිසට මහා නාරද කස්සප ජාතකය දේශනා කළ සේක. එම ධර්මය ඇසූ රජතුමා ප්‍රධාන

විශාල පිරිසක් සෝවන් වූහ. මගධයේ රජවීම, තම රටට බුදුරජාණන් වහන්සේ වැඩමවීම, දහම් ඇසීම, බුදුරජාණන් වහන්සේට උපස්ථාන කිරීම, ධර්මය අවබෝධවීම යනු බිම්බසාර රජතුමාට තිබුණු බලාපොරොත්තු පසකි. එම ප්‍රාර්ථනා සියල්ල මල්පල ගැන්වීමෙන් රජතුමා අමන්දානන්දයට පත්විය. ඒ නිසාවෙන් ම බුදුරජාණන් වහන්සේ ප්‍රධාන භික්ෂූන් වහන්සේලාට දන් පැන් පිළිගැන්වූ රජතුමා වේළුවන උයන සසුනට පූජා කළේය.

බුදු සසුනට පිදූ පළමු ආරාමය වූ වේළුවනයෙහි බුදුරජාණන් වහන්සේ වැඩ සිටියදී ඉතා වැදගත් සිදුවීමක් විය. එනම් සංජය පිරිවැජියාගේ ප්‍රධානම ශිෂ්‍යයන් වූ උපතිස්ස කෝලිත දෙදෙනා පැවිදිවීම යි. මෙම තරුණ පිරිවැජියන් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණියේ අස්සජි මහ රහතන් වහන්සේ ගේ මඟ පෙන්වීම අනුවය. පැවිදිව රහත්වීමෙන් පසු උපතිස්ස කෝලිත දෙදෙනා හැඳින්වූයේ සැරියුත් හිමි සහ මුගලන් හිමි යන නමිනි. සංජය පිරිවැජියාගේ දෙසිය පනහක් වූ පිරිස ද එම දෙනම අනුගමනය කරමින් පැවිදි වූහ.

බුදුරජාණන් වහන්සේ එතෙක් සසුනට එක්ව සිටි සැමදෙනා වහන්සේ ම රැස්කර පළමු සඟ සමුළුව පවත්වා සැරියුත් මහ රහතන් වහන්සේත් මුගලන් මහ රහතන් වහන්සේත් අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා බවට පත් කළ සේක. එම තනතුර ගැන සියල්ලන්ම දැනුවත් කළහ. එසේම සැරියුත් මහ රහතන් වහන්සේ නුවණැති භික්ෂූන් වහන්සේලා අතර අග තනතුරට ද, මුගලන් මහ රහතන් වහන්සේ ඍද්ධිමත් භික්ෂූන් වහන්සේලා අතර අග තනතුරට ද පත් කරන ලදහ.

බුදුරජාණන් වහන්සේ මේ තුළින් සමානාත්මතාව, අනුකම්පාව, නිවැරදි තීරණ ගැනීම, සුදුස්සාට සුදුසු තැන ලබාදීම, වගකීම් පවරාදීම වැනි උසස් නායකත්ව ලක්ෂණ පෙන්නුම් කළහ.

**ක්‍රියාකාරකම්:**

මෙම පාඩමේ එන සිදුවීම් හා ඒවා ඇසුරෙන් ගත හැකි ආදර්ශ පහත සඳහන් අන්දමට වගුගත කර දක්වන්න.

| සිද්ධිය | ආදර්ශ |
|---|---|
| | |

**පැවරුම:**

පහත සඳහන් යෙදුම්වල අර්ථ දක්වන්න.

- භුත්තානුමෝදනා
- යථාවාදී තථාකාරී ගුණය
- අනුමෙවෙනි බණ

## 2 පාඩම

### සැදැහැ වඩනා බුදුගුණ මහිම

අපගේ ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ ලෙහෙනුන්ගේ අභය භූමියෙහි පිහිටා තිබුණ වේළුවනාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි රජගහ නුවර සම්දිටු සහ මිසදිටු නමින් කුමාරවරු දෙදෙනෙක් වූහ. සම්දිටු කුමාරයා තම මව්පියන් කියා දුන් පරිදි ස්වාමීන් වහන්සේ නමක් දුටුවිට වඳින්ටත් "නමෝ බුද්ධාය" කියා නිතර පැවසීමටත් පුරුදු විය. එබැවින් ඔහු යන එන නිදන පුබුදින ක්‍රීඩා කරන සැමවිට ම තම මුවින් ප්‍රකාශ කළේ "නමෝ බුද්ධාය" කියා යි. මේ නිසා ම ක්‍රීඩා කිරීමේ දී මිසදිටු කුමාරයා පරදවා හෙතෙම ජය ලැබුවේය. පසුව මිසදිටු කුමරා ද ඔහු අනුගමනය කර "නමෝ බුද්ධාය" කියන්නට හුරු වූවේ ය.

දිනක් මිසදිටු පියා වෙළඳාමට දර රැගෙන එනු පිණිස "නමෝ බුද්ධාය" කියන තම පුතා කැටුව නගරයෙන් පිටවිය. දර රැගෙන වේලාසනින් නිවසට ඒමට නොහැකිව ඔවුහු අතරමග ගැළ නවතා නිදා ගත්හ. ඒ ප්‍රදේශය යකුන්ගෙන් යුක්තය. එක් යක්ෂයෙක් රාත්‍රියේ ඔවුන් නිදා සිටි තැනට පැමිණ කුමරාගේ පාදයෙන් ඇද්දේය. එවිට නින්දෙන් පිබිදුණු කුමරාගේ මුවින් "නමෝ බුද්ධාය" කියවිණි. යක්ෂයා පැන දිව්වේ ය. යක් උවදුරෙන් දෙදෙනා ම බේරුණි. මෙම සිද්ධිය දැනගත් බුදුරජාණන් වහන්සේ බුදුගුණ සිහිකරන බුදු සව්වෝ රෑ දවල් දෙකෙහි ම සුවසේ නිදාගෙන සුවසේ පුබුදින බව වදාළහ.

නමෝ බුද්ධාය යන්නෙහි අදහස බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා යන්නය. අපි බුදුරජාණන් වහන්සේට නමස්කාර කරනුයේ "ඉතිපි සෝ භගවා අරහං" ආදී පාඨයේ දැක්වෙන බුදුගුණ සිහිපත් කරමිනි. මෙම පාඩමෙන් කරනුයේ එම බුදුගුණවලට ඇතුළත් අරහං, සුගත, අනුත්තර, පුරිසදම්ම සාරථී යන ගුණ හඳුන්වාදීමය.

කෝට්ටේ යුගයේ වැඩ සිටි වීදාගම මහා මෛත්‍රෙය මාහිමිපාණන් වහන්සේ විසින් රචිත බුදුගුණාලංකාර නම් කෘතියේ ඉහත සඳහන් කළ බුදුගුණ හඳුන්වා ඇති ආකාරය මෙතැන් සිට සාකච්ඡා කරමු.

බුදුගුණාලංකාර කෘතියට අනුව "අරහං" නමින් බුදුරජාණන් වහන්සේ හඳුන්වා ඇත්තේ කරුණු තුනක් මුල් කරගෙන ය. රහසින්වත් පව් නොකරන යන්න "අරහං" යන්නෙහි එක් තේරුමකි. පව් සිදුවන්නේ සිතෙහි කෙලෙස් පවතින විට ය. කෙලෙස් කිසිවක් බුදුරජාණන් වහන්සේට නොමැති බැවින් උන්වහන්සේ රහසින්වත් පව්කම් නොකරති.

"අරහං" යන්න යෙදීමට තවත් හේතුවක් වන්නේ කෙලෙසුන් කෙරෙන් දුරුවීම ය. කාමය, තණ්හාව ආදී කෙලෙස් බුදුරජාණන් වහන්සේ නැති කළ සේක. එබැවින් භාග්‍යවතුන් වහන්සේ "අරහං" නම් වෙති.

බුදුරජාණන් වහන්සේ ආමිස පූජා සහ ප්‍රතිපත්ති පූජා ලැබීමට සුදුසු හෙයින් අරහං නම් වන සේක. ආමිස පූජා නම් ආහාරපාන ආදිය පූජා කිරීම යි. සිල්රැකීම භාවනා කිරීම අසරණයන්ට පිහිට වීම ආදිය ප්‍රතිපත්ති පූජාව යි. බුදුගුණාලංකාරයෙහි අරහං බුදුගුණය දැක්වෙන කවිය මෙසේය.

රහසත් පව් නොකොට
කෙලෙසරයනුත් දුරුකොට
තිසිවූයෙන් පුදට
අරහ යයි නම කියති මුනිඳුට

සුගත යන්න තවත් බුදුගුණයකි. සුගත යන්නෙහි අදහස නම් මනා කොට ගිය යනුයි. සුගත හෙවත් මැනවින් ගමන් කිරීම නම් ප්‍රතිපත්ති අනුගමනය කරමින් ගමන් කළ බව ය. අන්තයකට නොවැටී කෙලෙස් නූපදින ලෙස සසර ගමන නිම කළ සේක. එබැවින් බුදුරජාණන් වහන්සේ සුගත නම් වන සේක.

යහපත් වචන ප්‍රකාශ කළ බැවින් ද බුදුරජාණන් වහන්සේ සුගත නම් වෙති. යහපත් වචන නම් දෙලොව යහපත සිදු කෙරෙන වචන ය. බුදුරජාණන් වහන්සේ සත්‍ය වූවක් වුව ද දේශනා කළේ කෙනකුට වැඩක් ප්‍රයෝජනයක් වෙනවා නම් පමණි. එම සෑම වදනක් ම අසන්නාගේ දෙසවන් පිනවන සිත් සනසාලන සොඳුරු වදනක් ම විය. එබැවින් තථාගතයන් වහන්සේගෙන් දහම් අසන ශ්‍රාවකයාට දැනුනේ එය තමන් උදෙසා ම කළ දේශනාවක් ලෙසට ය. මෙවන් සුන්දර බස් වහරින් යුතුවීම නිසා බුදුරජාණන් වහන්සේ සුගත නම් වන සේක. සුගත ගුණය බුදුගුණාලංකාරයෙහි දක්වා ඇත්තේ මෙසේ ය.

| | |
|---|---|
| යහපත් කොට | යෙතැයි |
| සුන්දර තැනට | සැපතැයි |
| සොඳුරු බස් | කියතැයි |
| කියති ඒ මුනිසඳුට | සුගතැයි |

බුදුරජාණන් වහන්සේගේ ගුණ සමුදාය හෝ රූපකාය දෙව් මිනිසුන් සහිත ලෝකයෙහි කිසිවකු හා සමකළ නොහැකි බැවින් උන් වහන්සේ අනුත්තර නම් වන සේක. බුදුරජාණන් වහන්සේ අසම සම වනුයේ මෙම අනුත්තර ගුණය නිසාම ය. උන් වහන්සේ අනුත්තර වන සැටි බුදුගුණාලංකාරයෙහි දක්වා ඇත්තේ මෙසේ ය.

| | |
|---|---|
| හැම ගුණයෙන් න | දා |
| සම වැඩි සතකු ඇම | දා |
| දියතෙහි නැති ස | දා |
| අනුත්තර යයි කියති මුනි | දා |

"පුරිසදම්මසාරථී" යන්න ද තවත් බුදුගුණයකි. ලොව ඇතැම්හු දඬු මුගුරු අවි ආයුධ භාවිත කරමින් පුද්ගලයන් දමනය කරති. එය එසේ වුව ද අපගේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දඬු මුගුරු අවි ආයුධ කිසිවක් නොමැතිව දරුණු විසම පුද්ගලයන් සත්ත්වයන් දමනය කළ සේක. මෙම උතුම් බුදුගුණය හඳුන්වන්නේ පුරිසදම්මසාරථී ලෙසට ය.

උපාලි ආදී ගෘහපතියන් ද සච්චක ආදී වාදකරුවන් ද අම්බට්ඨ ආදී මානවකයන් ද බක ආදී බ්‍රහ්මයන් ද ආලවක ආදී යක්ෂයන් ද නාලාගිරි ආදී සතුන් ද ශාන්ති නායකයාණන් වහන්සේ දමනය කළ සේක. එයින් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේගේ පුරිසදම්මසාරථී ගුණය යි.

නොදැමුණු විවිධ සත්ත්වයන්ට නිවැරදි මග පෙන්වා ඔවුන් දමනය කළ එම උදාර බුදුගුණය බුදුගුණාලංකාරයෙහි මෙසේ සඳහන් කර ඇත.

බඹ සුර යකුන් තද
දමනය කර තමන් ලද
සෙත් දී මුනිඳු සඳ
පුරිස දම් සාරථී නම් ලද

**ක්‍රියාකාරකම් :**

1. මෙහි ඇතුළත් බුදුගුණවලින් එක් බුදුගුණයකට කවියක් හෝ ගීතයක් නිර්මාණය කරන්න.
2. ජය මංගල ගාථා ගුරුතුමාගෙන් අසාගෙන එහි සඳහන් වන පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් දමනය කළ අයුරු වෙන වෙනම වගු ගත කර දක්වන්න.

## 3 පාඩම

### පැල්පතෙන් සිටු මැදුරට

සිටු මැදුරේ ආලින්දයෙහි සුව පහසු අසුනක හිඳගත් චූල්ල සිටාණන්ට මිදුලට පැමිණි කඩවසම් තරුණයකු දක්නට ලැබුණේය. තරුණයා ආලින්දයට ගොඩවී අත තිබුණු පසුම්බිය පසෙක තබා සිටුතුමා ළඟට විත් දණ ගසා වැඳ නැගිට සිටියේ ය. 'ඔබට යහපතක්ම වේවා' යි හෙමින් පැවසූ සිටුතුමා 'ඔබ කවුදැ'යි තරුණයාගෙන් විමසී ය.

පසුම්බිය ගෙන එය සිටුතුමාට පිළිගැන්වීමට තරුණයා ඉදිරිපත් වුවද, එය ඔහු ලවාම නැවත පසෙකින් තැබ්බවූ සිටුතුමා, මෙවර තරුණයා දෙස විපරම් ඇසින් බැලුවේ ය.

"මට ඔබ ගැන මතකක් නැහැ. හැබැට ම ඔබ කව් ද?"

"සිටුතුමනි, ඔබතුමා මා හඳුනන්නේ නැහැ. එහෙත් අවුරුදු ගණනාවක සිට මම ඔබතුමාව හඳුනනවා." යි තරුණයා පිළිතුරු දුන්නේ ය.

"වාඩි වෙන්නැයි" අසුනක් පෙන්වූ සිටුතුමා, ඔහු වාඩි වූ පසු, දැන් කියන්න ඔබ කව්දැයි කියා" කීවේ ය.

"සිටුතුමනි, මීට අවුරුදු කීපයකට පෙර දිනක් ඔබතුමා සේවය පිණිස රජමාළිගයට යනවා මා දුටුවා. මග දී එක් තැනක මිය ගිය මීයකු දැක, ඔබතුමා ප්‍රකාශ කළා, 'නුවණ තියෙනව නම් උත්සාහවන්තයකුට දියුණුවෙන්න මේ මී කුණත් ඇති' කියා."

"මට නම් මතක නැහැ ඒ බවක්"

"වෙන්න ඇති, සිටුතුමනි ඒක ඒ තරම් මතක හිටින සිද්ධියක් නොවෙයි නොවැ"

"හරි, ඉතින්"

ඔබතුමා අනාවැකි ප්‍රකාශ කරන්නට දක්ෂ පඬිවරයකු බවත්, එසේ ම ඉතා කාරුණික අයකු බවත් මා ජීවත් වූ වීදියේ මිනිසුන්ගෙන් මා දැන සිටියා. ඒ නිසා, ඔබතුමා මී කුණ ගැන කළ ප්‍රකාශය අමතක කරන්න මට බැරි වුණා. රැකියාවක් වත්, හරි හැටියට ඉන්න හිටින්න තැනක් වත් නැති අසරණයකු ව සිටි මම ඒ මී කුණ රැගෙන කඩවීදිය දෙසට ගියා.

ඒ දුටු එක් මිනිසකු මට සුළු මුදලක් දී මී කුණ රැගෙන බළලකුට දුන්නා.

"දැන්නම් ඔබ මහ පෝසතකු බව යි පේන්නේ" කී සිටුතුමා 'ඊට පස්සේ මොකද වුණේ' යි ඇසීය.

"මම ඒ සුළු මුදලෙන් උක් සකුරු කෑලි කීපයක් ගත්තා. මල් කඩා ගෙන යන මාලාකාරයන් කීප දෙනෙකු දැක, විඩාපත්ව සිටි ඔවුන්ට හකුරු කෑල්ලක් සමඟ පැන් ටිකක් දුන්නා. ඒ අය මට මල් මිට බැගින් දීලා යන්න ගියා."

"ඒ මල්වලට ඔබ මොකද කළේ?"

"ඒ මල්ටික විකුණලා ලැබුණු මුදලින් මම තවත් උක් සකුරු ගත්තා. පසුදා වතුර භාජනයකුත් රැගෙන මල් වත්තට ම ගිහින් මල් නෙලන්නන්ට උක් සකුරු කැබැල්ලක් සමඟ වතුර දුන්නා. එදා ඔවුන් මට නෙලාගන්න මල්, ගස්වල ම ඉතිරිකර ගියා."

"මගේ අනාවැකියෙන් එහෙනම් වැඩක් වෙළා තියෙනවා."

"එහෙමයි, සිටුතුමනි, ඒ මල් විකිණීමෙන් මට කහවනු අටක් ලැබුණා."

"කුඩා ළමයි සෙල්ලම් කරන පිට්ටනියක් කිට්ටුව තිබුණා. මට ඇති වූ සතුට නිසා මම ඔවුන්ට පැන් සපයා දුන්නා. සමහර විට සකුරු කෑල්ලක් ද දුන්නා; ඔවුන් ඒ නිසා මා සමඟ හිතවත් වුණා.

'දරුව, ඔබ තව දුරටත් අසරණ නැහැ. මම ඔබට පිහිට වෙනවා.'

තරුණයා නැගිට සිටුතුමාගේ දෙපා නැමඳ ආපසු යෑමට අවසර පැතුවේය. සිටුතුමා මෙසේ කීවේය.

'දරුව, ඔබ ඉතා නුවණැති, උත්සාහවන්ත, ආත්ම විශ්වාසයෙන් යුතු යහපත් පුද්ගලයෙක්. ඔබ වැනි අය සොයා ගැනීම ලෙහෙසි නැහැ. තව දින කිහිපයකින් නැවත ඔබ මා හමුවිය යුතුයි.'

තරුණයා ඒ අනුශාසනය පිළිගෙන, නැවත පැමිණීමට පොරොන්දු වී, යළි සිටුතුමාට වැඳ පිටත්ව ගියේ ය.

මේ තරුණයා කෙරෙහි බෙහෙවින් පැහැදී සිටි චුල්ල සිටාණෝ සිය දියණිය තරුණයාට සරණපාවා දුන්හ. ඔහු බොහෝ වූ ධනයකට ද හිමිකරුවකු බවට පත් කරන ලදී.

චුල්ල සිටාණන්ගේ ඇවෑමෙන් බරණැස සිටු තනතුරද ඔහුට හිමි විය. මේ තරුණයා, චුල්ලන්තේවාසික නමින් චුල්ලසෙට්ඨි ජාතකයෙහි සඳහන් වෙයි.

**ක්‍රියාකාරකම් :**

1. මේ කතාවේ ඔබ සිත්ගත් සිද්ධියක් චිත්‍රයට නගන්න.
2. චුල්ලසෙට්ඨි ජාතකය නාට්‍යයක් වශයෙන් රඟ දක්වන්න.
3. දුගියකුව සිට ධනවතකු බවට පත් මිනිසෙකු පිළිබඳ සැබෑ කතාවක් වැඩිහිටියකුගෙන් අසා දැනගන්න.
4. ඔබේ ජීවිතයට මේ කතාවෙන් ලබාගත් ආදර්ශ තුනක් නම් කරන්න.
5. ව්‍යාපාරිකයකුගේ දියුණුවට හේතුවන කරුණු මේ කතාව ආශ්‍රයෙන් සාකච්ඡා කර, සටහන් කරන්න.

## 4 පාඩම

### භාවනාවේ ප්‍රයෝජන

උදේ අවදිවන අපි පළමුව වතුර උගුරක් ගෙන කට සෝදා ගනිමු. නැතහොත් කෙළ ගිලීමටවත් අප්‍රිය බවක් ඇතිවේ. ඊලඟට ඉක්මනින් ම මුහුණ සෝදා ගනිමු. නැතහොත් අන්අය ඉදිරියට යාමට නුපුළුවන. දිනපතාම උදේට අපි මෙසේ මුහුණ කට සෝදා පිරිසිදු කර ගන්නේ ඒවා අපිරිසිදු වන නිසාය. දින කිහිපයක් නොනා සිටියහොත් දහදියෙන් තෙමී දූවිලි තැවරී ශරීරය අපවිත්‍ර වෙයි. ඒ නිසා අපි දින කිහිපයකට වරක් වත් ඇඟ සෝදා ගනිමු. ස්නානය කරමු. මේ සියල්ල අප කරන්නේ අපේ ශරීරය කිලිටි වන නිසා ය. නැවත නැවතත් කිලිටිවන නිසා නැවත නැවතත් අපි ශරීරය පිරිසිදු කර ගනිමු.

මිනිසාට ශරීරයක් පමණක් නොව සිතක් ද තිබේ. මෙතරම් වුවමනාවෙන් ශරීරය පිරිසිදු කර ගැනීමට උනන්දුවන අපි අපේ සිත පිරිසිදු කර ගැනීමට කුමක් කරමුද?

ශරීරය මෙන්ම සිත ද කිලිටි වෙයි. ඒ බව අපට නොපෙනේ. සිත කිලිටි වීම ගැන නොසලකා හරින්නේ එහෙයිනි. සිත කිලිටි වන්නේ කෙසේ ද?

සිත කිලිටි වන්නේ අපිරිසිදු සිතුවිලිවලිනි. අපිරිසිදු සිතිවිලිවලට අකුසල සිතිවිලි යැයි කියනු ලැබේ. ප්‍රධාන අකුසල සිතිවිලි තුනකි. එනම් ලෝභ, දෝස හා මෝහ ය. මේවා ඇසුරින් තව බොහෝ අකුසල සිතිවිලි ඇතිවේ. ලෝභය නිසා ඇල්ම, ආසාව, කෑදරකම වැනි තව ද අකුසල සිතිවිලි ඇතිවේ. මේ සියල්ලෙන්ම සිත කිලිටි බවට පත්වේ.

සිත කිලිටි වන විට කතා කරන වචන අපිරිසිදු වේ. කරන ක්‍රියා ද අපිරිසිදු වේ. නිදසුනක් වශයෙන් සිතට තරහ ආ විට කියැවෙන්නේ

නපුරු වචනය. පරුෂ වචනය. එසේම අනුන්ට පහර දීමට, අනුන් මැරීමට පෙළඹෙන්නේ ද තරහව නිසාම ය. මෙසේ සිත අපිරිසිදු වූ විට වචන ද ක්‍රියා ද අපිරිසිදු වීම නිසා මිනිසා අයහපත් අයකු බවට පත්වේ. මේ බව බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ.

චිත්තේන සංකිලිස්සේන
සංකිලිස්සන්ති මානවා

අපිරිසිදු සිත නිසා
මිනිසා ද අපිරිසිදු වේ.

සියලුම වැරදි කරන්නේ සිත අපිරිසිදු වීමෙන් නිසා, සිත පිරිසිදු කිරීම සඳහා ක්‍රමයක් බුදු දහමෙන් ඉදිරිපත් වේ. එයට භාවනාව යැයි කියනු ලැබේ. භාවනා යන වචනයෙහි තේරුම සිත 'දියුණු කිරීම' ය. සිත දියුණු කළ හැක්කේ සිත අපිරිසිදු වන අකුසල සිතිවිලි සිතෙන් ඉවත් කිරීමෙනි. සිත පිරිසිදු කිරීමෙනි.

භාවනා ක්‍රම රාශියක් තිබේ. වෙන පාඩමක එයින් ක්‍රම තුනක් විස්තර කර දැක්වේ. භාවනා ක්‍රම ගැන ඉගෙනීමට පළමු භාවනාවෙන් ලැබෙන ප්‍රයෝජන ගැන මෙහිදී සොයා බලමු. එය භාවනා කිරීම සම්බන්ධයෙන් අප තුළ උනන්දුවක් ඇති වීමට ද හේතු වෙයි.

අපට අපේ ශරීරය එක තැනක තබා ගෙන ටික වේලාවක් සිටිය හැකිය. ඉඳගෙන හෝ සිටගෙන හෝ වැතිර ගෙන හෝ අපි මෙසේ එක තැනක සිටිමු. එහෙත් අපේ සිත මොහොතක් හෝ එක තැනක තබා ගැනීම එතරම් පහසු නැත. ශරීරය නැවතී එක තැනක තිබියදී අපේ සිත බොහෝ ඈත ගමන් යයි. මෙසේ තනිව ම දුර ගමන් යන්නේ සිතේ ඇති වන කෙලෙස් හෙවත් අකුසල් සිතිවිලි නිසා ය. ආසාව ඇතිවූ විට අපි කැමති කැමති තැන සැරිසරමු. තරහට හේතු වූ පුද්ගලයන් හෝ දේවල් කරා කෝපයෙන් ගමන් කරමු. මෙසේ විසිරී පවතින සිත ටික වේලාවක් එක තැනක තබා ගත හැකි නම් කෙලෙස් සිතිවිලි ඒ ටික වේලාවට වත් යටපත් වෙයි. මෙසේ තැන තැන දුවන සිත ටික වේලාවකට හෝ එකතැන් කරගෙන කෙලෙස් යටපත් කරගෙන සිත පිරිසිදු කර ගැනීමට සමථ භාවනාව යැයි

කියනු ලැබේ. අපේ ම හුස්ම ඉහළ පහළ යෑම දෙස බලා සිටීමෙන් ටික වේලාවකට සිත එකතැන් කර ගත හැකිය. බුද්ධ රූපයක් දෙස බලා සිටිමින් හෝ බුදු ගුණයක් මෙනෙහි කරමින් සිත එකඟ කර ගත හැකිය. මෛත්‍රිය වැනි යහපත් සිතිවිල්ලක් නිතර නිතර සිහි කරමින් එසේ කළ හැකිය. සමථ භාවනාව සඳහා අනුගමනය කළ හැකි මෙවැනි ක්‍රම රාශියක් තිබේ. මේ ඕනෑම භාවනාවකින් අපට ලැබෙන ප්‍රධාන ප්‍රයෝජන දෙකක් දැන් අපි දනිමු. එනම්,

1. තැන තැන දුව යන සිත එක තැන් වී එකඟවීම හා
2. අකුසල් සිතිවිලි යටපත්වී සිත පිරිසිදු වීම ය.

**මෙසේ සිත එකඟවීම හා පිරිසිදු වීම නිසා ශිෂ්‍යයකු වශයෙන් අපට ඇති ප්‍රයෝජන මොනවාද?**

පාඩමක් කියවා ගෙන යන විට හෝ ගණිත ගැටලුවක් විසඳන විට සිත විසිර යන්නේ නම් කියවන දේ තේරුම් ගැනීමට වත් නුපුළුවන් බව අපි දනිමු. එකග වූ සිතක් ඇති විට පාඩම වහා වැටහෙයි. ගැටලුවට විසඳුම් ඉක්මණින් ලැබෙයි.

තේරුම් ගත් කරුණු මතකයෙහි රැඳී නොසිටිය හොත් ඉගෙනීමක් සිදු වී නැත. සිත වෙනත් සිතිවිලිවලින් කිළිටි වී නැති නම් ලෙහෙසියෙන් මතක තබා ගැනීමට පුළුවන. මේ අනුව භාවනාවෙන් අධ්‍යාපනය සඳහා ලැබෙන්නේ විශාල සහායකි. ඉගෙණීම මෙසේ සාර්ථක කරගැනීමට ලැබීම භාවනාවේ එක් ප්‍රතිඵලයකි.

සිතේ කෝපය ඇති විට මුහුණ අප්‍රසන්න වේ. නරක වචන පිට වේ. හැසිරීම රළු වේ. මේ නිසා අන් අයට අප්‍රිය වේ. කළහකාරී ශිෂ්‍යයින් පන්තියේ ද පාසලේ ද ගැටලු රැසක් ඇති කරන බව අපි දනිමු. භාවනාවට පුරුදු වූ අය ගෙන් මෙවැනි දෑ සිදු නොවන නිසා ඒ අය හා ඇසුරු කිරීමට කවුරුත් කැමති ය. සමාජයේ ප්‍රසන්න පුද්ගලයෙක් වේ.

ඉගෙනීමත් සාර්ථක කරගෙන සමාජයේ ප්‍රිය පුද්ගලයකු ද වන ශිෂ්‍යයාට තමා බලාපොරොත්තු වන යහපත් අරමුණු පහසුවෙන්

ඉටු කරගැනීමට අවස්ථාව ලැබේ. ජීවිතයේ සාර්ථකත්වය ලබන එවැනි අය වෙති. මේ නිසා භාවනාවක දිනපතා යෙදෙන්නට පාසල් වියේ සිට ම පුරුදු පුහුණු වීම වැදගත් ය.

එක් එක් භාවනා ක්‍රමයකින් ලැබෙන ප්‍රතිඵල වෙන වෙන ම දැක්වූ තැන් බෞද්ධ ග්‍රන්ථවල තිබේ. ඒ අතරින් මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ආනිසංස එකොළහක් මෙත්තානිසංස සූත්‍රයෙහි ඇතුළත්වේ. ඒවා මෙහි පහත දැක්වේ.

1. සුවසේ නින්ද යයි.
2. සුවසේ අවදි වෙයි.
3. නපුරු සිහින නොපෙනෙයි.
4. මිනිසුන්ට ප්‍රිය වෙයි.
5. නොමිනිසුන්ට ද ප්‍රිය වෙයි.
6. දෙවියන්ගේ ආරක්ෂාව ලැබෙයි.
7. ගිනි, විස, ආයුධ ආදියෙන් ආරක්ෂා වෙයි.
8. සිත ඉක්මනින් එකඟ වෙයි.
9. මුහුණ පැහැපත් වෙයි.
10. මෙලොව දී රහත්ඵලයට පත් නොවුණ හොත් බඹ ලොව උපත ලබයි.

**ක්‍රියාකාරකම්:**

1. භාවනා කිරීමෙන් ශිෂ්‍යයකුට ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් ලියා දක්වන්න.
2. සමථ භාවනාව යනු කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න.
3. සිත කිලිටිවීමෙන් සිදුවන හානි දෙකක් ලියන්න.

# 5 පාඩම

## බවුන් වඩමු ගත සිත නිවනා

සුදෝ සුදු වතින් සැරසී උදෑසනින් ම දහම් පාසලට පිවිසෙන ඔබ වත් පිළිවෙත් නිමකර බුද්ධ වන්දනාවේ නියැලී විනාඩි කීපයක් භාවනාවෙහි යෙදෙන බව අපි දනිමු. එසේ භාවනා කිරීමෙන් යහපත් සිතුවිලි උපදවා ගත හැකිය. එලෙස සිත මනාසේ හැඩගස්වා ගැනීම නිසා නීරෝගී බව, ධාරණ ශක්තිය වර්ධනය වීම, ගැටලු පිළිබඳ අවබෝධය, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, ඥාන ශක්තිය වැඩිවීම ආදී ප්‍රතිඵල අපට ලැබේ. හයවන ශ්‍රේණියේ දී ඔබ ඉගෙන ගත් එම ගත සිත සන්සුන් කරන භාවනා ක්‍රම තුන යළිත් සිහිපත් කර ඉදිරි පියවර කීපයක් හඳුන්වාදීම මෙම පාඩමේ අරමුණ වේ.

බුදුගුණ ඇසුරෙන් අපි සිත සනසමු.

**තුන්වන පියවර**

(හයවන ශ්‍රේණියේ දී) පළමු පියවරේ දී අනුගමනය කළ වත් පිළිවෙත් හා ඉරියව් පැවැත්වීම මෙහි දී ද අනුගමනය කරන්න. පහත දැක්වෙන පරිදි ගුරුතුමා අනුව යමින් තෙවරක් ලතාවකට කියවන්න.

- භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අෂ්ට විද්‍යාවෙන් යුක්ත වන සේක
- භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පසළොස් චරණ ධර්මයෙන් යුක්ත වන සේක
- භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අෂ්ට විද්‍යාවෙන්ද, පසළොස් චරණ ධර්මයෙන් ද යුක්ත වන බැවින් විජ්ජා චරණ සම්පන්න නම් වන සේක.

දැන් නිහඬව එම වාක්‍යවල අදහස් සිතින් මෙනෙහි කරන්න.

භාවනාව අවසානයේ නළලත දෙ අත් තබාගෙන වැඳගෙන තෙවරක් සාධුකාර දෙන්න. පහත දැක්වෙන කවිය අරුත් මෙනෙහි කරමින් සිහින් හඬින් කියා සාධු කාර දෙන්න.

විද්දෑ නැණ අට ද
පසළොස් සරණ ගුණය ද
ඇතියෙන් එ මුනි ස ද
පිරුණු විජ්ජා චරණ නම් ල ද

වැඳගෙන මෙසේ ප්‍රාර්ථනා කරන්න. මාගේ මේ භාවනාමය කුසලය මෙලොව සැනසීම පිණිසත් පරලොව සැනසීම පිණිසත් නිවන් සුවයෙන් සැනසීම පිණිසත් හේතුවේවා! වාසනා වේවා!

සාධු ..... සාධු ...... සාධු .....

**සිව්වන පියවර**

තෙවන පියවරේදී අනුගමනය කළ වත් පිළිවෙත් හා ඉරියව් පැවැත්වීම මෙහිදී ද අනුගමනය කරන්න. පහත දැක්වෙන පරිදි ගුරුතුමා අනුව යමින් තෙවරක් ලතාවකට කියවන්න.

- භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සෝභමානව ගමන් කරන බැවින් සුගත නම් වන සේක
- භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සුන්දර වූ නිවනට වැඩම කළ හෙයින් සුගත නම් වන සේක
- භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ යහපත් වචන කථා කරන බැවින් සුගත නම් වන සේක
- භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සෝභමානව ගමන් කරන බැවිනුත් සුන්දර වූ නිවනට වැඩම කළ බැවිනුත් යහපත් වචන කථා කරන බැවිනුත් සුගත නම් වන සේක.

දැන් නිහඬව එම වාක්‍යවල අදහස් සිතින් මෙනෙහි කරන්න.

භාවනාව අවසානයේ නළලත දෙ අත් තබාගෙන වැඳගෙන තෙවරක් සාධුකාර දෙන්න. පහත දැක්වෙන කවිය අරුත් මෙනෙහි කරමින් සිහින් හඬින් කියා සාධු කාර දෙන්න.

යහපත් කොට යෙතැයි
සුන්දර තැනට සැපතැයි
සොඳුරු බස් කියතැයි
කියති ඒ මුනිසඳුට සුගතැයි

වැඳගෙන මෙසේ ප්‍රාර්ථනා කරන්න. මාගේ මේ භාවනාමය කුසලය මෙලොව සැනසීම පිණිසත් පරලොව සැනසීම පිණිසත් නිවන් සුවයෙන් සැනසීම පිණිසත් හේතුවේවා! වාසනා වේවා!

සාධු............සාධු............සාධු............

**ආනාපානසති භාවනාව**

ආනාපානසති භාවනාව ද ඔබ හයවන ශ්‍රේණියේ දී ඉගෙන ගෙන ඇත. ඒ අනුව ශිෂ්‍යයින් බද්ධ පර්යංකයෙනුත් ශිෂ්‍යාවන් අර්ධ පර්යංකයෙනුත් හිඳගන්න. නෙළුම් පොහොට්ටුවක් සේ දෑත් එකතු කර නළලත තබාගෙන තෙවරක් නමස්කාරය කියන්න. අනතුරුව තමන්ට ඇසෙන සේ සිහින් හඬින් පහත සඳහන් කවියෙහි අර්ථය මෙනෙහි කරමින් කියන්න.

මම සතුන් නොමරමි - සොරකම් කිසිත් නොකරමි
දුසිරිතෙන් දුරුවෙමි - බොරු බසින් මත් දෙයින් වළකිමි

දෑස් පියාගෙන හොඳින් හුස්ම ඉහළට පහළට හෙළා කය සැහැල්ලු කර භාවනාව ආරම්භ කරන්න. හුස්ම ඉහළට ගැනීම සහ හෙළීම එකම වාරයක් ලෙසත් ගණන් ගන්න.

**තෙවන පියවර**

(පළමු හුස්ම වාරය) එකයි.... එකයි..... එකයි..... එකයි...... එකයි.....
(දෙවන හුස්ම වාරය) දෙකයි.... දෙකයි..... දෙකයි..... දෙකයි.... දෙකයි.....
(තෙවන හුස්ම වාරය) තුනයි.... තුනයි..... තුනයි..... තුනයි..... තුනයි.....
(සිව්වන හුස්ම වාරය) හතරයි.... හතරයි..... හතරයි..... හතරයි..... හතරයි.....
(පස්වන හුස්ම වාරය) පහයි.... පහයි..... පහයි..... පහයි..... පහයි.....
(හයවන හුස්ම වාරය) හයයි.... හයයි..... හයයි..... හයයි..... හයයි.....

(හත්වන හුස්ම වාරය) හතයි.... හතයි..... හතයි..... හතයි..... හතයි.....
(අටවන හුස්ම වාරය) අටයි.... අටයි..... අටයි..... අටයි..... අටයි.....
(නවවන හුස්ම වාරය) නවයයි.... නවයයි..... නවයයි..... නවයයි..... නවයයි....
(දසවන හුස්ම වාරය) දහයයි.... දහයයි..... දහයයි..... දහයයි..... දහයයි.....

මෙලෙස මෙම භාවනාවේ යෙදීමෙන් මහත් සැනසිල්ලක් සිතට දැනෙනු ඇත. භාවනාව නිම කිරීම සඳහා දෑත් නළල මත තබා වැඳගෙන සාධුකාර දී ප්‍රාර්ථනා වාක්‍ය කියන්න

මගේ මෙම භාවනාව මෙලොව සැනසීම පිණිසත් පරලොව සැනසීම පිණිසත් නිවන් සුවයෙන් සැනසීම පිණිසත් හේතුවේවා!. වාසනා වේවා!. දෙවියන්ට පින් අනුමෝදන් කරන්න.

**සිව්වන පියවර**

තෙවන පියවර සති කීපයක් පුරුදු කළ පසුව සිව්වන පියවර අනුගමනය කරන්න. දෑස් පියාගෙන හොඳින් හුස්ම ඉහළට පහළට හෙළා කය සැහැල්ලු කර භාවනාව ආරම්භ කරන්න. හුස්ම ඉහළට ගැනීම එක වාරයක් ලෙසත් පහළට හෙළීම තව වාරයක් ලෙසත් මතක තබා ගන්න.

| ඉහළට ගැනීම | පහළට හෙළීම |
|---|---|
| (පළමු හුස්ම වාරය) එකයි | (දෙවන හුස්ම වාරය) දෙකයි |
| (තෙවන හුස්ම වාරය) තුනයි | (සිව්වන හුස්ම වාරය) හතරයි |
| (පස්වන හුස්ම වාරය) පහයි | (හයවන හුස්ම වාරය) හයයි |
| (හත්වන හුස්ම වාරය) හතයි | (අටවන හුස්ම වාරය) අටයි |
| (නවවන හුස්ම වාරය) නවයයි | (දසවන හුස්ම වාරය) දහයයි |

මෙලෙස එකේ සිට දහය දක්වාත් ඊළඟ වාරයේ දී අග සිට මුල දක්වාත් (10 සිට 1) ගණන් කරන්න. කීප වරක් මෙසේ සිදු කර භාවනාව අවසන් කිරීමට දෑත් නළල මත තබා වැඳගෙන සාධුකාර දී ප්‍රාර්ථනා වාක්‍ය කියන්න.

මගේ මෙම භාවනාව මෙලොව සැනසීම පිණිසත් පරලොව සැනසීම පිණිසත් නිවන් සුවයෙන් සැනසීම පිණිසත් හේතුවේවා!. වාසනා වේවා!. අනතුරුව දෙවියන්ට පින් අනුමෝදන් කරන්න.

**මෛත්‍රී භාවනාව**

ඔබ මීට පෙර මෛත්‍රී භාවනාව කළ ආකාරයට කැමති ඉරියව්වකින් ගුරු උපදෙස් මත මෛත්‍රී භාවනාවේ යෙදෙන්න. නමස්කාර පාඨය තෙවරක් කියා තෙරුවන් සරණ යමු. දැන් අපි සිත් තුළ මෙත් මල් පුබුදුවන මෛත්‍රී භාවනාව වඩමු.

**පියවර 5**

මම නිදුක් වෙම්වා!.
නීරෝග වෙම්වා!.
සුවපත් වෙම්වා!.
වෛර නැත්තෙක් වෙම්වා!.
මා මෙන්ම මාගේ මව්පියෝද,
මාගේ  ගුරුවර ගුරුවරියෝද,
මාගේ මිතුරු මිතුරියෝද,
මැදහත් අයද, නිදුක් වෙත්වා!.
නීරෝග වෙත්වා!.
සුවපත් වෙත්වා!.
වෛර නැත්තෝ වෙත්වා!.

**පියවර 6**

මම නිදුක් වෙම්වා!.
නීරෝග වෙම්වා!.
සුවපත් වෙම්වා!.
මා මෙන්ම මාගේ මව්පියෝද,
මාගේ  ගුරුවර ගුරුවරියෝද,
මාගේ මිතුරු මිතුරියෝද,
මාගේ මැදහත් අයද,
මට අහිතවත් අය ද,
නිදුක් වෙත්වා!.

නීරෝග වෙත්වා!.
සුවපත් වෙත්වා!.
වෛර නැත්තෝ වෙත්වා!.
සියලු සත්ත්වයෝ
නිදුක් වෙත්වා!.
නීරෝග වෙත්වා!.
සුවපත් වෙත්වා!.
වෛර නැත්තෝ වෙත්වා!

භාවනාව අවසානයේදී වැඳගෙන තෙවරක් සාධුකාර දී පහත සඳහන් කවිය කියන්න.

දුකෙන් පෙළෙන සත් දුකෙන් මිදෙත්වා
බියෙන් සැලෙන සත් බියෙන් මිදෙත්වා
සොවින් තැවෙන සත් සොවින් මිදෙත්වා
නිතින් මෙ හැම සත් සුවපත් වෙත්වා

මාගේ මේ භාවනාව මෙලොව සැනසීම පිණිසත් පරලොව සැනසීම පිණිසත් නිවන් සුවයෙන් සැනසීම පිණිසත් හේතු වේවා!. වාසනා වේවා!. යනුවෙන් ප්‍රාර්ථනා කරන්න.

**ක්‍රියාකාරකම්**

භාවනාවෙන් ලැබෙන අත්දැකීම් ගුරුතුමා සමඟ සාකච්ඡා කරන්න.
දවසේ සුදුසු වේලාවක් වෙන් කරගෙන භාවනාවක යෙදෙන්න.

සුප්පබුද්ධං පබුජ්ඣන්ති
සදා ගෝතම සාවකා
යේසං දිවා ච රත්තෝ ච
භාවනාය රතො මනෝ *(ධම්මපදය - පකිණ්ණක වග්ග)*

දිවා රෑ දෙක්හිම
භාවනාවෙහි නියැලුණු
ගොයුම් ගොත් සව්වෝ
නිදා පුබුදිති සුවසේ

# 6 පාඩම

## හැදෙන බොදු දරුවකුගේ ලක්ෂණ හැඳින ගනිමු

බුදුරජාණන් වහන්සේ මෙත්ත සූත්‍රයේදී කුසල පුද්ගලයෙකුගේ හෙවත් දියුණු වන්නෙකුගේ ලක්ෂණ 15ක් වදාළහ. එම ලක්ෂණ දහම් පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබේ දිවිය සරු කර ගැනීමට වැදගත් වෙයි.

කීකරු කෙනෙක්වීම, මෘදු හිතක් ඇති අයෙක් වීම, අධික මානයක් නැත්තෙක් වීම, ලද දෙයින් සතුටුවන්නෙක් වීම, පහසුවෙන් පෝෂණය කළ හැකි අයෙක් වීම යන ලක්ෂණ මෙම පාඩමට ඇතුළත්ය. පැලෑනේ සිරි වජිරඥාන නාහිමියන් විසින් රචිත එම ගුණයන් ඇතුළත් පද්‍ය කිහිපයක් ද මෙහි දැක්වෙයි.

### සුවච ගුණය හෙවත් කීකරුවීම

තමාට අවවාද වශයෙන් අනෙකකු විසින් දෙනු ලබන දැනමුතු කමට කීකරුවීම, ඇහුන් කන් දී පිළිගෙන පිළිපැදීම, කීකරුවීම යන්නෙන් අදහස් කෙරේ. තමන්ගෙන් යම් වරදක් වූ විට එය වරදක් ලෙස යමකු පෙන්වා දුන් විට එය පෙන්වා දුන් පුද්ගලයාට ද ප්‍රශංසා කොට වරද නිවැරදි කර ගනී නම් එය සුවච පුද්ගලයාගේ ස්වභාවය යි. එවැනි පුද්ගලයා මෙලොව, පරලොව දෙකෙහිම දියුණුවට පත් වෙයි. එක් අවස්ථාවක සැරියුත් මහරහතන් වහන්සේගේ සිවුරේ කොණක් එල්ලෙනු දුටු කුඩා සාමණේර හිමි නමක් එය පෙන්වා දුන් විට සැරියුත් තෙරණුවන් දොහොත් මුදුනේ තබා එය පිළිගත් බව සඳහන් වෙයි. එය ශ්‍රේෂ්ඨ උතුමන්ගේ ස්වභාවය යි.

දැන උගත් කෙනෙකුට වුව ද වැරදීම් සිදුවිය හැකි ය. වැරදීම මිනිස් ගතියකි. එම වරද පිළිගැනීම දේව ගතිය යි යන කියමනෙන්ද එහි අගය පැහැදිලි වෙයි. තමාගෙන් සිදුවූ වරදක් අනුකම්පාවෙන් පෙන්වා දෙන තැනැත්තා තමාට නිධානයක් පෙන්වා දෙන්නකුට සමාන බවත් එවැනි අයගේ ඇසුර යහපතට හේතුවන බවත් බුදුරජාණන් වහන්සේ

වදාරා ඇත. සිදුවූ වැරදි පෙන්වා දෙන විට ඇතැම් අය නොමනාපයට පත් වෙති. එය අනුවණයාගේ ලක්ෂණයකි.

දෙගුරුන් ගුරුන් හෝ
වෙන වැඩිහිටියවුන් හෝ
දෙනො'වා පිළිගනිල්ලා
කීකරුව හොඳ ළමයිනි

මුදුගුණය හෙවත් කය, වචනය දෙකෙහි ගොරෝසු නැති කම ද හැදෙන බොදු දරුවකුගේ තවත් අගනා ලක්ෂණයකි. හොඳින් උණු කරගත් අගනා රන් කැබැල්ලකින් ඕනෑම රන් ආභරණයක් සාදා ගැනීමට හැකි වන්නාක් මෙන් මෘදු මොලොක් ගති ඇති අයකුගෙන් තමන්ටත්, අනුන්ටත් යහපතක්ම හිමි වේ. දෙමාපිය ගුරුවර ආදීන් විසින් යම් කාර්යයක් කිරීමට උපදෙස් දුන් විට හෝ යම් වරදක් පෙන්වා දුන් විට එය පිළිගෙන ක්‍රියාකිරීමෙන් තමාගේ දියුණුව සැලසෙනවා මෙන්ම ඔවුනගේ ආදරය කරුණාව ලැබීමට ද හේතු වේ.

කායික ක්‍රියා පමණක් නොව කථාකරන වචන ද මෘදු විය යුතුය. ප්‍රිය වචනය තිරිසන් සතුන්ගේ පවා සිත් ඇදගන්නා බව නන්දිවිසාල ජාතකයෙන් අප අසා ඇත. ප්‍රිය වචනය, මෘදු මොලොක් වචනය අන්‍යයන්ගේ ප්‍රියමනාප බව මෙන්ම හිතවත්කමද ගොඩනගා ගැනීමට හේතුවේ. අන්‍යයන්ගේ උදව් උපකාර ලබා ගැනීමට ද හේතු වෙයි.

දෙමව්පිය ගුරුවර
වැඩිහිටියනට කීකරුව
මුදු බැව්නොවුන් සිත් ගෙන
දින දින වැඩෙව් ළමයිනි

අනතිමානී හෙවත් අධික මානය නැති අයෙකු වීමද හැදෙන බොදු දරුවකුගේ ලක්ෂණයකි. තමන් උසස් කොට අනුන් පහත් කොට සලකන අහංකාර, ආඩම්බර, උඩඟුබව නොමැතිකම මෙයින් අදහස් කෙරේ. මානය නැමැති දුර්ගුණය රහත් වනතුරු සම්පූර්ණයෙන් ම නැති කළ නොහැකි බව දහමේ සඳහන්වේ. ඇතැම් දරුවන් තුළ ද

තම දෙමව්පියන්ගේ වත්පොහොසත්කම් ආදිය නිසා හෝ තමන් අඳින පළඳින ඉහල මට්ටමේ ඇඳුම් පැළඳුම් නිසා හෝ අන්‍යයන් හෙලා දැකීමේ පුරුද්දක් තිබේ. මෙවැනි අධික මානයෙන් යුක්ත අය කවුරුත් ප්‍රිය නොකරති. ගුණ ගරුක අය පලබර අතුමෙන් නැමෙති. අහංකාර වූවෝ පලබරක් නැති අතු මෙනි.

යටහත් පැවැත්මෙන්
වැඩිහිටියන්ගෙ සිත් ගෙන
උඩඟු නොවැ මතු දියුණුව
සලසා ගනිවු දරුවෙනි

සන්තුස්සක ගුණය හෙවත් ලද දෙයින් සතුටුවීම ද හැදෙන බොදු දරුවෙකුගේ හොඳ ලක්ෂණයකි. ලද පමණින් බල පමණින් යුතු පමණින් සතුටුවීම යනුවෙන් මෙම ගුණය දහමේ විස්තර වේ. මේ ලැබුණු තරම මට ඇතැයි කියා හෝ මගේ ශක්තියේ තරමට මේ ප්‍රමාණවත් ය කියා හෝ මගේ සුදුසුකම් අනුව මට මේ ලැබුණු තනතුර ප්‍රමාණවත්ය කියා හෝ සතුටුවීම සතුටෙන් භාර ගැනීමට පුරුදුවීම දියුණු වනු කැමති හොඳ බොදු දරුවකුගේ ලක්ෂණයකි. ඉහතකී ආකාරයෙන් සතුටුවීම දියුණුවට මෙන් ම අන්‍යයන් සමග සහයෝගයෙන් ජීවත් වීමට ද හේතු වේ. මෙය අල්පේච්ඡ ජීවිතයක නැතහොත් සරල ජීවිතයක ලක්ෂණයකි.

දරුවෙනි කිසි කලෙක
දුටු දුටු දෙයට නොහඬව්
ලද දෙයකින්ම සතුටුව
දෙගුරුන් සිත් සනසවව්
දෙනවිට මව්පියන්
යම් යම් සුළු දෙයක්වත්
හරසර කර හිසනමා
දැතින්ම පිළිගන්නේ
අදරින් දුන් දෙයට
අදරම කරනු යුතු වේ
එබැවින් ඔවුන් දුන් දෙය
අනදර නොකර රක්නේ

සුභර බව හෙවත් පහසුවෙන් පෝෂණය කළ හැකි වීම ද දියුණුවන බොදු දරුවකුගේ තවත් ලක්ෂණයකි. අනුන්ට මෙන්ම තමන්ට ද බරක් නොවී ජීවත්වීමට හැකි වීම ඉන් අදහස් කෙරේ. අපට දෙමවුපියන් මහන්සියෙන් සපයා දෙන ඇඳුම් පැළඳුම් ආහාරපාන ආදිය සතුටෙන් භාරගෙන ජීවත්වීමට පුරුදු විය යුතුය. අසවල් දේම මට අවශ්‍යයි කියමින් තමාට ලබා ගත නොහැකි කිසියම් දෙයක් ලබා ගැනීමට වෙහෙසවීම සුභර ගුණයෙන් ඇත් වූවෙකුගේ ස්වභාවය යි. මේ නිසා පහසුවෙන් පෝෂණය කළ හැකි සුභර ගුණය ඇතිකරගත් ළමයකුවීමට සිතට ගන්න.

දරුවෙනි පහසුවෙන් පුස්නට හැකිව කීකරුව‍ැ
දෙමාපියනට හිරිහැර කරදර නොකැර හැසිරෙව්
සොඳ සුභර ළමයිනි ලද මදෙකිනුදු තුටුවව්
දෙගුරු පෙව් කිරි සිඳු ඔදවඩව් සරදේ සඳ ලෙද

අමාරු වචන

1. පුස්නට - පෝෂණය කරන්නට
2. සුභර - පහසුවෙන් පෝෂණය කළ හැකි වූ
3. මදෙකිනුදු - සුළු දෙයකින් වුවත්
4. දෙගුරු - දෙමව්පියන්
5. පෙම් - ප්‍රේමය නමැති
6. කිරි සිඳු - කිරි මුහුද
7. සරදේ - සරත් කාලයෙහි
8. සඳ ලෙද - පුර සඳ මෙන්
9. ඔදවඩව් - දීප්තිය හෝ ප්‍රාණවත් බව දියුණු කරව්

ක්‍රියාකාරකම්:

1. බොදු දරුවකු හැටියට දැනටමත් ඔබේ දිවියට එකතු කරගෙන පුරුදු කරන හොඳ ලක්ෂණ ලියා දක්වන්න.

2. ඉදිරියට ඔබ පුරුදු පුහුණුවීමට සිතන හොඳ ලක්ෂණ ලියා දක්වන්න.

# 7 පාඩම

## දස අකුසල් පල අසන්න

ලක්දිව සාහිත්‍ය ඉතිහාසයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර යුගය යි. එසේ වනුයේ එතෙක් නිර්මාණය නොවූ විශේෂ අංග සාහිත්‍යයට එකතු වූ බැවිනි. එකතු වූ එක අංගයකි, උපදේශ කාව්‍ය. උපදේශ කාව්‍ය අතර ලෝවැඩ සඟරාවට හිමි වනුයේ විශේෂ තැනකි. පද්‍ය එකසිය හතලිහකින් (140) යුත් මෙම කෘතියෙහි කතුවරයාණෝ වීදාගම මහා වෙහෙරෙහි අධිපති මහ නෙත් පාමුල වීදාගම මෛත්‍රේය සංඝරාජයාණන් වහන්සේ ය. ධම්මපදය සහ සද්ධම්මෝපායනය ආදී ධර්ම ග්‍රන්ථ ඇසුරෙන් ලියවුණ මෙම කෘතියේ බස සරල ය.

ලෝවැඩ සඟරාවෙන් කෙරෙනුයේ අකුසලින් දුරුව කුසල් වැඩීමට උපදෙස් දීම ය. එබැවින් මෙම කෘතිය හෙළදිව වැසියන්ගේ ගුණ නැණ වඩවන ඔවුන්ට දියුණුවේ මඟ පෙන්වන සිත්කලු හෙළබසින් කවියට නගා කළ ධර්ම සංග්‍රහයකි. රන්, රිදී, මුතු, මැණික් වැනි වස්තූන්ගෙන් පිරුණු ගබඩාවක් හිමිකරුවන්ට හිත සුව සලසන්නාසේ ලෝවැඩ සඟරාව දුසිරිතෙන් සුසිරිතටත් අකුසලෙන් කුසලයටත් ලෝ වැසියන් යොමු කරයි.

සැමට ම එකසේ ප්‍රයෝජන ගත හැකි ලෝවැඩ සඟරාවේ ඇතුළත් දස අකුසල් විස්තර වන පැදි පෙළ තාලයකට අනුව ගායනා කරමින් එහි අදහස් විමසා බලමු.

බුදු බණ අසමින් සිත සත පායේ
කුරුපණ කම් ඇරපිය ඒ පායේ
පරපණ නැසුවොත් කවර උ පායේ
අපමණ දුක් දෙයි සතර අ පායේ

බලයෙන් වත් කිසියම් සොර සිත කින්
සියතින් වත් දැන්වූ උපදෙස කින්
පරසන් තක දෙය ගත සොරකම කින්
නිරයෙන් නිරයට පැමිණෙයි එතෙ කින්

අඳුකොට ගත නො තබති ආදාර ය
වඳකොට මැරුවත් නැත එවිචාර ය
ලගුකොට නොසිතව් පව් පරදාර ය
නිරයට ඇදගෙන යන එම පාර ය

අසවා මකියන බස් අරත රයේ
මුසවා බස් කී වොත් එක මු රයේ
වසවා දෙව්ලොව යන මං ත රයේ
පැසවා මිස නාරී ගොස් නි රයේ

පල දෙන පව්පින් දෙක නොබ ලාමේ
පවසන බස් උරසක් මා ලාමේ
බිඳුවන බස් වැඩනැති කේ ලාමේ
මතුවන දුක් නොදැනෙන වේ ලාමේ

ඇවිස නොකිය බස් කනට යවුල් ලෙ ස
සිත ස තොසින් කිය කියතොත් පිය බ ස
පරුස තෙපුල් බිණුවා නම් මහ දො ස
එවිස නොයයි පරලොව දුක් දී මි ස

පෙර සිට වියතුන් නො කියා වැළ කී
දෙලොවට වැඩ නැති බස් අකුසල් කී
කෙළියට වත් ඒ වැඩ නැති බසෙ කී
නිරයට වැද යන රජ මහ වත කී

අන් සතු සැපතක් දැක දළ ලොබි නේ
උන් ට නොවී මට වේවා යි සිති නේ
මන් කළ ඒ සිත අටගත් පව් නේ
උන් මතු නිරයේ දුක්මයි විඳි නේ

රිසි	නූ දනහට කර වා	දේයා
තසි	වයි යන සිත වැපා	දේයා
බසි	නා නිරයට ඒපා	දේයා
කිසි	කලෙකත් ඒ ඒ පා	දේයා

නිවනට	මග මේ යැයි මුනි කී	යම්
ද හ ම ට	වෙන් වූ දෙසැටක් සම	යම්
සරිකොට	ගත් සිත වෙයි මිස දිටු	යම්
ස ස ර ට	බිජුවට මැයි ඒ සම	යම්

තේරුම -

ප්‍රාණඝාත අකුසලයේ විපාක

බුදුබණ අසා සිත සතුටු කරගෙන අයහපත් වැඩ අත් හරින්න. කුමන ආකාරයෙන් නමුත් පරපණ නැසුවොත් සතර අපායෙහි අපමණ දුක් විඳීමට සිදුවේ.

අදත්තාදාන අකුසලයේ විපාක

බලෙන් හෝ සොරසිත් ඇතිව සියතින් හෝ අනිකකුට උපදෙස් දී ඔහු ලවා හෝ අනුන් සතු දෙයක් සොරකම් කළහොත් ඒ පවෙන් නිරයෙන් නිරයට පැමිණෙයි.

පරදාර සේවන අකුසලයේ විපාක

පරදාර සේවනය කළ තැනැත්තා අල්වා ගත හොත් නිදහස් විය නොහැකිය. වද දී මරා දැමුවත් ඒ ගැන අසන්නට කෙනෙක් නැත. පරදාර සේවනය සැහැල්ලුවෙන් නො සිතන්න. එය නිරයට පමුණුවන මගකි.

මුසාවාද අකුසලයේ විපාක

මා කියන මේ බස් හොඳින් අසන්න. එක වතාවක් බොරු කීවොත් එයින් දෙව්ලොව යන මාවත වැසේ. අකුසල් විපාක දී මිස අත් නොහරී.

### පිසුණාවාචා අකුසලයේ විපාක

විපාක දෙන පව්පින් දෙක ගැන නොසලකා කියන වචන උරචක්‍රමාලාවක් වැනි වේ. ඔවුනොවුන් බිඳුවන බස් කේලාම් ය. කේලාම් කීමෙන් මතු සිදුවන දුක් මේ කල්හි නොදැනේ.

### පරුෂා වාචා අකුසලයේ විපාක

සිතට තරහ ගෙන කනට යවුල් වැනි වූ පරුස වචන නො කියන්න. කතා කරන්නේ නම් සිත සතුටු කරවන පිය තෙපුල් ම පවසන්න. පරුස වචන කීම මහා වරදෙකි. පරලොව දුක් දී මිස ඒ විස දුරු නොවේ.

### සම්ඵප්‍රලාප අකුසලයේ විපාක

පෙර සිට ම උගතුන් කීමෙන් වැළකුණා වූ දෙලොවට වැඩක් නැති බස් කීම පාපයකි. සෙල්ලමට හෝ කියූ ඒ වැඩ නැති බස් නිරයට ඇදගෙන යන රජමාවතකි.

### අභිධ්‍යා අකුසලයේ විපාක

අන් සතු දෙයක් දැක දැඩි ලෝභයෙන් එය ඔවුන්ට හිමි නොවී, මට හිමි වේවායි සිතුයේ නම් ඒ ලෝභී සිතෙන් හටගත් පවින් මතු කල විඳින්නේ නිරා දුක්මය.

### ව්‍යාපාද අකුසලයේ විපාක

තමන් අකැමැති ජනයාට ක්‍රෝධ කොට ඔවුන් විනාශ වෙත්වා යි සිතීම ව්‍යාපාදය යි. එම සිතුවිල්ල අපායට බසින පඩියකි. එබැවින් එය කිසි කලෙකවත් නොකළ යුතු වැඩකි.

### මිච්ඡා දිට්ඨි අකුසලයේ විපාක

බුදුරජාණන් වහන්සේ නිවනට මග මේ යැයි වදාළ දහමෙන් වෙන්ව දෙසැටක් මිසදිටු හරියැයි ගත් සිත මිසදිටු නම් වේ. ඒ මිසදිටු ආගම් සියල්ල සසර දික් කරන බීජ නම් වේ.

දහම් කරුණු

## දස අකුසල්

නරක සිතිවිලිවලින් යුක්තව කරන ක්‍රියා අයහපත් ය. තමාට සහ අනුන්ට අහිතකර ඒවායින් අයහපත් ප්‍රතිඵල ලැබේ. ගවයා පසුපස යන ගැල් රෝදයක් මෙන් අකුසල විපාක දුක් ගෙන දෙමින් අප පසුපස එයි. සිත, කය, වචනය යන තිදොරින් සිදු කෙරෙන අකුසල ක්‍රියා දහයක් වේ. ඒවා මෙසේ වෙන්කර දැක්විය හැකිය.

**කයින්**

ප්‍රාණඝාතය (ජීවිත විනාශ කිරීම), අදින්නාදානය (නුදුන් දේ ගැනීම), කාම මිථ්‍යාචාරය (කාමයෙහි වරදවා හැසිරීම)

**වචනයෙන්**

මුසාවාදය (බොරු කීම), පිසුණාවාචාව (කේළාම් කීම), පරුසාවාචාව (පරුස වචන කීම), සම්ඵප්‍රලාප (හිස් වචන කතා කිරීම)

**සිතෙන්**

අභිධ්‍යාව (දැඩි ලෝභකම), ව්‍යාපාදය (තරහව), මිච්ඡාදිට්ඨිය (වැරදි දැකීම).

**උරසක්මාලා** - ගිනිගෙන දිලිසෙන, කරෙහි පැළඳි කල කර කපාගෙන බසින තියුණු මුවහත් ඇති ආයුධ විශේෂයකි. මෙය මුළු සිරුරම වැනසීමට සමත් වේ. සමගිය සහමුලින් ම වනසන බැවින් කේළාම් උරසක්මාලාවක් බඳු ය.

**නිවනට මග** - ආර්ය අෂ්ටාංගික මාර්ගය යි.

**සසර බිජුවට** - දෙසැට දෘෂ්ටි සසර පැවැත්මට බිජුවට වේ. බිජුවට සේ මේවා දැක්වූයේ මේ මිසදිටුවලින් මිදෙන තුරු නිවන් දැකීමට බැරි බැවිනි. සසර නම් භවයෙන් භවය නැවත නැවත ඉපදීම යි.

**දෙසැටක් සමයම්** - බුදු සමය පහළ වීමට පෙර ඉන්දියාවේ පැවති ආගම් සැට දෙක්කි. මේ සියල්ල ම වැරදි දැකීම් ය.

## ක්‍රියාකාරකම්

1. දස අකුසල් නම් කරන්න.

2. "දස අකුසල් පල අසන්න" පාඩමට ඇතුලත් කවි පන්තිය ඇසුරෙන් ආදර්ශ පාඨ කීපයක් සකස් කර පන්සල්බිමේ ප්‍රදර්ශනය කරන්න.

3. දස අකුසල් වලින් වැළකීම සිසු දිවියට වැදගත් වන්නේ ඇයි දැයි ගුරු තුමා සමග සාකච්ඡා කරන්න.

4. "කුසලින් හැඩවුණ පින්බර මිනිසා" යන මැයෙන් කවියක් නිර්මාණය කරන්න.

# 8 පාඩම



## මම ආනන්ද බුදු හිමි උවටනෙහි සිටි

පියුමතුරා බුදුරජාණන් වහන්සේගේ කාලයේ මම දඹදිව හංසවතී නුවර ඉපදුනා. මගේ පියා වුණේ නන්ද කියන රජතුමා, ඒ කාලයේ මගේ නම සුමන. දවසක් දා භෝග නගරයේ තිබුන සතුරු බියක් මම දුරු කළා. ඒ ගැන සතුටු වුන පිය රජතුමා කැමැති දෙයක් ඉල්ලන්න කියා මට එතක් කළා. එවිට තුන් මාසයක් බුදුරජාණන් වහන්සේට භික්ෂූන් වහන්සේලාට උවටන් කරන්න මම ඉල්ලුවා. බොහොම අමාරුවෙන් එයට අවසර අරගෙන විහාරයට ගොස් සුමන හාමුදුරුවෝ හමු වුනා. උන් වහන්සේ මාව භාග්‍යවතුන් වහන්සේ ළඟට එක්ක ගියා. එතැන දී සුමන හාමුදුරුවන් ශාස්තෘන් වහන්සේට උවටන් කරන හැටි දැක්කාම එහෙම උවටන් කරන්න ඇත්නම් කියා මට හිතුනා. මේ ගැන බුදුරජාණන් වහන්සේගෙන් විමසුවා. දානාදි

පාරමිතා පුරමින් කටයුතු කළොත් අග්‍ර උපස්ථායක තනතුර ලබා ගන්න පුළුවන් බව උන්වහන්සේ වදාළා. එදා පටන් ඒ උතුම් පදවිය පතා බුදුපාමොක් මහ සඟරුවනට සිව්පසය සලසමින් සසර පුරා කටයුතු කළා.

ඒ පැතුම අනුව අන්තිම වතාවට මා ඉපදුනේ කිඹුල්වත්පුර සුද්ධෝදන රජතුමාගේ සහෝදරයෙකු වූ අමිතෝදන රජුගේ පුතෙකු හැටියට. මා උපන් දවසේ ම තමයි සිදුහත් කුමාරයාත් උපන්නේ. සිදුහත් කුමාරයා බුදුබවට පත්ව පළමුවරට කිඹුල්වතට වැඩම කළා. උන්වහන්සේ දවසක් අනුපිය අඹ උයනේ වැඩ සිටින බව මටත් භද්දිය, අනුරුද්ධ, භගු, කිම්බිල, දේවදත්ත කියන ශාක්‍ය කුමාරවරුන්ටත් කරණවෑමි උපාලිටත් ආරංචි උනා. අපි එහි ගොස් බුදුරජාණන් වහන්සේ ළඟ මහණ වුනා. ආනන්ද පඤ්චස්කන්ධය ගැන ඇති සැටියෙන්ම දකිනවා නම් ඒ ගැන කළ කිරෙනවා. ඇලෙන්නේ නැහැ ගැටෙන්නේ නැහැ, එයින් මිදෙන සිත පහළ වෙනවා. මෙයින් සත්‍යාවබෝධ වෙනවා. පුණ්ණ මන්තානි පුත්ත හාමුදුරුවන් වදාළ ඒ බණ අහලයි මම සෝවන් වූයේ.

දවසක් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා රැස් කරලා තමන් වහන්සේට නිත්‍ය උපස්ථායක වරයකු අවශ්‍ය බව පෙන්වා දුන්නා. මේ වන විට නාගසමාල, නාගිත, උපවාන, සුනක්ඛත්ත, සාගත, චුන්ද, රාධ, මේඝිය කියන තෙරුන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට වරින් වර උවටැන් කර තිබුනා. හැබැයි ස්ථිරව නොවෙයි තාවකාලිකව. ඒ නිසයි ස්ථිර උපස්ථායක වරයකු අවශ්‍ය වුණේ. මේ තනතුර සඳහා සැරියුත් මහ රහතන් වහන්සේ ප්‍රධාන රහතන් වහන්සේලා කැමැත්ත ප්‍රකාශ කළා. ඒ ඉල්ලීම් සියල්ලම තථාගතයන් වහන්සේ ප්‍රතික්ෂේප කළා. මගේ නම යෝජනා වුණේ ඊට පස්සේ. ඒ තනතුරට මා කැමැති වුනත් ඉල්ලීමක් කළේ නැහැ. මේ අවස්ථාවේ බුදුහාමුදුරුවෝ කවුරුවත් ආනන්දව මෙහෙයවන්න එපා, කැමතිනම් මට උපස්ථාන කරාවි කියා මතක් කළා. මෙම තනතුර මං භාරගත්තේ කරුණු අටක් මත. පළමුව ඉදිරිපත් කළේ අකමැති කරුණු හතර.

- බුදුරජාණන් වහන්සේට ලැබෙන සිවුරු මට නොදෙනු මැනවි.
- බුදුරජාණන් වහන්සේට ලැබෙන ප්‍රණීත දාන මට නොදෙනු මැනවි.
- බුදුරජාණන් වහන්සේ වැඩ සිටින කුටියේ එකට වාසය කරන්න ඉඩ නොදෙනු මැනවි.
- බුදුරජාණන් වහන්සේට ලැබෙන ආරාධනාවලට මා කැඳවාගෙන නොවඩිනු මැනවි.

භාග්‍යවතුන් වහන්සේට ලැබෙන සිවුරු, ප්‍රණීත ආහාර පාන ලබමින් එකම කුටියේ වසමින් උන්වහන්සේට ලැබෙන ආරාධනාවලට වඩිමින් උපස්ථාන කරන විට එය දකින අය කියනවා, ඔහොම වාසි ලැබෙනවානම් කාට බැරිද උපස්ථාන කරන්න කියා. මම ඒවගේ චෝදනා අහන්න කැමැති නැහැ. ඒකයි ඒ කරුණු ඉදිරිපත් කළේ කියා මා මතක් කළා.

මේ තනතුර භාරගැනීමට නම් ඉටුවිය යුතු කරුණු හතරකුත් ඉදිරිපත් කළා.

- මා භාරගත් ආරාධනාවලට තථාගතයන් වහන්සේ වැඩමවන්න ඕනෑ.
- නොයෙක් රටවලින් තථාගතයන් වහන්සේ දකින්න එන අය කැඳවාගෙන එන්න මට ඉඩ තියන්න ඕනෑ.
- මට සැකයක් ඇති වූ ඕනෑම වේලාවක ඔබ වහන්සේ හමුවෙලා කථා කරන්න අවසර තියෙන්න ඕනෑ.
- මා නැති තැන වදාළ දහම් කරුනු එලෙසින්ම මට දේශනා කරන්නත් ඕනෑ.

මේ ඉල්ලීම්වලින් මම බලාපොරොත්තු වුනේ මගේ තනතුරේ ගෞරවනීය තත්ත්වය තව දුරටත් ආරක්ෂා කර ගැනීම යි. මේ කරුණු ඉටු කරන්න බැරි වුනොත් මගේ තනතුරට ඒක ගැළපෙන්නෙත් නැහැ.

මම මෙහෙම ප්‍රකාශ කළාම තථාගතයන් වහන්සේ මාව ස්ථිර උපස්ථායක තනතුරට පත් කළා. පසුව මට තවත් තනතුරු රැසක් ලැබුණා.

- බහුශ්‍රැත භික්ෂූන් වහන්සේලා අතර අග තනතුර
- සිහි කල්පනා ඇති භික්ෂූන් වහන්සේලා අතර අග තනතුර
- අවබෝධ ශක්තිය ඇති භික්ෂූන් වහන්සේලා අතර අග තනතුර
- ධෛර්ය සම්පන්න භික්ෂූන් වහන්සේලා අතර අග තනතුර

ඒ වගේම ධර්ම භාණ්ඩාගාරික තනතුරත් මට හිමිවුනා. මේ පදවිලාභ තුළින් මා කිසිවිටකවත් අයුතු ප්‍රයෝජන, නම්බුනාම, වරප්‍රසාද, ලාභ කීර්ති ප්‍රසංසා කිසිවක් අපේක්ෂා කළේ නැහැ. අන් අයගේ යහපත උදෙසා කළ දේ කුමක් ද කළ යුතු දේ කුමක් ද කියලා පමණයි මම බැලුවේ.

මම බොහොම ගුරු ගෞරවයෙන් කටයුතු කළ කෙනෙක්. දවසක්දා සාමණේර නමක් මහා කාශ්‍යප මහරතන් වහන්සේගෙන් උපසම්පදාව අපේක්ෂා කළාම ඒ හිමියනට කර්ම වාක්‍ය කීමට මට පැමිණෙන්නැයි

පණිවිඩයක් එව්වා. එහෙත් මා මහා කාශ්‍යප රහතන් වහන්සේගේ නම කියන්න අකමැති වුණා. උන්වහන්සේ මගේ ගුරුවරයා නිසා මා මේ බව උන්වහන්සේට දැන්නුවා.

ඒ වගේම මට මතකයි ශාන්තිනායකයාණෝ දෙව්රම් වෙහෙරේ නැති දිනවලට විහාරයට එන සැදැහැවතුන් හරියට දුක් වෙනවා. උන්වහන්සේ දැක බලා වැඳ පුදා ගන්න නොලැබෙන නිසා. මේ සඳහා පිහිටක් වෙන ලෙස අනේ පිඬු සිටුතුමා මගෙන් ඉල්ලීමක් කළා. ඒ අනුව තමයි භාග්‍යවතුන් වහන්සේගේ අනුමැතිය ඇතිව මුගලන් රහතන් වහන්සේ ලවා ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් වැඩමවා ගෙනවිත් ජේතවනාරාමයෙහි රෝපනය කළේ.

තවත් සිද්ධියක් මට මතක් වෙනවා. විශාලා මහනුවර කූඨාගාර ශාලාවට බුද්ධමාතාව ප්‍රධාන කාන්තාවන් පන්සියයක් පැමිණි අවස්ථාව. කසාවත් හැඳ පැවිද්ද අපේක්ෂාවෙන් කායික මානසික පීඩාවෙන් සිටි ඒ අයගේ කාරුණික ඉල්ලීමට අනුව බුදුරජාණන් වහන්සේ වෙතින් පැවිද්ද, උපසම්පදාව ලබාදෙන්නට මට හැකිවුනා.

මෙවන් සේවාවන් රැසක නියැලුන මට ඉවසා දරා ගත නොහැකි සිදුවීමක් වුණා. ඒ තමයි බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පාන බව ඇසීම. උන්වහන්සේට සිසිල් පැන්, උණුපැන්, දැහැටි දඬු පිළිගැන්වූ හැටි, උන්වහන්සේගේ ආරක්ෂාවට රෑ කල පහන් රැගෙන කුටිය අවට සෝදිසි කළ හැටි, නාලාගිරි ඇතා ආ විට උන්වහන්සේ බේරාගන්නට ඉදිරිපත් වූ හැටි, වේරඤ්ජාවේ වස් කාලය ගත කළ හැටි, චිංචාමානවිකාව, අක්කෝසක බමුණා ආදි අය උන් වහන්සේට දොස් කියන විට වෙනත් නගරයකට යමුයි, යෝජනා කළ හැටි, පූතිගත්ත තිස්ස හිමියන්ට උවටැන් කළහැටි; සුනීත, සෝපාක ආදී අසරණයන් මහණ කළ හැටි, පටාචාරා කිසාගෝතමී, රජ්ජුමාලා ආදී අසරණ කාන්තාවන්ට පිහිට වූ හැටි; විශාලා මහනුවර තුන්බිය දුරු කිරීමට රතන සූත්‍ර දේශනාව අනුදැන වදාළ හැටි; විසිපස් වසරක් පුරාවට සිදුවුන මෙවන් සිදුවීම් මගේ සිතේ පෙළින් පෙළට රූගත වෙන්න පටන් ගත්තා. ඒවා මතක් වුණාම හඬා වැළපුනා. මගේ මේ දුක්බර අඳෝනාව අහපු උන්වහන්සේ මාව කැඳවලා මෙහෙම වදාළා.

"ආනන්ද, ඔබ ශෝක වන්නත් එපා, හඬන්නත් එපා, මම කලින් ම මතක් කළා නේද, ප්‍රිය මනාප වස්තුවලින් වෙන් වෙන්න සිදුවෙන බව. ඇති වූ හැම දෙයක් ම කැඩෙන බිඳෙන නැතිවෙන බව. ප්‍රිය මනාප පුද්ගලයන්ගෙන්

වෙන් වෙන්න සිදු වෙන බව. ඒවා එහෙම නොවේවා කීවත් එම පැතුම් කවදාකවත් ඉටුවෙන්නේ නැහැ. ආනන්ද ඔබ බොහෝ පින් කළ කෙනෙක්. ඔබ ඉක්මනින් ම රහත් වෙනවා."

භාග්‍යවතුන් වහන්සේ මා ගැන විශේෂ ප්‍රකාශයකුත් කළා. මහණෙනි, මේ ආනන්ද ළඟ ආශ්චර්ය අද්භූත ධර්ම සතරක් තියෙනවා. මා දකින්න එන අය පළමුව හමුවන්නේ ආනන්ද. ඒ අය ආනන්ද දුටු විගස ම පහදිනවා. කථා බහ කළාම ඊටත් වඩා පහදිනවා. ධර්මය දේශනා කළාම තව තවත් අහන්න හිතෙනවා. ඊළඟට ආනන්ද නිහඬව සිටියොත් ඒකටත් පහදිනවා.

මම මේ කරුණු සියල්ල ම උපෙක්ෂා සහගතව දරාගෙන, බුදුරජාණන් වහන්සේ වදාළ ලෙස ම උන්වහන්සේගේ ශ්‍රී දේහය රාජ්‍ය ගෞරව සහිතව ආදාහනය කිරීමට කටයුතු පිළියෙල කළා. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා තෙමසක් සම්පූර්ණ වීමට පෙර දින මම රහත් ඵලයට පත් වුණා. ඊට පසුදා ආරම්භ වුණ ප්‍රථම ධර්ම සංගායනාවේ දී ධර්මය ගැන මගෙන් මහා කාශ්‍යප රහතන් වහන්සේ කරුණු විමසුවා මම ඒ සියල්ලට ම "ඒවං මේසුතං ආදී වශයෙන් පිළිතුරු ලබා දුන්නා"

මා මෙතෙක් සඳහන් කළේ මගේ ජීවන තොරතුරු වලින් බිඳක් පමණයි. දැන් මගේ වයස අවුරුදු එකසිය විස්සයි. මට දැන් පිරිනිවනට කාලය ඇවිත්. බුදු සසුන වෙනුවෙන් මා කළ සේවාව බොහෝ කාලයක් පවතීවා යන්න මගේ අවසන් ප්‍රාර්ථනාවයි.

"චිරං තිට්ඨතු ලෝකස්මිං - සම්මා සම්බුද්ධ සාසනං"

**අනඳ මාහිමි සිරිතෙන් ගත හැකි ආදර්ශ**

- අසීමිත ගුරු ගෞරවය
- තනතුරක් ලබා ගැනීමේ දී එය ගෞරවාන්විතව ලබා ගැනීම
- තනතුරුවලට අවශ්‍ය සුදුසුකම් සපුරා ගැනීම
- ලැබුණු තනතුරේ ගෞරවය අකුරට ම ආරක්ෂා කිරීම
- වෙහෙස මහන්සිය නොබලා සේවය සඳහා කැපවීම

**ක්‍රියාකාරකම්**

(1) සුමන කුමාරයා කළ ප්‍රාර්ථනාව කුමක්ද ?

(2) බුද්ධ උපස්ථායක තනතුර භාරගැනීමේ දී අනඳ තෙරණුවන් ඉදිරිපත් කළ ඉල්ලීම් අට නම් කරන්න.

(3) "මම ආනන්ද බුදුහිමි උවටනෙහි සිටි" මැයෙන් කවි දෙකක් නිර්මාණය කරන්න.

(4) අනඳ මාහිමි සිරිතෙන් ගත හැකි ආදර්ශ කීපයක් එම සිද්ධි ද අදාල කර ගනිමින් ඉදිරිපත් කරන්න.

# 9 පාඩම

## දුක්ඛාර්ය සත්‍යය

බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතන මිගදායේ දී පළමු වරට පස්වග තවුසනට ආර්ය සත්‍ය සතර දේශනා කළ සේක. ඒ ආර්ය සත්‍ය නම්,

1. දුක්ඛ ආර්ය සත්‍යය
2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය
4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය යන සතරයි.

දුක, දුකට හේතුව, දුක නැති කිරීම හා දුක නැති කිරීමේ මග පිළිබඳ ආර්ය සත්‍ය සතර යන්න මෙහි තේරුමය. ධම්මචක්කප්පවත්තන සූත්‍රය නමින් හැඳින්වෙන පළමු දේශනයෙහි දී කෙටියෙන් කරන ලද ආර්ය සත්‍ය හැඳින්වීම වෙනත් දේශනයන්හි දී විස්තර සහිතව දැක ගත හැකිය. දුක්ඛ ආර්ය සත්‍යය පිළිබඳව මේ පාඩමෙන් අප ඉගෙන ගන්නේ ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙහි ඇතුළත් පරිදිය. එහි මෙසේ කියැවේ.

- ❖ ඉපදීම දුකකි - (ජාති)
- ❖ දිරායෑම දුකකි - (ජරා)
- ❖ ලෙඩවීම දුකකි - (ව්‍යාධි)
- ❖ මරණයට පත්වීම දුකකි - (මරණ)
- ❖ අප්‍රිය සම්ප්‍රයෝගය දුකකි - (අප්පියේහි සම්පයෝගෝ දුක්ඛො)
- ❖ ප්‍රිය විප්‍රයෝගය දුකකි - (පියේහි විප්පයෝගෝ දුක්ඛො)
- ❖ කැමති දෑ නොලැබීම දුකකි - (යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං)
- ❖ කෙටියෙන් කිවහොත් පංච උපාදානස්කන්ධය ම දුකකි - සංඛිත්තේන පංචුපාදානක්ඛන්ධා දුක්ඛා

1. ජාති දුක - ඉපදීම

ජාති යනු ඉපදීම යි. මිනිසකු වශයෙන් හෝ තිරිසනකු වශයෙන් හෝ වෙනත් කිසියම් සතකු වශයෙන් හෝ ඉපදීම දුකක් බව එයින් අදහස් වේ. ඉපදීම දුකක් වන්නේ ඉපදෙන විට දැනෙන දුක්ඛදායක වේදනාව නිසාම නොවේ. ඉපදීමෙන් පසු විඳින්නට ලැබෙන සියලු ම දුක් ඉපදීමේ හේතුව නිසාම ඇතිවන ඒවාය. ඒ නිසාම ඉපදීම දුකකි. මිනිස්සු, අනෙක් සියලු දුක් නැති කරගෙන ජීවත්වීමට පුළුවන් නම් ඉපදීමට කැමති වෙති. මිනිසුන්ගේ බලාපොරොත්තුව එය යි. එහෙත් යම්තාක් ඉපදීම සිදුවේ ද ඒ තාක් අනෙක් සියලු දුක් ද ඇති වේ. එනිසා ඉපදීම බලවත් ම දුකය.

2. ජරා දුක - දිරා යෑම

ජරාව නම් දිරා යෑම යි. දත් දිරා යෑම, කෙස් පැසීම, ඇඟ රැළි වැටීම, ශරීරය දිරායන ආකාරයන් ය. එහෙත් මේ දිරා යෑම පෙනෙන්නේ වයසට යන විට ය. මහළු වීමත් සමඟම ජරා දුක පෙනෙන්නට පටන් ගත්තත් උපන්දා සිට ශරීරය වෙනස් වීමට පත් වෙයි. ජීවිතයේ මුල් කාලයේ දී ඉන්ද්‍රිය මුහුකුරා යෑම ලෙස හැඳින්වෙන මේ වෙනස් වීම පසු කාලයේ දී ඉන්ද්‍රිය දුර්වල වීම ලෙස හඳුන්වනු ලැබේ. උපන්දා සිට මරණය දක්වා සිදුවන මේ සියලු වෙනස් වීම් ජරා දුකට අයත් වේ.

3. ව්‍යාධි දුක - ලෙඩ වීම

උපන් මිනිසා ලෙඩ වීම ස්වභාවයකි. කයට ද, සිතට ද ලෙඩ සෑදේ. මෙහිදී විශේෂයෙන් කය ලෙඩ වීම ගැන සැලකේ. කායික රෝග රාශියකි. කලාතුරකින් යමකුට ටික කාලයක් අසනීපයක් නැතිව ජීවත් වීමට පුළුවන. එහෙත් සාමාන්‍ය ස්වභාවය නිතර අසනීප සෑදීම ය. කවර ආකාරයේ හෝ අසනීපයකට භාජනය වීම දුකකි. ලෙඩ වූ විට තමන් කර ගෙන ආ කටයුතු එකක් වත් ඒ අයුරින් කර ගැනීමට නොහැකිවීම නිසා වේදනාවක් දැනේ. එය ශරීරයට මෙන් ම සිතට ද දැනෙන දුකකි.

4. මරණ දුක - මිය යෑම

ජීවිතයේ අවසානය මරණය යි. හැම දෙනාට ම මරණයට මුහුණපෑමට සිදුවේ. මරණයට පත් නොවී මරණ දුක හරි හැටියට දැන ගැනීමට නුපුළුවන. එහෙත් මරණයට පත්වීම මහා වේදනාකාරී සිදුවීමක් බව බොහෝ අයගේ මරණ මොහොත දෙස බලා සිටින විට පෙනේ. මියයෑමට පළමු කාලයක සිට මරණ බියෙන් බියපත්ව සිටින්නෝ වෙති. මරණය ගැන ඇසීමට පවා බිය ඇත්තෝ අප අතර සිටිති. බියෙන් තැති ගෙන සිටියත්, මරණය අමතක කර සිටියත් සෑම මිනිසාට ම, සෑම සතාට ම යම් දිනෙක මැරෙන්න සිදුවේ. කිසිවෙක් මැරෙන්න කැමති නොවෙති. එහෙත් මරණය ඉපදීමත් සමඟ ගෙන එන දායාදයකි. නොමැරෙන්න නම් නූපදී සිටිය යුතුය.

5. අප්පිය සම්පයෝග දුක

තමන් කැමති අය ඇසුරු කිරීමට ලැබීම මහත් සැනසීමක් වන අතර තමන් අකමැති අය ඇසුරට ලැබීම ද එවැනි ම දුකකි. අකමැති අය සමඟ පමණක් නොව අකමැති පරිසරයක ජීවත්වීමට සිදුවීම ද දුකකි. අකමැති ක්‍රියාවක යෙදීමට සිදුවීම ද එවැනි ම වේදනාකාරී තත්වයකි. මේ සියල්ල අප්පිය සම්පයෝග දුක ලෙස හැඳින්විය හැකිය.

6. පිය විප්පයෝග දුක

තමන් ප්‍රිය කරන පුද්ගලයාගෙන් ඈත්වීමට තමන් ප්‍රිය කරන පරිසරයෙන් ඉවත්වීමට, තමන් ප්‍රියකරන නොයෙකුත් දැයින් වෙන්වීමට අපට සිදුවේ. එය ප්‍රිය විප්‍රයෝග දුක නම් වේ. ජීවත්වීමේ දී අපට අප කැමති අය ම, අප කැමති තැන්ම, අප කැමති දේම නොලැබෙන නිසා ප්‍රිය විප්‍රයෝග දුකට නිතර ම භාජනය වීමට සිදුවේ.

7. කැමති දෑ නොලැබීම

කැමති දෑ නොලැබීම, ඉච්ඡා නම් කැමැත්තය. නොලැබීම අලාභයකි. ඉච්ඡිතාලාභ දුක යනුවෙන් ද මේ දුක හැඳින්විය හැකිය. මිනිසුන්, පොදුවේ කවුරුත් කැමතිවන බොහෝ දේ ඇත. එයිනුත් ලෙඩ නොවී සිටීමට, ජරාවට පත් නොවී සිටීමට, නොමැරී සිටීමට, දුකට සෝකයට පත් නොවී සිටීමට අපි ප්‍රාර්ථනා කරමු. කොපමණ කැමති වුනත්, ප්‍රාර්ථනා කළත් මෙවැනි දුක් නොලබා සිටීමට නුපුළුවන.

8. **පංචුපාදානක්ඛන්ධ දුක්ඛය**

පළමුව ජාති, ජරා ආදී දුක් වෙන වෙනම පැහැදිලි කළ බුදුරජාණන් වහන්සේ කෙටියෙන් කිවහොත් පංච උපාදානස්කන්ධය ම දුක යැයි වදාළසේක. මිනිසා යනු ශරීරයක් හා සිතක් ඇති ජීවියෙකි. ඒ ශරීරය සහ සිත ස්කන්ධ පහකට බෙදා දක්වනු ලැබේ. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යනු ඒ පංචස්කන්ධයයි. මේ ස්කන්ධ පහ සිතෙන් අල්ලා ගැනීම උපාදාන යැයි කියනු ලැබේ. ස්කන්ධ පහ උපාදාන කර ගැනීමෙන් පංච උපාදානස්කන්ධය සෑදේ. මෙය සිතෙන්ම ඇති කරගන්නා සිතුවිල්ලක් පමණක් බව අප තේරුම් ගත යුතුය. ඉහතින් කළ සියලුම දුක් ඇතිවන්නේ පංච උපාදානස්කන්ධය ම පදනම් කරගෙනය.

**ක්‍රියාකාරකම් :**

1. පංචස්කන්ධය හා පංච උපාදානස්කන්ධය වෙන වෙනම ලියා දක්වන්න.
2. උපාදානය යනු කුමක්දැයි හඳුන්වන්න.
3. දුක්ඛාර්ය සත්‍යය ගැන ඉගෙන ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන නම් කරන්න.
4. දුක්ඛාර්ය සත්‍යයට ඇතුළත් එක් දුකක් චිත්‍රයක් මඟින් නිරූපණය කරන්න.

# 10 පාඩම

## දියුණුවේ දොරටු

එදා, රැස්වීම් ශාලාවේ සිටි පිරිස අතරින් එක් තැනැත්තෙක් මංගල කරුණකට යන බව කියා පිටව ගියේ ය. මංගල කරුණක් කියන්නේ කුමකටදැයි පිරිස අතර කතා බහක් ඇති විය. මේ ප්‍රශ්නය මිනිසුන්ට විසඳා ගැනීමට නුපුළුවන් වූයේ ය. දෙවියන් අතරට ද පැමිණි ප්‍රශ්නය ගැන නිවැරදි විසඳුමක් නොවූ නිසා දිනක් එක් දේවතාවෙක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ එය විසඳා දෙන ලෙස අයැද සිටියේ ය. බුදුහාමුදුරුවෝ මංගල කරුණු තිස් අටක් දේශනා කළහ. මහා මංගල සූත්‍රයෙහි ඇතුළත් වන්නේ ඒ කරුණු තිස් අට ය. මංගල නමින් බුදුරජාණන් වහන්සේ හඳුන්වා දුන්නේ මිනිසාගේ දියුණුවට හේතුවන කරුණු ය. පාසල් යන දරුවකුට මෙන්ම වැඩිහිටියකුට ද, ගිහියකුට මෙන්ම පැවිදි උතුමකුට ද දියුණුවීම සඳහා අනුගමනය කිරීමට කරුණු මෙහි ඇතුළත් වේ. පුද්ගලයකුගේ මෙන් ම සමාජයේ දියුණුවට හේතුවන කරුණු මෙහි ඇතුළත් වේ. එසේම පවුලේ දියුණුවට මෙන්ම ආයතනයක දියුණුවට අදාළ ඉගැන්වීම් ද, ආර්ථික, සදාචාරාත්මක හා ආධ්‍යාත්මික දියුණුවට අදාළ ඉගැන්වීම් ද මේ අගනා සූත්‍ර ධර්මයෙන් හෙළි වෙයි. ඒ නිසා මේ සූත්‍රය පිරිතක් වශයෙන් සජ්ඣායනය කිරීමට පමණක් සීමා කර නොගත යුතු ය. එහි ඇතුළත් කරුණු තේරුම් ගෙන, තම තමාගේ ජීවිත ඒ අනුව හැඩ ගසා ගැනීමට උත්සුක විය යුතුය. පළමුව අපි, සූත්‍රයේ සඳහන් ආකාරයට, අනුපිළිවෙළින් මංගල කරුණු තිස් අට කෙටියෙන් තේරුම් ගැනීමට උත්සාහ කරමු.

1. **අසේවනා ච බාලානං** - බාලයන් ඇසුරු නොකිරීම හා
2. **පණ්ඩිතානං ච සේවනා** - පණ්ඩිතයන් ඇසුරු කිරීම

මුලින් ම සඳහන් මංගල කරුණු දෙක ය. මෙහි බාලයන් යනු අයහපත් ගතිගුණ ඇති අය වේ. පණ්ඩිතයන් නම් යහපත්

ගතිගුණ ඇති අය යි. ඇසුරු නොකිරීම යනු කතා නොකර සිටීම හෝ තරහ වීම නොවේ. ඔවුන් සතු නරක ගතිගුණ තමන් පුරුදු කර නොගැනීම ඇසුරු නොකිරීම ය. යහපත් අය සතු හොඳ ගුණ තමන් ද පුරුදු කර ගැනීම ඔවුන් ඇසුරු කිරීම ය. ආශ්‍රය, කෙනෙකු යහපත් හෝ අයහපත් අයකු බවට පත් කිරීමේ ප්‍රධානතම හේතුව බව සලකා ඇසුරු කළ යුතු, නොකළ යුතු අය තෝරා ගෙන තම චරිතය ගොඩනගා ගැනීමට අප විමසිලිමත් විය යුතු ය.

3. **පූජා ච පූජනීයානං** - පිදිය යුත්තන් පිදීම ය.

මව්පියන්, ගුරුවරුන්, පැවිදි උතුමන්, වැඩිහිටියන් පිදිය යුත්තෝ වෙති. ඒ අයට නිසි ගරුබුහුමන් කිරීම ය.

4. **පතිරූප දේස වාසෝ** - සුදුසු පියෙසක විසීම ය.

යහපත් මිනිසුන් ජීවත් වන පරිසරය සුදුසු පියෙසය. එමෙන්ම පහසුකම් සහිත පරිසරය ද ජීවත්වීමට සුදුසු පියෙස ය. පරිසරය ගැන අවධානය යොමු කළ යුතු බව මෙයින් කියැවේ.

5. **පුබ්බේ ච කත පුඤ්ඤතා** - පෙර කළ පින් ඇති බව ය.

පෙර භවයන්හි කරන ලද පින් මෙන් ම මේ භවයේ දී ගත වූ කාලයේ කරන ලද පින් පෙර පින් නම් වේ. යහපත් ප්‍රතිඵල ලබා දෙන ක්‍රියා පින් නමින් හැඳින්වේ.

6. **අත්ත සම්මා පණිධි** - තමන්ගේ සිත හොඳින් සංවර කර ගැනීම ය. සිත සංවර වූ තරමට වචනය හා ක්‍රියාව ද සකස් වෙයි. එවිට යහපත් ලෙස තමන්ගේ පෞරුෂය ගොඩනගා ගැනීමට හැකිවෙයි.

7. **බාහුසච්චං** - බහුශ්‍රැත බව ය. එනම් උගත් බව ය. භාෂාවන් හා නොයෙක් ශාස්ත්‍ර ඉගෙනීම හෙවත් ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබාගැනීම එයින් අදහස් වේ.

8. **සිප්පං** - ශිල්ප ඉගෙනීම ය. විශේෂයෙන් රැකියාවක් කිරීම සඳහා හේතු වන ශිල්ප දැනීම ය. වෘත්තීය අධ්‍යාපනය යි.

9. **විනයෝ ච සුසික්ඛිතෝ** - මැනැවින් හික්මුණු බව යි. සමාජයේ සදාචාර සම්පන්නව ජීවත්වීමට ඉගෙන ගැනීම යි.

10. **සුභාසිතාච යා වාචා** - යහපත් වචන කතා කිරීම ය. බොරු නොකියා සත්‍ය වචන කතා කිරීම, කේළාම් නොකියා මිනිසුන් එකමුතු කරන වචන කතා කිරීම, පරුෂ වචන නොකියා සිත් සනහන වචන කතා කිරීම මහා ප්‍රලාප නොදොඩා අර්ථවත් වචන කතා කිරීම ය.

11. **මාතා උපට්ඨානං** - මවට උවටැන් කිරීම ය.

12. **පිතු උපට්ඨානං** - පියාට උවටැන් කිරීම ය.

13. **පුත්තදාරස්ස සංගහෝ** - අඹුදරුවන්ට සංග්‍රහ කිරීම ය.

14. **අනාකුලා ච කම්මන්තා** - නිරවුල් කර්මාන්ත ඇති බව යි. යෙදෙන රැකියාව අවුල් සහගත තත්ව ඇති නොවන පරිදි, විධිමත් කළමනාකරණයකින් යුක්තව කිරීම ය.

15. **දානං** - දන් දීම ය. දන් දීමේ ක්‍රම දෙකක් ඇත. පූජා බුද්ධියෙන් හා අනුග්‍රහ බුද්ධියෙනි. පැවිදි හා වෙනත් උතුමන්ට කරන පූජාවක් වශයෙන් දන් දීම පූජා බුද්ධියෙන් දන් දීම ය. අඩුපාඩු, අවශ්‍යතා ඇති අයට දීම අනුග්‍රහ බුද්ධියෙන් දීම ය.

16. **ධම්මචරියා** - දහමට අනුව තම ජීවිතය හැඩගසා ගැනීම ය.

17. **ඤාතකානංච සංගහෝ** - නෑයින්ට සංග්‍රහ කිරීම ය.

18. **අනවජ්ජානි කම්මානි** - නිවැරදි ක්‍රියාවල නිරතවීමය. සිතින්, කයින්, වචනයෙන් සිදුවන වැරදිවලින් වෙන්වීම, සිල් සමාදන්වීම ආදී පුණ්‍ය ක්‍රියාවන්හි යෙදීම ය.

19. **ආරති පාපා** - පව්කම්වලින් ඈත්වීම ය.
**විරති පාපා** - පව්කම්වලින් වෙන්වීම ය.

තමන්ටත්, අනුන්ටත්, අයහපත් ප්‍රතිඵල ගෙන දෙන වචන ක්‍රියා සිතිවිලි පව් නම් වේ.

20. **මජ්ජපානා ච සංයමෝ** - මද්‍යසාරයෙන් වැළකීම ය. මත්වීමට හා සිහිය විකල්වීමට හේතුවන සියලුම දේවල් මද්‍යසාර යි.

21. **අප්පමාදෝ ච ධම්මේසු** - ධර්මයෙහි අප්‍රමාදවීම ය. සිහි ඇතිව යහපත් වැඩවල යෙදීම ය.

22. **ගාරවෝ** - ගරු කළයුත්තන්ට ගරු කිරීම ය. පිදිය යුත්තන් ලෙස සඳහන් කළ සියල්ලෝ ම ගරු කළයුත්තෝ ද වෙති.

23. **නිවාතෝ** - යටහත් පැවතුම් ඇති බව ය. ආඩම්බරකම් නැති අනතිමානී ගුණය එයින් අදහස් වේ.

24. **සන්තුට්ඨී** - සතුට ය. එනම් තෘප්තිමත් බවයි. එය තුන් ආකාරයකින් ලද හැකි බව දක්වේ. එනම්,

යථාලාභ - ලැබෙන පමණින් තෘප්තිමත්වීම
යථාබල - තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් තෘප්තිමත්වීම හා
යථා සාරුප්ප - තමන්ට ගැළපෙන පමණින් තෘප්තිමත්වීම ය.

25. **කතඤ්ඤුතා** - කෘතඥතාව. කළගුණ සැලකීම යි. තමන්ට උපකාර කළ අයට උපකාර කිරීමයි.

26. **කාලේන ධම්මසවණං** - සුදුසු කල දහම් ඇසීමයි.

27. **ඛන්ති** - ක්ෂාන්තිය හෙවත් ඉවසීම ය.

28. **සෝවචස්සතා** - සුවච බව ය. එනම් ඇහුම්කන් දීමට ඇති කැමැත්ත ය.

29. **සමණානං ච දස්සනං** - පැවිදි උතුමන් දැකීම ය.

30. **කාලේන ධම්ම සාකච්ඡා** - සුදුසු කල ධර්මය සාකච්ඡා කිරීම ය.

31. **තපෝ** - තපසය. එනම් සංවරය යි. හික්මීම යි.

32. **බ්‍රහ්මචරියං** - උතුම් හැසිරීම ය. ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීම යි.

33. **අරියසච්චාන දස්සනං** - ආර්ය සත්‍ය දැකීමය

ආර්ය සත්‍ය සතරකි. 1. දුක්ඛ ආර්ය සත්‍යය 2. දුක්ඛ සමුදය හෙවත් දුකට හේතුව වන තණ්හාව 3. දුක්ඛ නිරෝධ හෙවත් නිර්වාණය හා 4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා හෙවත් දුක නැතිකරන මග නම් වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය යන සතර තේරුම් ගැනීම ය.

34. **නිබ්බාන සච්ඡිකිරිය** - නිවන් දැකීම ය.

35. **ඵුට්ඨස්ස ලෝක ධම්මේහි
චිත්තං යස්ස න කම්පති**

අටලෝ දහමින් සිත කම්පා නොවීම ය. අටලෝ දහම් නම්, ලාභ - අලාභ, අයස - යසස, නින්දා - ප්‍රශංසා, සැප - දුක යන අටය.

36. **අසෝකං** - ශෝක නොකිරීම ය.

37. **විරජං** - රජස් යනු දූවිලි ය. එනම් කෙලෙස් ය. කෙලෙස් නැති බවය.

38. **ඛේමං** - භය නැති බව ය.

මේ අවසන් මංගල කරුණු 4 සපුරා ගෙන ඇති උතුමා රහතන් වහන්සේ ය.

ක්‍රියාකාරකම් :

- පන්තිය කණ්ඩායම් සතරකට බෙදෙන්න. එක් එක් කණ්ඩායමක් පහත සඳහන් මාතෘකා සතරෙන් එක බැගින් තෝරාගෙන එයට විශේෂයෙන් අදාල වන මංගල කරුණු වෙන් කරගන්න.

- ඒ කරුණු තමන් තෝරාගත් මාතෘකාවට අදාලව, දියුණුවට හේතුවන ආකාරය සාකච්ඡා කරන්න. කණ්ඩායමේ එක් ශිෂ්‍යයකු තම කණ්ඩායමේ සකාච්ඡා වූ කරුණු පන්තියට ඉදිරිපත් කරන්න.

මාතෘකා සතර -

1. දරුවන්ගේ/ශිෂ්‍යයන්ගේ දියුණුවට හේතුවන මංගල කරුණු
2. පවුලේ දියුණුවට හේතුවන මංගල කරුණු
3. සමාජයේ දියුණුවට හේතුවන මංගල කරුණු
4. මිනිසාගේ ආගමික (ආධ්‍යාත්මික) දියුණුවට හේතුවන මංගල කරුණු

මෙහි සඳහන් සමහර මංගල කරුණු මාතෘකා කිහිපයකට අදාළවීමට ද ඉඩ තිබේ.

# 11 පාඩම

## පිරිසිදුකම ගැන සැලකිලිමත් වෙමු.

බුදුදහමේ බෙහෙවින් අගය කැරෙන්නකි පිරිසිදුකම. පුද්ගලයකුගේ ඇතුළත පිරිසිදුකම ගැන මෙන් ම බාහිර පිරිසිදුකම ගැනත්, අවට පරිසරයේ පිරිසිදුකම ගැනත් බුදුදහමේ සැලකිල්ල යොමු වී ඇත. ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර පිරිසිදුකම එනම් කෙලෙසුන්ගෙන් නිදහස් වීම ගැන ද බාහිර පිරිසිදුකම ගැන ද, අවශ්‍යයෙන් ම සැලකිලිමත් විය යුතු බව බුද්ධ දේශනාවන් ගෙන් පැහැදිලි වේ. මෙම පාඩමේ සාකච්ඡා වන්නේ බාහිර පිරිසිදුකමට අදාළ කරුණු කීපයක් ගැන පමණකි.

බාහිර පිරිසිදුකම ගැන සාකච්ඡා කිරීමේ දී විශේෂයෙන් සඳහන් කළයුත්තක් නම් බුදුදහම සුන්දරත්වය අගය කරන දහමක් මිස සුන්දරත්වය පිටුදකින දහමක් නොවන බව යි. බෝසතාණන් වහන්සේ භාවනා කිරීම සඳහා තෝරා ගත්තේ ද සුදුපාට දිය ඇළි සහිතව ගලා බස්නා ගංගාවක් අසබඩ රමණීය භූමි භාගයකි. ස්වාභාවික සුන්දරත්වය ඇති පරිසරය භාවනාවට යෝග්‍යය යන්න බෝසතුන්ගේ නිගමනය වූ බව බුදුරජාණන් වහන්සේ වදාළහ.

සුන්දරත්වය ආරක්ෂාවීමට අවශ්‍ය ම කරන දෙයකි පිරිසිදුකම. හොඳින් ඇමැද කුණු රොඩු ඉවත් කරන ලද සෑ මළුව, බෝ මළුව, විහාර මළුව මොන තරම් සුන්දරද? රමනීයද සුන්දරත්වය තිබිය යුත්තේ සෑ මළුව, බෝ මළුව වැනි තැන්වල පමණක් නොවේ. අප භාවිත කරන භාණ්ඩ හා උපකරණවල ද තිබිය යුතු ය. ඒවායේ සුන්දරත්වය සුරක්ෂිත වීමට පිරිසිදුකම අවශ්‍යම ය. පිරිසිදුකම නිසා සුරැකෙන්නේ සුන්දරත්වය පමණක් නොවේ. එම භාණ්ඩ පරිහරණය කරන්නන්ගේ සෞඛ්‍ය සම්පන්න භාවය ද සුරක්ෂිත වේ. අප භාවිතයට ගන්නා පිඟන් කෝප්ප ගැන සිතා බලමු. පිඟන් කෝප්ප පිරිසිදු කිරීමට යොදන කුමන ද්‍රව්‍යයක් හෝ ද්‍රාවයක් යොදා ඒ පිඟන් කෝප්ප වරින් වර පිරිසිදු නොකරන්නේ නම් මොන තරම් අවලස්සනද?

කෝප්පයේ වටේට ම තොල තැබූ තැන් කහට ගැන්වී තිබෙනු දැකිය හැකි වෙයි. තේ පිළියෙල කරන හැන්දෙහි කහට බැඳී ඇතත් පිරිසිදු නොකර භාවිත කිරීම ඇතැමුන්ගේ සිරිත ය. පිඟාන වටේම කළුපාට හෝ කහපාට හෝ වෙනත් කුණු පාටක් දැකිය හැකි වෙයි. එබඳු පිඟානක කෝප්පයක මොන සුන්දරත්වයක් ද? එම භාණ්ඩ දකින අයට පවා ඇති වන්නේ පිළිකුලකි. අනෙක් අතට අපිරිසිදු භාජනවල විෂබීජ රැඳෙන නිසා ඒවා පරිහරණය කරන අය ලෙඩ රෝගවලට ද ගොදුරු විය හැකි ය. එබැවින් කුඩා කල සිට ම තමන් පරිහරණය කරන ඇඳ පුටු මේස ආදිය ද පිරිසිදුව තබා ගැනීමේ වගකීම නිරායාසයෙන්ම පැවැරෙන්නේ අපටම ය. එහිදී අංශ දෙකක් කෙරෙහි අවධානය යොමු විය යුතු ය. එකක් නම්, එම බඩු භාණ්ඩ අපිරිසිදු නොකිරීම යි. අනෙක, අපිරිසිදු වී ඇත්නම් පිරිසිදු කිරීම යි. ඇතැම්හු නිවසේ දී තමන් පරිහරණය කරන මේසය පාසලේ දී හෝ දහම් පාසලේ දී පරිහරණය කරන ඩෙස්කුව, බංකුව කුරුටු ගී ලියා හෝ චිත්‍ර ඇඳ හෝ අසභ්‍ය වචන ලියා හෝ අපිරිසිදු කරති. පෞද්ගලිකව ගෙදර දී පරිහරණය කරන මේසයෙහි පොත පත තබා ගන්නේ ද පිළිවෙළකට නොවේ, අපිළිවෙළට ය. අවශ්‍ය පොතක් සොයා ගැනීමට බොහෝ වේලාවක් ගත කිරීමට සිදු වේ. අපිළිවෙළ යනු අපිරිසිදුකමේ ම අංගයකි. පිළිවෙළකට කලාත්මකව මේසය මත පොතපත තබා ගැනීම පිරිසිදුකමේ ලක්ෂණයකි. ඇතැමුන් හිඳගැනීමට ඇති පුටුව මත පා තබා අපිරිසිදු කරන අතර ලිවීමට භාවිත කරන ඩෙස්කුව මත නැග අපිරිසිදු කරන්නෝ ද වෙති. එසේ කරන්නන් ප්‍රදර්ශනය කරන්නේ තමන්ගේ අශීලාචාරකම යි.

තමන්ගේ පෞද්ගලික පොතපත වේවා රජයෙන් නොමිලයේ ලැබෙන පාඨ ග්‍රන්ථ වේවා පිරිසිදුව තබා ගැනීම හැදෙන වැඩෙන දරුවන්ගේ ලක්ෂණය වේ. මෙම වසරේ තමන්ට ලැබෙන පෙළ පොත හැකිතාක් පිරිසිදුව භාවිත කර ඊළඟ වසරේ ශිෂ්‍යයකුට හෝ ශිෂ්‍යාවකට අළුත් පොතක් සේ භාරදීමට හැකිනම් මොන තරම් අගනේ ද? එහෙත් ඇතැම්හු අඩුතරමින් පිට කවරයක්වත් නොදා පෙළ පොත් පරිහරණය කරති. ඇතැම් විට ඇතුළත පිටුවල විවිධ දේ ලියති. පිටු ඉරීම විනෝදයක් කර ගනිති. බෑගයට පොත් ඇතුල් කරන්නේ කිසිදු සැලකිල්ලකින් නොවේ. ඇතැම්විට බසය එනතුරු හිඳගෙන සිටින්නේ පොත් බෑගය මත ය. පොතපතට ගරු කිරීම අපේ පුරාණ චාරිත්‍රයකි.

පොතපත අපිරිසිදු නොකරන්නේ එම ගෞරවය නිසා ය. ඉතා ලස්සන පිට කවර යොදා ඇතුළත පැන්සල් ඉරක්වත් නොයොදා පෙළපොත් පරිහරණය කරන හොඳ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ද සිටිති. ඔවුන් එමගින් ප්‍රදර්ශනය කරන්නේ තමන්ගේ ශීලාචාරකම යි.

හොඳ ශිෂ්‍යයෝ තමන් පරිහරණය කරන පොතපත වේවා වෙනත් භාණ්ඩ වේවා අපිරිසිදු නොකරති. අනුන් ලවා ද අපිරිසිදු නොකරවති. අපිරිසිදු කරන්නන්ගේ එම ක්‍රියාව අනුමත නොකරන අතර ඊට කිසිදු අනුබලයක් නොදෙති. එබඳු අය කරන්නේ කුමන උපකරණයක් හෝ පොතක් පතක් වේවා පිරිසිදුව පරිහරණය කරන ගමන් අන් අයද එසේ පරිහරණය කිරීමට පෙළඹවීම යි. ඔවුහු පිරිසිදුව භාණ්ඩ පරිහරණය කිරීමේ ආනිසංශ සහ අපිරිසිදු කිරීමේ ආදීනව අන්‍යයන්ට කියා දෙන්නෝ වෙති. එසේ කරන්නෝ කල්‍යාණ මිත්‍රයෝ ය.

ඇඳ, පුටු, මේස, ඩෙස්කු, බංකු, ඇඳඇතිරිලි, කොට්ට, කොට්ට උර, තුවා, දත්බුරුසු, සබන් පෙට්ටි, පාවහන්, ඇඳුම් පැළඳුම්, පොතපත ආදිය පිරිසිදුව තබා ගැනීමට පුරුදු වෙමු. අන් අයට ද එසේ තබා ගැනීමට අනුබල දීමෙන් ඔවුන්ගේ කල්‍යාණ මිත්‍රයෝ වෙමු. ප්‍රසන්න නීරෝගී සමාජයක හවුල්කරුවෝ වෙමු.

**ක්‍රියාකාරකම් :**

1. පිරිසිදුව භාණ්ඩ පරිහරණය කිරීමේ අගය පැහැදිලි කෙරෙන වාක්‍ය පහක් ලියන්න.

2. පිරිසිදුව පොතපත පරිහරණයට සිසුන් යොමු කෙරෙන ආදර්ශ පාඨ දෙක බැගින් ලියා ගුරුතුමාගේ උපදෙස් මත හොඳ ම ආදර්ශ පාඨ පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

3. ඔබ පරිහරණය කරන කුමන හෝ භාණ්ඩයක් අපිරිසිදු වී ඇත්නම් අද ම පිරිසිදු කරන්න.

## 12 පාඩම



# ධර්මාශෝක රාජ්‍ය යුගයේ ශාසනික වැදගත්කම

### ඓතිහාසික පසුබිම

භාරතීය ශාසන ඉතිහාසයේ කාලාශෝක රාජ්‍ය යුගයෙන් පසුව නැවතත් ශාසනික වශයෙන් වැදගත් යුගයක් උදාවන්නේ ධර්මාශෝක රාජ්‍ය යුගයේදීය. අශෝක රජතුමා ද මුල් අවධියේ උත්සාහ ගෙන ඇත්තේ තම අධිරාජ්‍යය පුළුල් කර ගැනීමට ය. අශෝක රාජ්‍ය පාලන

යුගය වන විට බුදු සසුනට උදා වෙමින් තිබුණේ විවිධ මතවාදයන්ගෙන් ගහන කාලයකි. බුදු දහමට එරෙහිව බ්‍රාහ්මණ බලය නැගී එන්නට විය. රාජානුග්‍රහය ද නොලැබුණ අතර පැවිදි පක්ෂයේත් වගකිවයුතු ප්‍රබල තෙරකෙනෙකුන් ද නොසිටිය බැවින් බුදුසසුනේ තත්ත්වය පහත වැටෙමින් පැවතිනි. වෙනත් කිසිම අවධියක නොපැවති අන්දමින් බුදුසසුන තුළ මතභේද වැඩි වී ගොස් භික්ෂුන් වහන්සේ විවිධ නිකායන්ට කැඩී යාමට පටන්ගෙන තිබිණි. කාලාශෝක රජුගෙන් ආරම්භ වී ධර්මාශෝක රජතුමාගෙන් අවසන් වන අවුරුදු සියයක් තරම් කාලය තුළ එසේ කැඩී ගිය නිකායයන් දහඅටක් වූ අන්දම ශාසන ඉතිහාසය තුළ දක්නට ලැබෙයි.

## අශෝක රජතුමාගේ ශාසනික මෙහෙය

ධර්මාශෝක අධිරාජයා බුදුසමය වැළඳ ගැනීමෙන් පසු බුදුසසුනට මහත් අනුග්‍රහයක් දැක්වීය. එතුමා දිනපතා හැටදහසක් භික්ෂුන්වහන්සේලා උදෙසා සංග්‍රහ කළ බවත්, අසූහාරදහසක් වෙහෙර විහාර ඉදිකළ බවත් මහාවංශයේ සඳහන් වේ. එමෙන්ම ධර්ම කථික භික්ෂුන්වහන්සේලාට ප්‍රණීත සිව්පස පූජාවන් ද පවත්වන ලද බවත් විස්තර වෙයි.

## සසුන කිලිටිවීම

බුදුසසුනට ධර්මාශෝක රජතුමාගෙන් අනුග්‍රහ ලැබෙන්නට වීමත් සමඟ අන්‍ය ආගමිකයන්ගේ තත්ත්වය ක්‍රමයෙන් පිරිහෙන්නට විය. ඔවුහු බුදුසසුනට එරෙහිව යම් යම් විරෝධතා වැඩසටහන් දියත් කළහ. ඇතැම් තීර්ථකයෝ ජීවිකාව සඳහා සසුන්ගත වූහ. ඔවුන්ගේ නොමනා හැසිරීම් නිසා බුදුසසුන කිලිටි වී ගියේ ය. ලාභ සත්කාර බලාපොරොත්තුවෙන් පැවිදි වූ පිරිසේ ක්‍රියා කලාපය නිසා බුදුසසුන අවුල් වී ගියේය. මේ හේතුන් නිසා භික්ෂුන් වහන්සේලාගේ වැදගත් විනය කර්මයක් වන පොහොය කිරීම ද නවතා දමන්නට සිදු විය.

## ශාසන සංශෝධනයක්

වසර හතකට පොහෝ කිරීම් සිදු නොවූ බව දැනගත් ධර්මාශෝක රජතුමා පොහොය කරන ලෙස දන්වා ඇමතිවරයකු මගින් භික්ෂුන්

වහන්සේලා වෙත පණිවුඩයක් යැවී ය. එහෙත් පිරිසෙහි පිරිසිදු බවක් නැති නිසා පොහොයකර්මය කළ නොහැකි බව භික්ෂූහු ඇමතියාට දැන්වූහ. රජඅණ කඩකිරීම නිසා ඇමතියා භික්ෂූන් කිහිප දෙනෙකු මරණයට පත් කළේය. එහෙත් එම වරදට තමා කොටස්කරුවකු නොවන බව මොග්ගලී පුත්ත තිස්ස තෙරුන් සමග ඇති වූ කථාබහකින් ධර්මාශෝක රජතුමා පැහැදිලි කරගත්තේ ය. රජතුමා සහ මොග්ගලීපුත්ත තිස්ස තෙරුන් අතර ඇති වූ මෙම මුණ ගැසීමේ දී සමකාලීන ශාසනික තත්ත්වය ගැනද රජතුමා වැටහීමක් ඇති කර ගත්තේ ය. තෙරණුවන්ගේ උපදෙස් පරිදි දුසිල් භික්ෂූන් සසුනින් බැහැර කොට ශාසනික සංශෝධනයක් කරවීමට රජතුමා සහාය දුන්නේ ය. අනතුරුව භික්ෂූහු විනය කර්මවල ද යෙදුණහ.

## ධර්ම සංගීතිය

ශාසනික සංශෝධනයෙන් පසුව ධර්මවිනය නැවතත් පිරිසිදුව පවත්වා ගැනීම සඳහා සංගායනාවක් කිරීමට ද රජතුමා තෙරණුවන්ට සහාය විය. ඒ අනුව රැස් වූ රහතන්වහන්සේලාගෙන් දහස් නමක් තෝරා ගෙන මොග්ගලී පුත්ත තිස්ස තෙරණුවන්ගේ ප්‍රධානත්වයෙන් පැළලුප් නුවර අශෝකාරාමයේ දී ත්‍රිපිටක සංගායනාව සිදු කළහ. මෙම සංගීතියේ දී මොග්ගලී පුත්ත තිස්ස තෙරණුවෝ, පරවාදී මත පන්සියයක් ඛණ්ඩනය කරමින් ද, සකවාදී මත පන්සියයක් උද්දීපනය කරමින් ද කථාවත්ථු ප්‍රකරණය නම් ග්‍රන්ථයක් ඉදිරිපත් කළහ. එම ග්‍රන්ථය නිසා භික්ෂූන් අතර පැවති විපරීත මත බැහැර වූ බවත් අභිධර්ම පිටකය සප්ත ප්‍රකරණයකින් යුතුව සම්පූර්ණ වූ බවත් විශ්වාස කෙරේ. ථෙරවාදී ත්‍රිපිටකය සම්පූර්ණ වූයේ ද මෙහිදී ය. බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙසිය දහඅටකට පසුව මෙම තුන්වන සංගීතිය සිදු වී ඇත. සංගායනාව සඳහා නව මසක් ගතවූ බවද සඳහන් වෙයි.

## සංගීතියේ ප්‍රතිඵල

කථාවත්ථුප්පකරණය සම්පාදනය වීමෙන් අභිධර්ම පිටකය සප්ත ප්‍රකරණයෙන් යුතුව සම්පූර්ණ විය. ඒ අනුව ථෙරවාදි පාලි ත්‍රිපිටකය

සම්පූර්ණ වූයේ ද මෙම තෙවන ධර්ම සංගීතියේදී ය. භාරතය තුළත් ඉන් පිටස්තර ප්‍රදේශවලත් බුදුදහම ව්‍යාප්ත කිරීම සඳහා ධර්මදූත සේවාවක් ආරම්භ විය.

ධර්මාශෝක රජතුමාගේ අනුග්‍රහයෙන් ආරම්භ වූ ධර්මදූත සේවාවේ අනුශාසකත්වය දැරුයේ මොග්ගලීපුත්ත තිස්ස මහරහතන්වහන්සේ ය. බුදුදහම එහි ජන්මභූමිය වූ භාරතයෙන් අතුරුදන් වූවාට පසුවත් ලංකා, සියම, බුරුම ආදී රටවල ආරක්ෂා විය. මෙම ධර්මදූත සේවාවේ කාලෝචිත බවත් දූරදර්ශී බවත් පෙනීයන්නේ මේ පිළිබඳව සලකා බලන විටය. විශේෂයෙන්ම ලංකාවේ ධර්මප්‍රචාරය නිසා ථෙරවාදී බුදුසමය ආරක්ෂා වී පවතී.

### ධර්ම ප්‍රචාරක සේවාව

තෙවන ධර්ම සංගීතියේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ ධර්ම ප්‍රචාරක සේවාව අනුව ප්‍රදේශ නවයකට ධර්මදූතයෝ නික්ම ගියහ. ඒ හැම ධර්මදූත කණ්ඩායමක් ම ප්‍රබල තෙරනමකගේ නායකත්වය යටතේ පස්නම බැගින් පිටත් කර හැරියහ. පහත දැක්වෙන්නේ එම රටවල් හා නායකත්වය දැරූ තෙරවරුන්ය.

| *රට* | *ප්‍රධානත්වය* |
| --- | --- |
| 01. කාශ්මීර ගන්ධාර (වයඹ දිග ඉන්දියාවේ ප්‍රදේශ දෙකකි) | මජ්ඣන්තික තෙරණුවෝ |
| 02. මහිසමණ්ඩලය (වින්ධ්‍යා කඳුවැටියෙන් දකුණු දිග පෙදෙසකි) | මහාදේව තෙරණුවෝ |
| 03. වනවාස දේශය (දකුණුදිග ඉන්දියාවේ උතුරු කනාරා පෙදෙස) | රක්ඛිත තෙරණුවෝ |

04. අපරන්ත දේශය

(ඇල්ලෝරා, භරුකච්ච සුප්පාරක ආදිය

ඇතුළත් බටහිර පෙදෙස) — යෝනක ධම්මරක්ඛිත තෙරණුවෝ

05. මහාරට්ඨය (මහාරාෂ්ට්‍ර) — මහා ධම්මරක්ඛිත තෙරණුවෝ

06. යෝනක දේශය

(ග්‍රීසිය හා ඒ අවට ප්‍රදේශය) — මහාරක්ඛිත තෙරණුවෝ

07. සුවණ්ණ භූමිය

(බුරුමය ලෙසද ඉන්දියාවේ — සෝණක හා උත්තර

නැගෙනහිර ලෙසද සැලකේ) — තෙරණුවෝ

08. හිමවන්ත ප්‍රදේශය — මජ්ඣිම තෙරණුවෝ

09. තම්බ පණ්ණි දීප (ශ්‍රී ලංකාව) — මහා මහින්ද තෙරණුවෝ

ධර්මාශෝක රජතුමාගේ අනුග්‍රහයෙන්, මොග්ගලී පුත්ත තිස්ස තෙරණුවන්ගේ අනුශාසකත්ත්වයෙන් සිදු වූ මෙම ධර්ම ප්‍රචාරක සේවාව වංශකථාවල හා වෙනත් වාර්තාවල ද සඳහන් වේ. මෙම ධර්මදූත සේවාව ඓතිහාසික වශයෙන් ද සනාථ වී තිබේ. විශේෂයෙන්ම සාංචියෙන් හමු වී ඇති අංක 2 දරන ස්තූපයේ කරඬුවක මෙම ධර්මදූත සේවාවේ නිරත වූ තෙරවරුන් කිහිප නමකගේ නම් හා ප්‍රදේශ සටහන් වී ඇත. ශ්‍රී ලංකාවෙන් හමු වී ඇති ශිලා ලිපියක ද **මහිද තෙරහ ච, භද්‍රසාල තෙරහ ච** යනුවෙන් මිහිඳුහිමියන් ඇතුළු ධර්මදූත වරුන් හැඳිනගෙන ඇත.

මේ හැරුණු විට සාංචි කැටයමක ද ශ්‍රී ලංකාවට බුදුසමය රැගෙන ඒමේ පුවත නිරූපණය වන බව පුරාවිද්‍යාඥයින්ගේ පිළිගැනීම යි.

**ක්‍රියාකාරකම් :**

ධර්මාශෝක රාජ්‍ය සමයේ ශාසනික වැදගත්කම ප්‍රකට කෙරෙන සිද්ධි ඇසුරෙන් සටහනක් ලියන්න.

# 13 පාඩම

## දළදා හාමුදුරුවෝ



ජීවමාන බුදුරජාණන් වහන්සේ හා සමාන කොට සලකමින් ඉතා ගෞරවයෙන් අප වැඳුම් පිදුම් කරන පූජ්‍ය වස්තු දෙකක් අප රට සතුව පවතී. ඒ අනුරාධපුරයෙහි වැඩසිටින විජය ශ්‍රී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ සහ මහනුවර ශ්‍රී දළදා මාලිගාවෙහි වැඩ සිටින දළදා වහන්සේ යි. එම පූජ්‍ය වස්තු දෙක කෙරෙහි අප තුළ ඇති අපමණ ගෞරවය නිසාම ජයසිරිමා හාමුදුරුවෝ, දළදා හාමුදුරුවෝ යනුවෙන් හැඳින්වීමට අපි පුරුදුවී සිටිමු. ඒ දෙනමගෙන් දළදා හාමුදුරුවෝ අපේ රටට වැඩම කර තිබෙන්නේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වසර 856ක් වෙද්දීය. එනම් ව්‍යවහාර වර්ෂයෙන් සතරවන ශතවර්ෂයේ මුල භාගයේ ය. එකල ලක්දිව පාලකයා වූයේ කීර්ති ශ්‍රී මේඝවර්ණ හෙවත් කිත්සිරි මෙවන් රජතුමන්ය.

දාඨා වංශය, දළදා පූජාවලිය වැනි පොත්වල දළදා ඉතිහාසය සඳහන් වෙයි. ඒ අනුව උතුම් බුදු සිරුර සඳුන් දර සෑයේ ආදාහනය වෙද්දී ම ඛේම නම් මහරහතන් වහන්සේ විසින් අපේ දළදා

හාමුදුරුවෝ සෑයෙන් ඉවත් කර ගෙන ඇත. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙහි පිහිටි ප්‍රධාන දත් සතරින් වම් පස පිහිටි එකක් නිසා අපේ දළදා වහන්සේ හැඳින්වීමේදී වාම දළදා, වම් දළදා වහන්සේ යන යෙදුම් ද භාවිත වෙයි.

ඛේම රහතන් වහන්සේ විසින් අපේ දළදා හාමුදුරුවන් ආරක්ෂා කර ගනිමින් වැඳුම් පිදුම් කිරීමට මුලින් ම භාරදී තිබෙන්නේ කලිඟු රට බ්‍රහ්මදත්ත නම් රජතුමාට ය. එම පරපුරේ රජුන් විසින් විවිධ බාධක මැද ආරක්ෂා කර ගන්නා ලද අපේ දළදා හාමුදුරුවන් ලක්දිවට වැඩමවීමට පෙර අවසන් වරට භාරකාරත්වය දැරූයේ ගුහසීව නම් රජතුමන්ය. එම රජු විසින් දළදා වහන්සේ ආරක්ෂා කර ගැනීමේ වගකීම දන්ත කුමරුට පවරනු ලැබ තිබිණි. දන්ත කුමරු යනු ගුහසීව රජුගේ දියණිය වන හේමමාලා කුමරියගේ සැමියා ය.

අසල්වැසි රජකුගේ සේනාවක් දළදා වහන්සේ අත්කර ගැනීම සඳහා ගුහසීව රජු සමඟ සටන් කිරීමට පැමිණි අතර රජතුමන්ගේ උපදෙස් මත දන්ත කුමාරයා සහ හේමමාලාවන් විසින් දළදා වහන්සේ ලක්බිමට වැඩම කරවනු ලැබූහ. ආරක්ෂක හේතු මත ඔවුන් පැමිණියේ බමුණු යුවලක් ලෙස වෙස්වලාගෙන ය.

දන්ත කුමරු හේමමාලා යුවල විසින් මේඝගිරි විහාරයට වැඩමවන ලද දළදා හාමුදුරුවන් ගෞරවයෙන් පිළිගත් කිත්සිරි මෙවන් රජු උන්වහන්සේ අනුරාධපුරයෙහි අභයුත්තර විහාරයෙහි වඩා හිඳුවා මහත් පුද සත්කාර කළේය. එම රජු අනුගමනය කළ පසුකාලීන සෑදැහැති රජවරු මහනුවර රාජධානි සමය තෙක්ම දළදා වහන්සේ රැක බලා ගනිමින් පුදසිරිත් පැවැත්වූහ.

පසු කාලීනව ලක්දිව රාජ්‍ය උරුමයේ සංකේතය බවට පත්වූයේ දළදා වහන්සේ ය. ඒ අනුව රාජ්‍ය බලය හිමිවිය යුත්තේ දළදා වහන්සේ අයත්කර ගෙන රැක බලා ගන්නා තැනැත්තාටය යන අදහස ගොඩනැගී තිබිණි. ඒ නිසා ම දළදා වහන්සේ ජාතික වස්තුවක් බවට පත්වූහ. ඇතැම් විදේශීය ආක්‍රමණිකයන් දළදා වහන්සේ පැහැර ගත්තේ ද එය ජාතික වස්තුවක් ලෙස සැලකුණු හෙයිනි. සොලීන් විසින් පැහැරගෙන යන ලද දළදා වහන්සේ යළි අත්පත් කර ගැනීම සඳහා දෙවන ගජබා රජුට යුද වැදීමට සිදුවිය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය

සම්බන්ධයෙන් අරගල හටගත් අවස්ථාවන්හි දළදා වහන්සේ තමන් සතුකර ගැනීමට ප්‍රයත්න දරා තිබෙන්නේ ද එය රාජ්‍ය උරුමයේ සංකේතය වූ බැවිනි. රාජ මාළිගාව අසල ම දළදා මාළිගාව ද සාදා ආරක්ෂාව සලසමින් සිරිත් කඩ නොකර පුද පූජා පැවැත්වීම රජවරුන් විසින් කරන ලදී.

දළදා වහන්සේ මහනුවරට වැඩමවා ගත්තේ පළමු විමලධර්ම සූරිය රජුය. මහනුවර දළදා මාළිගාව ගොඩනංවනු ලැබුවේද එතුමන් විසිනි. එම මාළිගාව සංවර්ධනය කරවූයේ දෙවන විමලධර්ම සූරිය සහ කීර්ති ශ්‍රී රාජසිංහ රජවරුන් විසිනි. මහනුවර ඇසළ පෙරහැරට දළදා පෙරහැර එක්වූයේ කීර්ති ශ්‍රී රාජසිංහ සමයේ ය.

යුරෝපීය ජාතිකයන් කන්ද උඩරට ආක්‍රමණය කළ අවස්ථාවන්හි දළදා වහන්සේ ආරක්ෂා කරගන්නා ලද්දේ මහනුවරින් බැහැර ප්‍රදේශයන්හි සඟවා තැබීමෙනි. කන්ද උඩරට රාජ්‍යය ද ඉංග්‍රීසි පාලනයට පැවරුණු කල්හි 1815 අප්‍රේල් 25 දින සියලු ම පුරාණ චාරිත්‍ර විධි සහිතව දළදා හාමුදුරුවන් මහනුවර දළදා මාලිගාවෙහි තැන්පත් කෙරිණි.

පර සතුරන්ගෙන් දළදා හාමුදුරුවන් ආරක්ෂා කර ගැනීමට අපේ හාමුදුරුවරුන්ට ද මහත් වෙහෙසක් දැරීමට සිදුවිය. ඒ අතර වාරියපොළ ශ්‍රී සුමංගල ස්වාමීන් වහන්සේට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. උන්වහන්සේ අත් අඩංගුවට පත්වීමෙන් අනතුරුව දළදා වහන්සේ යළිත් මහනුවර දළදා මාලිගාවෙහි තැන්පත් කෙරුණු අතර පසු කාලයේ මල්වතු අස්ගිරි මහනාහිමිවරුන්ගේ සහ දියවඩන නිලමේගේ භාරකාරත්වයට පත් කරන ලදහ.

රටට විපත් පැමිණෙන අවස්ථාවන්හි දළදා හාමුදුරුවන් විශේෂ මණ්ඩපයකට වැඩමවා පුද පූජා පැවැත්වීම සිරිතක්ව පවතී. රටේ වැදගත් තනතුරුවලට පත්වන බෞද්ධයෝ දළදා වහන්සේගේ ආශිර්වාද ලබා ගනිති. මහනුවරට ආසන්න ප්‍රදේශවල බොහෝ බෞද්ධ දරුවෝ සිය උපන්දිනය වෙනුවෙන් දළදා මාළිගාවට ගොස් ආශිර්වාද ලබා ගනිති.

බුද්ධ පරිනිර්වාණයෙන් නවවන ශතවර්ෂයේ මැද භාගයේ සිට ලංකා වංශකතාව පුරාම සඳහන්වන ඉතිහාසයක් ඇති දළදා හාමුදුරුවන් නිසා ලංකා රාජ්‍ය පාලනය නව මගකට යොමු විය. දාඨාවංශ, දළදා සිරිත, දළදා පූජාවලිය ආදී ග්‍රන්ථ එකතුවීමෙන් ලංකා සාහිත්‍යය පෝෂණය වූ අතර දළදා පෙරහැර, දළදා පුදසිරිත් ආදිය නිසා සංස්කෘතික පෝෂණයක් ද විය.

අපේ සැදැහැ වඩවන ප්‍රධාන පුණ්‍ය භූමිය බවට අද දළදා මාලිගාව පත්ව ඇත. එහි වැඩසිටින දළදා හාමුදුරුවන්ට අප වැඳුම් පිදුම් කරන්නේ ජීවමාන බුදුරජාණන් වහන්සේට කෙරෙන වැඳුම් පිදුම් ලෙස සලකා ගෙනය. දළදා හාමුදුරුවන් සහ උන්වහන්සේ ඇසුරින් ගොඩනැගී ඇති සංස්කෘතිය අගය කිරීම හා රැක ගැනීමත් බෞද්ධයන් සතු වගකීමකි. එම වගකීමෙන් කොටසක් දහම් පාසල් දරුවන්ටද පැවරී ඇත.

**ක්‍රියාකාරකම:**

1. "දළදා වහන්සේ අපට ලැබුණ හැටි" යන මැයෙන් ලිපියක් ලිවීමට ඔබට සිදු වුවහොත් එයට ඇතුළත් කෙරෙන කරුණු සාරාංශකර දක්වන්න.

පැවරුම:

1. දළදා වන්දනාව සඳහා භාවිතාවන ගාථා සොයා දැනගෙන පැමිණ පන්තිය ඉදිරියේ ගායනා කරන්න.

පුහුණුවට:

ලොව විහිදා සුදු පැහැ සඳ රැසෙව් සැදී
දෙන නොමදා සිරි සගමොක් සැප නිසැදී
ලද මුනිදා දම්කඳ පහස මන බැඳී
වඳු දළදා හිමි තෙමහල් පහය රැඳී
(සැළලිහිණි සංදේශය)

බුදු මුව දහම් ජලයෙහි රජ හසකු වුණ
දනමන උපුල් පුබුදන සඳ මඬල වන
අඩසඳ ලෙසින් බැබලෙන අති නිමල වුණ
නමදිමි එවම් දළදා බුදු සමිදු මෙන

# 14 වන පාඩම

## අපේ ගෙදර දානමය පින්කම



අප්පච්චි මාත් සමඟ එදා පන්සලට ගියේ අපේ ආච්චි අම්මාගේ තුන්මාසේ පින්කමට ආරාධනා කිරීම සඳහා යි. අප විහාරස්ථානයට ළඟා වන විට ලොකු හාමුදුරුවන් වහන්සේ වැඩ සිටියේ විහාර මළුව අමදිමින් ය. රැගෙන ගිය පූජා භාණ්ඩ සංඝාවාසයෙහි තැබූ අප්පච්චි "යං පුතේ අපිත් මළුවක් අමදිමු" යි කියමින් මා සමඟ ගියේ සෑ මළුවට ය. සෑ මළුවත් බෝ මළුවත් ඇමඳ අප සංඝාවාසයට එන විට ලොකු ස්වාමීන් වහන්සේ ද මළුපෙත් මං ඇමඳ කුටියට වැඩම කර සිටියහ. ගිලන්පස සඳහා රැගෙන ගිය පූජා භාණ්ඩ බත්දේසියක තැන්පත් කළ අප්පච්චි දැහැත් වට්ටිය පිළියෙල කර ලොකු ස්වාමීන් වහන්සේට පිළිගැන්වූයේ මා අතින් ය. "දරුවන්ට කුඩා කාලයේ සිටම මේ සිරිත් හුරු කරවන එක බොහෝම හොඳයි" පවසමින් ය ලොකු ස්වාමීන් වහන්සේ දැහැත් වට්ටිය පිළිගත්තේ. උන් වහන්සේට පසඟ පිහිටුවා වන්දනා කළ අප අසළ තිබුණු පැදුර එලා වාඩි වුණේ ස්වාමීන් වහන්සේගෙන් අවසර ලැබුණු පරිදිය.

"ලොකු හාමිනේගේ පින්කම ගැන වෙන්න ඇති නේද මහත්තයෝ" යි විමසූ ස්වාමින්වහන්සේට අප්පච්චි පිළිවදන් දුන්නේ "එහෙයි අපෙ හාමුදුරුවනේ" යි පවසමිනි. ස්වාමින් වහන්සේලා පසළොස් නමක් ඉදිරියේ සපිරිකර සංඝගත දක්ෂිණාවක් පිරිනැමීමටත් ඊට පෙරදින රාත්‍රියෙහි ධර්මදේශනාවක් පැවැත්වීමටත් දින නියම කරගෙන ආපසු නිවස බලා අප පිටත් වූයේ යළිත් වරක් ස්වාමින් වහන්සේට පසඟ පිහිටුවා වන්දනා කිරීමෙන් අනතුරුව ය.

නියමිත දින ධර්මදේශනාවට වැඩම කළ ස්වාමින් වහන්සේගේ පා ධෝවනය කිරීමෙන් අනතුරුව උන් වහන්සේ ධර්මාසනය වෙත වැඩමවනු ලැබුයේ නිවසේ දොරටුව ලඟ සිට එලන ලද පියවිලියක් නොහොත් පාවාඩයක් මතය. ධර්මාසනයට සුදු පිරුවටයක් එළා තිබිණි. අප්පච්චි ආරාධනා දැහැත්වට්ටිය පිළිගැන්විය. ධර්ම ශ්‍රවණයට විශාල පිරිසක් සහභාගි විය. ස්වාමින් වහන්සේට ධර්ම පූජාව පිළිගන්වනු ලැබූයේ අපේ අම්මා විසිනි. පසු දින හීල දානය පන්සලට ගෙන ගිය පිරිස සමඟ මම ද ගියෙමි. අම්මාත් අක්කාත් බුදු මැදුරේ මල් ආසනය පිරිසිදුකර බිම අමදින අතරතුර මෙම මල්බඳුන පිළියෙලකර පැන් ඉස පූජාවට සූදානම් කෙළෙමි. බුද්ධ පූජාවෙන් අනතුරුව දානශාලාවට පැමිණි අපට ස්වාමින් වහන්සේ පුණ්‍යානුමෝදනා කළහ.

මේ පින්කමේ ප්‍රධාන අවස්ථාව දහවල් දානය යි. සධාතුක කරඬුව පෙරටු කරගත් මහා සංඝරත්නය වැඩම කරවූ පෙරහැර නිවසට ළඟා වන විට පෙරවරු 11.00 වී තිබිණි. වතාවත් කිරීමෙන් අනතුරුව බුද්ධාසනය මත ධාතු කරඬුව තැන්පත්කර දෙපස පිළියෙල කරන ලද අසුන්වල මහා සංඝරත්නය වඩා හිඳුවන ලදී. ලොකු ස්වාමින් වහන්සේගෙන් අවසර ලැබුණු පිළිවෙළට රැස්ව සිටි පිරිසට අතගැස්වූ බුද්ධ පූජාව ධාතු චෛත්‍යය ඉදිරියේ තැන්පත් කිරීමෙන් අනතුරුව පිරිස පන්සිල්හි පිහිටවනු ලැබූයේ ථෙරාසනයෙහි වැඩසිටි නායක ස්වාමීන් වහන්සේ විසිනි. පින්කමේ අරමුණ අගය කරමින් සහ ප්‍රාප්ති දානමය පින්කමක් මහත් ඵල මහානිසංස වන ආකාරය පැහැදිලි කරමින් කෙටි අනුශාසනාවක් කළ පණ්ඩිත හාමුදුරුවෝ වන්දනා හා බුද්ධ පූජා ගාථා කියවූහ. දානය සඟසතු කිරීමේ වාක්‍යය ප්‍රකාශ කරවූයේ ඉන් අනතුරුවය. කෙටි අනුමෝදනාවෙන් පසු දන් පිළිගැන්වීමේ වතාවත් ආරම්භ විය.

මුලින්ම පිළිගැන්වූයේ ඇල් පැන්ය. ඒ, අත සහ පාත්‍රය ධෝවනය කර ගැනීම සඳහා ය. දානය වළඳන අතරතුර උණු පැන් අවශ්‍ය ස්වාමීන් වහන්සේට උණුපැන් පිළිගන්වන ලදී. පිළිගන්වන ලද අවුලුපත් වැළඳුයේ ස්වාමීන් වහන්සේලා කීප නමක් පමණකි. පළතුරු නම් සෑමදෙනා මහත්සේ ම පාහේ වළඳනු දක්නට ලැබිණි. දැහැත් වට්ටිය සහ දැහැටි දඬු පිළිගැන්වූයේ අටපිරිකර සහ සෙසු පිරිකර පූජා කිරීමට පෙරය. පිරිකර පූජා කිරීමෙන් අනතුරුව බණ දේශනාවක් අසන්නට ලැබිණි. ඒ බණ හඳුන්වනු ලබන්නේ "භුත්තානුමෝදනාව" කියා යැයි පසුව දැනගත්තේ සීයාගෙන් ය.

අනුමෝදනා ධර්ම දේශනාවේදී හෙවත් අනුමෙවනි බණේදී, දන් පිළිගැන් වූ පිරිස වතාවත් සිදු කළ ආකාරය සහ ශාසනික වචන භාවිත කළ ආකාරය අගය කෙරිණි. "ස්වාමීන් වහන්සේලා බත් කන්නේ නැත, දානය වළඳනවා, ස්වාමීන් වහන්සේලා වතුර බොන්නේ නැත, පැන් වළඳනවා, තේ බොන්නේ නැත, ගිලන්පස වළඳනවා, ස්වාමීන් වහන්සේලාගේ පාත්‍රයට ව්‍යඤ්ජන ටිකක් දාන්නේ නැත, පිළිගන්වනවා, ස්වාමීන් වහන්සේලාට පිරිකර දෙන්නේ නැත, පූජා කරනවා, බුද්ධ පූජාව තියනවා නොවෙයි පූජා කරනවා. මේ දාන ශාලාවේ එහෙම නොගැලපෙන වචන පාවිච්චි වුනේ නැහැ. ඒක අප බොහෝම අගය කරනවා. එසේ ප්‍රකාශ කළේ අනුමෙවෙණි බණ දේශනා කළ ස්වාමීන් වහන්සේ විසිනි. ඒ බණ අවසානයේ සිදු වූයේ පැන් වඩා ආච්චි අම්මා ඇතුළු මියගිය ඥාතීන්ට පින්පෙත් අනුමෝදන් කිරීම යි. අවසානයේ සෙත් පිරිත් සජ්ඣායනාකර අපට ආශිර්වාද කළ ස්වාමීන් වහන්සේලාට වැඳ අවසර ගතිමු.

"අපේ හාමුදුරුවනේ අපෙන් අඩුපාඩුවක් හෙම වුනානම් සමාවෙන්න හොඳයි" ඒ අප්පච්චිගේ වචන යි.

**ක්‍රියාකාරකම**

1. මේ පාඩමෙන් ඔබ ඉගෙන ගත් ශාසනික වචන ලියා දක්වන්න.
2. ඔබ ලියා දැක්වූ වචනවලින් 5ක් තෝරාගෙන ඒවායේ අර්ථ පැහැදිලි වන පරිදි වාක්‍ය 5ක් ලියන්න.

# 15 වන පාඩම

## ප්‍රථම රහත් තෙරණිය

'සාරවත් හර ඇති මහරුක තිබියදී එහි විශාල කඳ වෙනස්වීම් හේතුවෙන් විනාශ වේද එලෙස භික්ෂුනීන් වහන්සේලාගේ ප්‍රධාන කඳ වූ ගෞතමීන් වහන්සේ පිරිනිවිණි. අහෝ ආශ්චර්යයෙකි. සිරුර පමණක් ඉතිරිකර මව පිරිනිවන් පෑ කල්හි මට ශෝක වැළපීම් ඇති නොවේ. මහණෙනි තරණය කළ සසර සයුර ඇති, දුරු කළ ශෝකහුල් ඇති ප්‍රජාපතී ගෝතමීන් වහන්සේ පණ්ඩිතය. මහ මුහුද සේ ගැඹුරු නුවණ ඇත්තීය. පැතුරුණු නුවණ ඇත්තීය. "මෙහෙණින් වහන්සේලා අතර පැවිදිව බොහෝකල් ඇත්තීය".

බුදු පියාණන් වහන්සේ මෙසේ වදාළේ පිරිනිවන් වැඩි බුදුමවගේ දේහය ආදාහනයකර ලබාගත් ධාතූන් වහන්සේලා පාත්‍රයක තැන්පත් කර අනඳ හිමියන් තමන් වහන්සේට පිළිගැන්වූ අවස්ථාවේදීය. එදා එලෙස ගරු බුහුමනට ලක් වූ මහා ප්‍රජාපතී ගෝතමී රහත් මෙහෙණින් වහන්සේගේ චරිත කථාවයි මේ.

### ජන්මලාභය හා ගිහිජීවිතය

අපගේ බුදුරජාණන් වහන්සේ මෙලොව පහළ වීමට පෙර දඹදිව දෙව්දහ නුවර අඤ්ජන රජුගේ සහ යසෝදරා දේවියගේ දියණියක ලෙස මෙතුමිය උපත ලැබුවා ය. උපතින් ගෝතමී නම් ලද මැයගේ වැඩිමහල් සොහොයුරිය වූයේ, සුද්ධෝදන රජතුමාගේ අගබිසව වූ මහාමායා දේවිය යි. සිදුහත් කුමරුවාණන් ඉපිද දින සතකින් මහාමායා දේවිය කළුරිය කළාය. සුදොවුන් රජුගේ අග මෙහෙසිය බවට ප්‍රජාපතී ගෝතමී දේවිය පත් වන්නේ ඉන් පසුවය. එවකට තමන්ගේ ම පුතණුවන් වූ නන්ද කුමරු කිරි මව්වරුන්ට පවරා සිදුහත් පුතණුවන් තමා විසින් ම කිරි පොවා ඇති දැඩි කළාය. මෙලෙස පෝෂණය කිරීමෙන් ඕතොමෝ මවකගෙන් දරුවෙකුට ලැබිය යුතු සෙනෙහස සහ ආදරය ලබා දුන්නාය. අධ්‍යාපන අවශ්‍යතා ද සපුරා දුනි.

ඇය අපේක්ෂා කළේ සිදුහත් පුතු රජවනු දැකීමටය. එනමුදු ඇය අතිශය සතුටට පත්වූයේ සිදුහත් පුතණුවන් සම්බුදු පදවිලත් පුවත ඇසීමෙනි. "බුද්ධ මාතා" යන ගෞරව නාමයෙන් ප්‍රජාපතී ගෝතමී දේවිය හැඳින් වූයේ මෙතැන් සිටය.

## බුදුමගට පිවිසෙයි

බුදුරජාණන් වහන්සේ බුදුබව ලබා පළමුවරට කිඹුල්වත් නුවරට වැඩම කර සුදොවුන් රජුට වදාළ දහම් අසා මහා ප්‍රජාපතී ගෝතමී දේවිය සෝවන් වූවාය. සිය පුත් නන්ද කුමාරයා පැවදිවීමත් සුදොවුන් රජතුමා රහත් ව පිරිනිවන් පෑමත් නිසා එතුමියගේ සිත පැවිද්දට යොමු විය.

## සුවිශේෂ චීවර පූජාවක්

දිනක් මහා ප්‍රජාපතී ගෝතමී දේවිය තමා විසින්ම සකස් කළ චීවර දෙකක් බුදුරජාණන් වහන්සේට පිළිගැන්වූවාය. එවිට බුදුරජාණන් වහන්සේ වදාළේ ගෞතමිය චීවර සඟරුවනට පූජා කරන්න. එසේ කළ විට මට ද පූජාකළා වෙයි කියායි. යමක් පෞද්ගලික ව පූජා කරනවාට වඩා සඟ සතුව පිදීම උසස් බව මෙයින් භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දුන්හ. එම නියමය එතුමිය පිළිගත්තේ තමා තුළ පවතින අනතිමානී ගුණය ප්‍රකට කරමිනි.

## අරහත් ධජයට හිමිකම් ලබයි

රෝහිණී නදියේ ජලය නිසා ශාක්‍ය කෝලිය දෙපිරිස අතර හටගත් ගැටුම බුදුරජාණන් වහන්සේ සන්සිඳවූ සේක. ඉන් පසු ශාක්‍ය කුමාර වරු පන්සියයක් උන්වහන්සේ වෙතින් පැවිද්ද ලබා ගත්හ. කුමාරවරු පැවිදි වූ නිසා කුමාරිකාවන්ට ද මහණ වීමේ කැමැත්ත ඇති වී ඒ බව ප්‍රජාපතී ගෝතමී දේවියට දැන්වූහ. එතුමිය තමන්ටත් එම කුමාරිකාවන්ටත් පැවිද්ද ලබා දෙන ලෙස බුදුරජාණන් වහන්සේට ආරාධනා කළාය. එහෙත් ඇයගේ ආයාචනය බුදුරජාණන් වහන්සේ තුන් විටක් ම ප්‍රතික්ෂේප කළහ. යහපත් එඩිතර කාන්තාවක් ලෙස ඇය ඒ පිළිබඳව පසුබට නොවී තව තවත් දිරිය විරිය ලැබුවාය.

පසු කලෙක මහා ප්‍රජාපතී ගෝතමී ශාක්‍ය කුමාරිකාවන් සමඟ හිසකෙස් කපා කසාවත් හැඳ විශාලා මහනුවර කූටාගාර ශාලාව ළඟට පැමිණියාය. දුර සිට පැමිණි නිසා ඉදිමුණු පයින් දූවිලි රැඳුන ගතින් යුතුව එතුමිය හඬා වැළපෙනු අනඳ හිමියෝ දුටහ. ඇය ළඟට වැඩම කළ අනඳ හිමියෝ "ගෞතමීයෙනි, කුමක් නිසා විඩාවට පත්ව අඬන්නේ දැ''යි විමසූහ. "අනඳ හිමියනි භාග්‍යවතුන් වහන්සේ කාන්තාවට මහණ වීමට අවසර නොදෙන සේක" යි එතුමිය ප්‍රකාශ කළා ය. "ගෞතමීයෙනි, ඔතැනම ඉන්න මම බුදුරජාණන් වහන්සේගෙන් එම අවසරය ඉල්ලා සිටින්නම්" එසේ පැවසූ අනඳ තෙරුන් සියලු පුවත් බුදුරජාණන් වහන්සේට දැන් වූවද කාන්තා පැවිද්ද තෙවරක්ම උන්වහන්සේ ප්‍රතික්ෂප කළහ.

අනතුරුව බුදුරජාණන් වහන්සේගෙන් ආනන්ද තෙරණුවන් විමසුවේ කාන්තාවට පැවිදිව මග ඵල නිවන් ලද හැකිද යන්න යි. වීර්ය සම්පන්නව විදසුන් වඩන කාන්තාවට මග ඵල නිවන් ලද හැකිබව උන්වහන්සේ වදාළහ. එසේ නම් ස්වාමිනි, මහා ප්‍රජාපතී ගෝතමිය ඔබ වහන්සේට බොහෝ උපකාර කළ සුළු මෑනියන් ය. හැදූවැඩූ අම්මා ය, කිරිදුන් මාතාව ය, මව වියෝවූ පසු දෙතනයෙන් කිරිපෙව් මෑණියන් වහන්සේ ය, ස්වාමිනි ගිහි ගෙයින් නික්ම කාන්තාව තථාගත සසුනෙහි පැවිද්ද ලබන්නී නම් මැනවැයි අනඳ තෙරනුවෝ ප්‍රකාශ කළහ. එවිට බුදුහාමුදුරුවන් වදාළේ ආනන්දය මහා ප්‍රජාපතී ගෝතමිය ගරු දහම් අට පිළිගන්නී නම් එය ම ඇයගේ උපසම්පදාව වන බවයි.

අනඳ මාහිමියෝ එම අෂ්ඨ ගරු ධර්ම බුද්ධමාතාවන්ට දැන්වූහ. එවිට ඇය "ස්වාමිනි, අලංකාරයට කැමති තැනැත්තකු උපුල්, දෑසමන් ආදියෙන් කළ මල් කළඹක් ලැබ දෑතින් ම එය ගෙන හිසෙහි පළඳින්නාක් මෙන් මම ද එම අෂ්ට ගරු ධර්ම හිස මුදුනින් පිළිගනිමියි දන්වා සිටියාය. ඒ පිළිගැනීම ම ඇයගේ මහණ උපසම්පදාව විය. සෙසු අය පසුව මහණ උපසම්පදාව ලදහ. කෙටි කලකින් ම ප්‍රජාපතී තෙරණියෝ රහත්වූහ.

**අග තනතුරකින් පිදුම් ලබයි.**

ගිහි කල "බුද්ධ මාතා" නමින් ජනාදරයට පත් මහා ප්‍රජාපතී ගෝතමී තෙරණින් වහන්සේ බුදු සසුන ගැන දිගු කාලීන තොරතුරු

දත් තෙරණිය ලෙස අග තනතුර ලැබූවාය. මෙම පදවිය ලද්දේ පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ දවස කළ ප්‍රාර්ථනාවක් අනුවය.

**පිරිනිවීම**

මෙවන් විරල පදවිලත් නිහතමානී ගුණයෙන් අනූන වූ මහා ප්‍රජාපතී ගෝතමී රහත් මෙහෙණින් වහන්සේට පිරිනිවනට කාලය පැමිණ ඇති බව වැටහිණි. මේ බව දැන්වීමට බුදුරජාණන් වහන්සේ එවකට වැඩසිටි විශාලා මහනුවර කූටාගාර ශාලාවට පිවිසියා ය. එසේ පිවිස මවක හා පුතෙකු අතර මෙතෙක් ලොව ඇති වූ අනුවේදනීය කතා පුවත තෙරණියෝ ඉදිරිපත් කළේ මේ අන්දමට ය.

සුගතයාණෙනි, මම ඔබේ මව - වීරයාණෙනි, මගේ පියා ඔබ
නාථයාණෙනි, දම් සුවය දුන් - ගොයුම් ඔබගෙන් මම උපන්නෙමි
සුගතයාණෙනි, ඔබේ රූ කය - වඩන ලද්දේ මා විසින් ම ය
මගේ කැළලක් නොමැති දම් කය - වඩන ලද්දේ ඔබ විසින් ම ය

සා පිපාසා සුසන් සිඳවන - ඔබට කිරිපෙව් මව මම යි
ඉතාමත් සන් සිඳුණු දම් කිරි - පොවන ලද්දේ මට ඔබ යි

මහා මුනි ඔබ හැදුව වැඩූවට - ඔබ මෙමට ණය ගැති නොවේ
පුතුන් පතනා කතුන් වෙත්නම් - ලබත්වා ඔබ වැනි පුතෙක්

'රජමව'ය 'රජ බිසව' යන නම් - කතුන්හට සුලබව තිබේ
"බුදු මව"ය යන යම් නමක් වෙද - එය ලැබුම අති දුලබ වේ
වීරයාණෙනි, මේ සිරුර හැර - කැමතිවෙමි මම පිරිනිවෙන්නට
බුදුපියාණෙනි, එයට මට දෙනු - මැනවි අවසර දැන් ඉතින්

මෙසේ අවසරගත් මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියෝ අවසන්වරට මුනි සිරිපා නැමඳ කූටාගාර ශාලාවෙන් නික්මුණහ.

අලං පුත්තා විසාදෙන - මාර පාසානුවත්තිනා
අනිච්චං සංඛතං සබ්බං - වියෝගන්තං චලාචලං

මරුවට බැඳුන සෝකෙන් පල නැත්තෙ මය
සියලු සකර දම් දරුවෙනි අනිස මය
එකතුව වෙන්වීම කෙළවර කෙරෙත් මය
නිබඳව වෙනස් වන සුලු බව නියත මය

මෙලෙසින්, හඬා වැළපෙන සියලුම අය සතසා විහාරයෙන් නික්ම යන විට බුදුරජාණන් වහන්සේ බිහිදොර දක්වා පසු ගමන් කර තම මෑණියන් වහන්සේට ගරු බුහුමන් දැක්වූ සේක.

දයාබර බිරිඳක ලෙසත් සෙනෙහෙබර මවක ලෙසත්, පින්බර උපාසිකාවක ලෙසත්, කාන්තා නිදහස විමුක්තිය උදෙසා පෙරමුණ ගත් අභීත නායිකාවක ලෙසත්, පළමුව බුදු සසුනෙහි පැවිදිව උපසම්පදාව ලත් පළමුව රහත් වූ මෙහෙණින් වහන්සේ ලෙසත් වැජඹුන මහා ප්‍රජාපතී ගෝතමී රහත් තෙරණින් වහන්සේ පිරිනිවන් පෑයේ කාන්තා හදවත් තුළ නොමැකෙන මතකයක් රඳවා තබමිනි.

**ක්‍රියාකාරකම්:**

- මහාප්‍රජාපතී ගෝතමී තෙරණින් වහන්සේගේ චරිත කතාවෙන් ගතහැකි ආදර්ශ පහක් ලියා දක්වන්න.
- මහාප්‍රජාපතී ගෝතමී තෙරණින් වහන්සේත් බුදු රජාණන් වහන්සේත් අතර ඇතිවුණු සාකච්ඡාව ඇසුරෙන් කවි දෙකක් නිර්මාණය කරන්න.

**පුහුණුවට:**

පඨවි සමෝ නෝ විරුජ්ඣති
ඉන්දඛීලුපමෝ තාදී සුබ්බතො
රහදෝව අපේත කද්දමෝ
සංසාරා න භවන්ති තාදිනෝ *(ධම්මපදය අරහන්ත වග්ගය)*

කැමති අකමැති දෙකම උසුලන, මිහිතලය ලෙස වැඩ සිටින්නේ
තාදි ගුණයෙන් යුක්ත වී ඇත, ඉඳු කිලක් සේ වැඩ සිටින්නේ
මඩ නැතුව පෑදුනු විලක් සේ, පහන් සිත් ලැබ වැඩ සිටින්නේ
සියලු කෙලෙසුන් මැඬලූ උතුමෝ යළිත් නැත සසරට වඩින්නේ

# 16 පාඩම

## අපේ සාරධර්ම හැඳින ගනිමු.

පුටුවක්, මේසයක් වැනි ගෘහ භාණ්ඩයක් තැනීමට අවශ්‍ය වූ විට වඩුවා ලී කොටයක් ගෙන පළමුව එහි පිටපොත්ත ගලවා දමයි. එළය කොටස ඉවත් කරයි. කොටය පළා එහි මදයක් ඇත්නම් එය ද ඉවතට දමයි. ඔහු ලීයේ අරටුව තෝරා ගනී. වඩුවා එසේ කරන්නේ තමන් හදන පුටුව හෝ මේසය ශක්තිමත්ව, ගුල්ලන් වැනි කෘමීන්ට කා දැමීමට නුපුළුවන් ලෙස, දිග කලක් ප්‍රයෝජන ගැනීමට වුවමනා නිසාය. වඩුවා ගෘහ භාණ්ඩයක් සඳහා මෙසේ ලීයේ අරටුව තෝරා ගන්නා මෙන් නුවණැති මිනිසා ද තම ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා අරටුව වැනි ගුණ ධර්ම හැඳින ගෙන ඒවා දියුණු කර ගත යුතුය. සාරධර්ම යනුවෙන් හැඳින්වෙන්නේ එවැනි ගුණ ධර්මයි.

නිසරු දෙය සරු ලෙසත්, සරු දෙය නිසරු ලෙසත් දකින වැරදි කල්පනා ඇති මිනිසා දියුණුව නොලබන බව බුදුරජාණන්වහන්සේ ධම්මපද ගාථාවක වදාළහ.

එසේම සරු දෙය සරු ලෙසත්, නිසරු දෙය නිසරු ලෙසත් දකින නිවැරදි කල්පනා ඇති මිනිසා දියුණුවට පත්වන බවද තවත් ධම්ම පද ගාථාවකින් වදාළහ.

සාරධර්ම පිළිබඳව මේ ධම්ම පද ගාථා දෙක බුදුරජාණන්වහන්සේ දේශනා කළේ සංජය පිරිවැජියා සම්බන්ධ සිද්ධියක් මුල්කරගෙනය.බෞද්ධ සාරධර්ම මේ සිද්ධියෙන් මැනවින් හෙළිවෙයි. කෝලිත, උපතිස්ස දෙදෙනා බුදුදහම ගැන අසා පැහැදී බුදුරදුන් හමුවීමට යෑමට තීරණය කර තමන්ගේ ගුරුවරයා වූ සංජයට ද ආරාධනා කළහ. සංජය එයට අකමැති වූයේ තමන් ගුරුවරයෙකුව සිට ශිෂ්‍යයකු වීමට අකමැති බව ප්‍රකාශ කරමිනි. සංජය සාරධර්ම වශයෙන් පිළිගෙන තිබුණේ තමන් ගුරුවරයෙකුව විශාල ශිෂ්‍ය පිරිසක්

ඇතිව සිටීම, එයින් ලැබෙන කීර්ති ප්‍රශංසාව හා ලාභ ප්‍රයෝජන ආදිය යි. මේවා නිසරු දැ බවත් සැබෑ සාරධර්ම යනු සීල, සමාධි, ප්‍රඥා ආදී වූ ගුණධර්ම බවත් බුදුරජාණන්වහන්සේ වදාළහ.

බුදුදහමේ ඉගැන්වෙන මේ සාරධර්ම අප රට වැසි ජනතාවට දායාද කර දෙන ලද්දේ මිහිඳු මහරහතන් වහන්සේ විසිනි. බුදුදහම හඳුන්වා දීමත් සමඟ බෞද්ධ සාරධර්ම ද අපේ රටේ පාලකයාගේ සිට සාමාන්‍ය රට වැසියා දක්වා හැම දෙනාට ම දැන හැඳින ගැනීමට ලැබිණි. එදා සිට අපි ජාතියක් වශයෙන් මේවා පුරුදු පුහුණු කර ගැනීමට හුරු වූයෙමු. වැඩිහිටියන්ට සැලකීම, ගිලනුන්ට උපස්ථාන කිරීම, ආගන්තුක සත්කාරය, පිරිසිදුව සිටීම එසේ අප උරුම කර ගත් සාරධර්ම කිහිපයකි.

ඒවා අතරින් අප මේ පාඩමේ දී ඉගෙන ගන්නේ වැඩිහිටියන්ට සැලකීම හා ගිලානෝපස්ථානය යන සාරධර්ම දෙක ගැන ය.

## වැඩිහිටියන්ට සැලකීම

මව්පියන්, ගුරුවරුන්, භික්ෂූන් වහන්සේ, නෑදෑයින් සහ සියලුම වයසක අය අපේ වැඩිහිටියෝ වෙති. වයසින්, නැකමින් මෙන් ම ගුණධර්මයන්ගෙන් ද අපට වඩා උසස් තත්ත්වයේ සිටින සැම දෙනම අපි වැඩිහිටියන් ලෙස සලකමු. ඇතැම්විට වයසින් බාල වුවත් ගුණ නුවණින් උසස් නම් ඒ අය වැඩිහිටියන් ලෙස අපි පිළිගනිමු. එසේ ම ගුණ නුවණ අඩු වුවත් වයසින් වැඩි අය අපට වඩා අත්දැකීම් ඇති අය නිසා අපගේ සැලකීමට භාජනය විය යුතුය.

මංගල සූත්‍රයෙහි ගාරවෝ යනුවෙන් ගෞරව දැක්වීම දියුණු වීමේ එක් හේතුවක් වශයෙන් දක්වා තිබේ. දස පුණ්‍යක්‍රියාවන්හි ද වුද්ධාපචායන නමින් දැක්වෙන්නේ වැඩිහිටියන්ට සැලකීමය.

මිනිසුන් අතර පමණක් නොව තිරිසන් සතුන් අතර ද වැඩිහිටියන් සැලකීම උතුම් ගුණයක් ලෙස පිළිගැනුණු ආකාරය අපට තිත්තිර ජාතක කතාවෙන් හෙළිවෙයි. වනයේ එකට වාසය කළ ඇතා, වඳුරා හා වටුවා යන සතුන් තිදෙනා වයසක සතා වන වටුවාට ගෞරව දැක්වීමට පටන්ගත් බව එහි සඳහන් වේ.

අප වැඩිහිටියන්ට සැලකිය යුත්තේ මන්දැයි හොඳින් තේරුම් ගත යුතුය. ඒ සදාචාර ධර්මය අපෙන් ඉටුවන්නේ එය හොඳින් තේරුම් ගෙන ඇති පමණට ය. වැඩිහිටියෝ අප හදාවඩා ගත්හ. අපගේ ආරක්ෂාව සැලසූහ. අපට හොඳ නරක කියා දුන්හ. අප සමාජයට හඳුන්වා දුන්හ. අපට අවවාද අනුශාසනා කළහ. ඒ නිසා අපි ඔවුනට කෘතඥතාව දැක්විය යුතුය. වැඩිහිටියන්ගේ අත්දැකීම් අපට බෙහෙවින් ප්‍රයෝජනවත්ය. දියුණුව කරා පිය නැගිය හැකි වන්නේ ඒවා ප්‍රයෝජනයට ගැනීමෙනි. ඒ නිසා ද ඔවුන් අපේ ගෞරවයට පාත්‍රවිය යුතුය. ඇතැම් වැඩිහිටියෝ ස්වකීය කටයුතු කර ගැනීමට අපහසු තත්ත්වයක සිටිති. ඔවුනට අප ඒ නිසාද සැලකිය යුතුය. බොහෝ හේතු නිසා වැඩිහිටියන්ට සැලකීම අපෙන් සිදුවිය යුතුව ඇත.

අප වැඩිහිටියන්ට ගරු සැලකිලි දක්වන්නේ කෙසේද? මෙය ද අප විශේෂයෙන් දැන සිටිය යුතු කරුණකි. අපේ කථාව හා හැසිරීම සුදුසු පරිදි හැඩගසා ගැනීම ඉතා වැදගත් වේ. මිතුරන්ට කතා කරන අයුරින් මව්පියන්ට ගුරුවරුන්ට අපි කතා නොකරමු. ගිහියන්ට කතා කරන අයුරින් භික්ෂූන් වහන්සේට කතා නොකරමු. අපේ වයසේ අයට කතා කරන අයුරින් කිසිදු වැඩිහිටියෙකුට කතා නොකරමු. කතා කිරීම මෙන්ම ඒ ඒ අය ඉදිරියේ අප අත පය හසුරුවන ආකාරයද අපේ ඉරියව් පවත්වන ආකාරය ද හැඩ ගසා ගත යුතුය.

සමහර විට වෙනත් ජාතිවල අයට වෙනත් ආගම් අදහන අයට වඩා වෙනස් ආකාරයකට අපි අපේ වැඩිහිටියන්ට ගෞරව දැක්වීමට පුරුදු වී සිටිමු. මව්පිය ගුරුවරාදීන්ට දණගසා වැඳීම, ඒ අය ඉදිරියේ විශේෂ වූ සංවරයකින් හැසිරීම, ඔවුන්ගේ වුවමනා ඉටුකර දීම, ඔවුනට අවශ්‍ය උදව් උපකාර කිරීම අපේ පිළිවෙත ය. දැන් විදේශ ගමන්, සංචාරකයන් පැමිණීම, රූපවාහිනියේ බලපෑම ආදිය නිසා මේ පිළිවෙත් වෙනස් කිරීමට උත්සාහ කරන අය සිටිති. එහෙත් හොඳ බෞද්ධ දරුවන් වශයෙන් අපේ බෞද්ධ සාරධර්ම විනාශ කර නොගැනීමට අපි ඒවා ගැන දැන සිටිය යුතු වෙමු. එසේම පිළිපැදියයුතු වෙමු.

## ගිලානෝපස්ථානය

අසනීපයකින් පීඩා විඳින අය ගිලන්වූවෝය. රෝගාබාධයනට ලක් වී දුක් විඳීමට මිනිසාට සිදු වේ. ව්‍යාධි දුක යනුවෙන් හැඳින් වෙන්නේ එයයි. අසනීපයක් සැදුණු විට මිනිසා ශරීරයෙන් මෙන් ම සිතින් ද දුර්වල වේ. අනුන්ගේ උදව් උපකාර නොමැතිව තනිවම තම කටයුතු කර ගැනීමට බැරි තත්ත්වයට පත් වේ. ඒ නිසා ඉතා අසරණ වේ. ඒ අවස්ථාවේ දී අන් අයගේ කාරුණික සැලකීම හිමි විය යුතුය.

අසනීපයෙන් පෙළුණු භික්ෂූන් වහන්සේට බුදුරජාණන්වහන්සේ ද සියතින්ම උවටැන් කළහ. පූතිගත්ත තිස්ස තෙරණුවන්ගේ කතා පුවතෙන් ඒ බව හෙළිවේ. ඇඟේ බිබිලි හටගෙන, ඒවා තුවාල වී මුළු සිරුරම වණ වී දැඩි වේදනාවෙන් පෙළෙමින් සිටි උන්වහන්සේගේ කුටියට බුදුහාමුදුරුවෝ වැඩම කළහ. අනඳ මහ තෙරණුවන් ලවා උණුවතුර ගෙන්වා ගෙන ඇඟ සෝදා නහවා පිරිසිදු කර වෙනත් සිවුරු පොරවා සුවපහසුව සලසා ලූ සේක. තවත් අවස්ථාවක කුෂ්ඨ රෝගයකින් පෙළුණු භික්ෂූන් වහන්සේ නමකට උවටැන් කිරීමට වදාරා ගිලානෝපස්ථානයේ වැදගත්කම ද මෙසේ පෙන්වා දුන්හ.

*යෝ මං උපට්ඨහෙය්‍ය, සෝ ගිලානං උපට්ඨහෙය්‍ය*

යමෙක් මගේ අවවාදය පිළිගන්නේ නම් හෙතෙම ගිලනුන්ට උපස්ථාන කරන්නේය.

මේ බුදු වදන් සිහි කරන බෞද්ධයෝ ගිලනා කවරෙකු වුවත් ඔහුගේ තරාතිරම් නොසලකා තමනට කළ හැකි උපස්ථාන කරති. මිනිසුනට පමණක් නොව රෝගී වූ තිරිසන් සතුනට වුවද බෙහෙත් කිරීමට, සැලකීමට ඉදිරිපත් වෙති.

රෝගියාගෙන් කිසිවක් බලාපොරොත්තු නොවී කාරුණික බව නිසාම රෝගීන්ට උපස්ථාන කිරීම පුණ්‍ය කර්මයක් ලෙස සැලකීමට අපේ රටේ මිනිස්සු දීර්ඝ කාලයක සිට පුරුදු වී සිටිති. ගිලාන උපස්ථානය ඉතා උසස් සදාචාර ධර්මයක් බව සලකා එහි යෙදීමට අප හැමවිටම උනන්දු විය යුතුය.

**ක්‍රියාකාරකම් :**

1. පාසලේ දී පිළිපැදිය යුතු සාරධර්ම පහක් නම් කරන්න.
2. අප වැඩිහිටියන්ට සැලකිය යුත්තේ ඇයි දැයි විස්තර කරන්න.
3. සමිතිය ඉදිරියේ සාරධර්ම විස්තර කරමින් කරන කතාවේ පිටපතක් ලියන්න.
4. තිත්තිර ජාතකය සොයා ජාතක දේශනා ශෛලියෙන් පන්තියට ඉදිරිපත් කරන්න.

# 17 පාඩම

## ධම්ම පදයෙන් බිඳක් උගනිමු

ධම්ම පදය බෞද්ධයාගේ අත්පොතය. ඕනෑම අවස්ථාවක් සඳහා උපදේශයක් එහි ඇතුළත් වේ. ත්‍රිපිටකයෙහි නොයෙක් තැන සඳහන් ගාථා 423 ක් ධම්ම පදයෙහි සංග්‍රහ කර තිබේ. ඒවායින් ගාථා හතරක් මේ පාඩමෙන් අපි ඉගෙන ගනිමු.

මනෝ පුබ්බංගමා ධම්මා යනුවෙන් පටන් ගැනෙන පළමු ගාථාව චක්ඛුපාල මහ රහතන් වහන්සේ අරඹයා දේශනා කරන ලද්දකි. රහත් බව ලැබීමත් සමග ම උන්වහන්සේගේ ඇස් අන්ධ වීමට හේතුව ඇසූ භික්ෂූන් වහන්සේලාට බුදුරජාණන්වහන්සේ මෙසේ වදාළහ. චක්ඛුපාල රහතන් වහන්සේ පෙර ඇස් වෙදකුව ඉපිද සිටියහ. සුවය ලද පසු මෙහෙකාර කමට පොරොන්දුවී ඇස් රෝගයක් සුව කරවා ගත් කාන්තාවක් ඒ පොරොන්දුව ඉටු නොකළාය. එනිසා යලිත් ඇ අඳ බවට පත් කළ විපාක වශයෙන් අපා දුක් විඳ අවසන් ආත්මයේ දීත් මෙලෙස විපාක ලද බව වදාළ බුදුරජාණන්වහන්සේ අකුසල කර්ම විපාකයේ බලවත් කම මේ ගාථාවෙන් පැහැදිලි කළ සේක.

මනෝ පුබ්බංගමා ධම්මා - මනෝ සෙට්ඨා මනෝමයා
මනසා චේ පදුට්ඨේන - භාසතී වා කරෝති වා
තතෝ නං දුක්ඛමන්වේති - චක්කංව වහතෝ පදං

තේරුම:

සිතිවිලි දහම් මනස පෙරටු කොට ඇත.
මනස ශ්‍රේෂ්ඨ කොට ඇත. මනසෙහි ම උපදියි.
කිලිටි සිතින් (මනස කිලිටිව) යමකු කතා කළ හොත්,
ක්‍රියා කළහොත් ඔහු පසු පස දුක ලුහුබඳියි.
රිය අදින (ගොනා) සතා පසුපස රෝදය එන්නාක් මෙනි.

කවියෙන්:

සැම සිතිවිලි දහම්
මනස පෙරටුව ඇතිවේ
කිලිටි මනසක් සහිතව
කියනා කරන හැමදෙය
පසුපසින් දුක පැමිණෙයි
ගැල අදින ගොනු පසුපස
රෝදය කැරකෙමින් එන ලෙස

කාටවත් කිසිවක් නොදෙන නිසා අදින්න පුබ්බක නමින් හැඳින් වූ බමුණෙක් විය. මොහුගේ පුත්‍රයා මට්ටකුණ්ඩලී නම් වූයේ කර්ණාභරණයක් වෙනුවට තැලූ ලෝහ කැබැල්ලක් කනේ එල්ලා තිබුණ නිසාය. මසුරු බමුණා පුතා ලෙඩ වූ විට සුදුසු ප්‍රතිකාර නොකළ නිසා ඔහු මරණාසන්න විය. මිය යන මොහොතේ බුදුරජාණන් වහන්සේ දැක සිත පහදවා ගත් හෙතෙම දෙව්ලොව උපන්නේ ය.

පුතාගේ සොහොන ලඟට ගොස් දිනපතා හඬන මසුරු බමුණා යහමගට ගැනීමට සිතා මට්ටකුණ්ඩලී දේව පුත්‍රයා තරුණයකුගේ වේශයෙන් සොහොනට පැමිණියේ ය. ඔහු ද හඬන්නට විය. ඒ ගැන විමසූ විට තමාගේ රථයට රෝද දෙකක් නැති නිසා බව කීවේය. පුතු මල සොවින් තැවෙන බමුණා රෝද දෙකක් සාදවා දීමට කැමති වුවත් තරුණයාට වුවමනා වූයේ ඉර හඳ දෙක ය.

ලබා ගන්නට බැරි ඉර හඳ ඉල්ලීම මෝඩකමක් නොවේ දැයි ඇසූ බමුණාට තරුණයා කීවේ මෝඩකම, පෙනෙන ඉර හඳ ඉල්ලීම නොව නොපෙනෙන මිය ගිය පුතා ගැන සෝක කිරීම බව යි. මේ තරුණයා තමාගේ මිය ගිය පුතාම මෙන් දුටු බමුණා 'ඔබ කව්දැයි' විමසීය. තමන් මට්ටකුණ්ඩලී බවත් දෙව්ලොව ඉපදුන බවත් ඔහු කීවේය. දන් නොදී, සිල් නොරැක දෙව් ලොව ඉපදුනේ කෙසේ දැයි බමුණා ප්‍රශ්න කළේය. එය බුදුරජාණන් වහන්සේගෙන් අසා ගන්නැයි දන්වා තරුණයා අතුරුදන් වූයේය.

තම ආරාධනයෙන් පසු දින දානයට වැඩම කළ බුදුරජාණන් වහන්සේගෙන් මේ කරුණ බමුණා විමසා සිටියේය. එතැනට පැමිණි දේව පුත්‍රයා ලවාම ඔහු දෙව් ලොව ඉපදීමේ හේතුව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරවූහ.

බුදු හාමුදුරුවන් කෙරෙහි ඇති වූ ශ්‍රද්ධා මාත්‍රයම දෙව්ලොව උපතට හේතු වූ බව ප්‍රකාශ විය. ඒ අවස්ථාවේ වදාළ ගාථාව ධම්මපදයේ දෙවන ගාථාව යි.

මනෝ පුබ්බංගමා ධම්මා - මනෝ සෙට්ඨා මනෝමයා
මනසා චේ පසන්නේන - භාසතී වා කරෝති වා
තතෝ නං සුඛමන්වේති - ඡායාව අනපායිනී

**තේරුම:**

සිතිවිලි දහම් මනස පෙරටු කොට ඇත.
මනස ශ්‍රේෂ්ඨ කොට ඇත. මනසේම උපදියි.
ප්‍රසන්න සිතින් (මනසින්) යමකු කථා කළ හොත්,
ක්‍රියා කළහොත් ඔහු පසු පස සැප පැමිණෙයි.
තමා අත් නොහැරම එන සෙවනැල්ල මෙනි.

**කවියෙන්:**

සැම සිතිවිලි දහම්
මනස පෙරටුව ඇති වේ
පිරිසිදු මනසකින්
කියනා කරන හැමදෙය
පසුපසින් සැප පැමිණෙයි
තමා අත නොහැරම
එන සෙවනැල්ල මෙන්

මේ ගාථා දෙකෙහි ඇතුළත් ''මනෝ'' යන වචනයෙහි අර්ථය මනස හෙවත් සිත යනු වේ. ''ධම්ම'' යන්නෙන් සිතිවිලි අදහස් වේ. මේ ගාථා දෙකෙන් හොඳ නරක කර්ම විපාක ලැබෙන ආකාරය විස්තර කෙරේ.

බුදුරජාණන් වහන්සේ වැඩ සිටි සමයේ ද කලහකාරී භික්ෂූහු සිටියහ. සමහරු කණ්ඩායම් සෑදී කලහ කළහ. හය දෙනාගේ කණ්ඩායමක් සහ දාහත් දෙනාගේ කණ්ඩායමක් යැයි ප්‍රසිද්ධව සිටි කොටස් දෙකක් අතර ඇති වූ කලහ අවස්ථා දෙකක දී දේශනා කරන ලද ගාථා දෙකකි මේ.

සබ්බේ තසන්ති දණ්ඩස්ස
සබ්බේ භායන්ති මච්චුනෝ
අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය න ඝාඨයේ

සියලු දෙන දඬුවමෙන් තැති ගනිති. සියලු දෙන මරුට බිය වෙති. තමා උපමාවට ගෙන අනුන් නොනැසිය යුතුය. නො නැසවිය යුතුය.

දඬුවමෙන් තැති ගනිති
මරුට බියවෙති හැම දෙන
තමා උපමා කොට
අනුන් නොනැසිය යුතු,
නොනැසවිය යුතු කිසි දින

සබ්බේ තසන්ති දණ්ඩස්ස
සබ්බේසං ජීවිතං පියං
අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය න ඝාතයේ

සියලු දෙන දඬුවමෙන් තැති ගනිති. සියලු දෙනාට ජීවිතය ප්‍රියය. තමා උපමාවට ගෙන අනුන් නොනැසිය යුතුය. නොනැසවිය යුතුය.

දඬුවමෙන් තැති ගනිති සැවොම
සැමට තම දිවි ප්‍රිය වේ
තමා උපමා කොට
අනුන් නොනැසිය
නොනැසවිය යුතු කිසි දින

මේ ගාථා දෙකෙහි එන අත්තානං උපමං කත්වා යන යෙදුමෙහි අදහස තමා උපමාවට ගෙන යන්නයි. තමා උපමාවට ගැනීම යනු තමා දඬුවමට හා මරණයට බියවන අතර ජීවිතයට ප්‍රිය කරන්නේ යම්සේ ද අන් අයත් එසේ දඬුවමට හා මරණයට බියවන අතර ජීවිතයට ප්‍රිය කරන බව නුවණින් වටහා ගැනීම ය.

**ක්‍රියාකාරකම්:**

1. මේ ගාථා නිවැරදි උච්චාරණයෙන් යුක්තව සජ්ඣායනා කරන්න.

2. මේ ගාථාවල අදහස් ඔබේ වචනයෙන් ලියන්න.

3. මේ ගාථාවල අදහස් පද්‍යයට නගන්න.

# 18 පාඩම

## ලෙන් විහාර රැසක් කළ නිරිඳු වළගම්බා

මහා පෞරුෂයකින් හා තරුණ පෙනුමෙන් යුතු පුරුෂයෙකි. හෙතෙම දඹුලු ලෙනේ සිට ගමන් කරනුයේ ඇතුගල පසු කර රුවන්ගිරි සෙනසුනට ය. දින ගණනකින් කුසට අහරක් නොලද බැවින් ඔහුට තවදුරටත් ගමන් කළ නොහැකි විය. කුඩා නිවසක් ළඟ නතර වූයේ එබැවිනි. එහි සිටි මහලු කාන්තාව ළඟට ගොස් මෙසේ කීවේය.

"අම්මේ මට හරිම බඩගිනියි. කෑම ටිකක් දෙන්න පුළුවන් ද?"
"ඔය දරුවා කොහෙ ඉඳලද එන්නේ"
"මම එන්නේ දඹුලු ලෙනේ ඉඳලා"
"ගෙදර උයාපු කෑම ටික නම් ඉවරයි. මං පුතාට ඉක්මනට කිරිබත් ටිකක් උයලා දෙන්නම්. පුතාට ටික වෙලාවක් වාඩිවෙලා ඉන්න වෙයි."

කාන්තාව ඉතා ඉක්මනින් ම කිරිබත උයා භාජනයකට බෙදා දුන්නා ය. බඩගින්න වැඩිකමට උණුසුම් පිට ම කිරිබත් කන්නට වූ ආගන්තුකයාගේ අත සහ කට පිලිස්සුණේ ය. කාන්තාව ඒ දෙස බලා මෙසේ කීවා ය.

"පුතා උණුසුම් පිටම කිරිබත් කන්න බැහැ නෙව, ඔයා හරියට කිරිබත් කන්න හදන්නේ වළගම්බා රජ්ජුරුවෝ යුද්ධ කරනවා වගේ නේ. ඒ රජ්ජුරුවෝ එහෙත් මෙහෙත් සොළින් පරද්දන්න යුද්ධ කරනවා. පරදිනවා කැලේ හැංගෙනවා. ඉවරයක් නෑනේ. සොළින් අපේ මේ වැව් බැඳි රාජ්ජයම අල්ලාගෙන ඉවරයි. වැව් පොකුණු කඩලා ගොවිතැන් පාලු කරලා. වෙහෙර විහාර විනාශ කරලා. තිදන් වස්තු පැහැරගෙන ගම්බිම් පාළු වෙලා. දැන් රටේ වැස්සත් නැහැනෙව. "

"කොහොමද අම්මේ කිරිබත් කන්න ඕනෑ?"

"පුතා කිරිබත් ගුලි කර තබා ගෙන එක එක පිළිවෙළින් කන්න. එතකොට ඔය ඔක්කොම කිරිබත් කන්න පුළුවන්. යුද්ධ කළ යුත්තේ පුතේ බල කඳවුරු පිහිටුවලානේ."

ආගන්තුකයා මහලු කාන්තාව කී කරුණ ගැන මැනවින් කල්පනා කරමින් කිරිබත් කා කුසගින්න නිවා ගත්තේ ය.

"පුතා මොකද කරන්නේ"?

"මම වැඩිපුර ඉන්නේ ගල්ගුහාවල භාවනා කරන හාමුදුරුවන් වහන්සේලා සමඟ. මම උන්වහන්සේලාට ආවතේව කරනවා. උන්වහන්සේලා මට සලකනවා. ඒත් මට එක තැන ඉන්න බැහැ. සෙනසුරු අපලේ තියෙනවලු අවුරුදු දොළහක්. මට සැලකුවාට අම්මාට බොහොම පින්. මම වෙනත් දවසක හමුවෙන්න එන්නම්. මට යන්න අවසරයි."

"හොඳයි පුතා ප්‍රවේශමෙන් යන්න. පුතාට තුණුරුවන්ගේ ම පිහිටයි."

තමා මේ කතා කරන්නේ වට්ට ගාමිණී අභය හෙවත් වළගම්බා රජතුමා සමඟ බව කාන්තාව දැන සිටියේ නැත. කාන්තාවට මෙලෙස වළගම්බා රජතුමා හමුවූයේ දෙවන වර රජකම ලබා ගැනීමට මහ සඟරුවනේ ආශිර්වාදයෙන් සේනාව සංවිධානය කරන අතරතුරේදී ය.

මෙලෙස කාලයක් ම ලෙන් ගුහාවල අප්‍රසිද්ධ වේශයෙන් සැඟවී සිටි රජතුමා තම සේනාව සංවිධානය කළේ ය. දිනක් ගල්ලෙනක් තුළ කෙළවරක එක් මකුළුවෙකු දැලක් තනන අන්දම දුටුවේ ය. මකුළුවා වාර හතක් ම අසමත් විය. එහෙත් අටවන වර මකුළුවාට දැල සකස් කර ගැනීමට හැකිවිය. ඒ දර්ශනයෙන් දිරිමත් වූ රජතුමා වඩාත් මැනවින් සේනාව සංවිධානය කර ගත්තේය.

ඒ දවස බොහෝ භික්ෂූන් වහන්සේලා සිව්පසය නොලැබ විදේශ ගත වූහ. සමහර ස්වාමීන් වහන්සේලා නිරාහාරව අපවත් වූ සේක. මහජනතාවද විවිධ ගැටලුවලට බඳුන් විය. මෙම අභාග්‍යවත් සමය වසර දොළහක් පැවතුණි. "බැමිණිතියාසාය" නමින් හැඳින්වෙන්නේ මෙම කාලය යි.

රටත් ජාතියත් සසුනත් රැකගැනීමට නම් වළගම්බා රජතුමා ආරක්ෂා කළයුතු බව භික්ෂූන් වහන්සේලා ඒකමතිකව තීරණය කළහ. මෙහිලා සුවිශේෂ කාර්යභාරයක් ඉටු කළේ කුපික්කල තිස්ස තෙරුන් වහන්සේ ය. වලස්ගල විහාරයට රැස්ව රජතුමාගෙන් වෙන්වූ සෙනෙවි වරුන් යළි සමගි කර සේනාව සංවිධානය කරනු ලැබුවේ තිස්ස තෙරුන් වහන්සේ ප්‍රධාන මහ සඟරුවන විසිනි. එදා ධර්ම විනය වෙනුවෙන් ක්‍රියා කළ ලෙසට ම ජාතිය උදෙසා ද උන්වහන්සේලා නොපසුබට ව ක්‍රියා කළහ. ජාතිය රැකුණොත් රට රැකෙයි යන්න එකල වැඩ සිටි භික්ෂූන් වහන්සේලාගේ අදහස විය.

භික්ෂූන් වහන්සේලාගේත් මහජනතාවගේත් ආශිර්වාදය කැප වීම ධෛර්යය මත සහ වළගම්බා රජතුමා සිය බුද්ධිය මෙහෙයවීම මත සොළින් පරදවා දෙවන වරට ද ලක් සිහසුනට පත් විය. රජකම ලත් විගස ම එතුමාට සිහි වූයේ තමා සටනින් පැරදී පලා යන විට තමාට "මහ කළු සිංහලයා පලා යනවෝ" කියා අවමන් කළ ගිරි නම් නිගණ්ඨ ශ්‍රාවකයා ය. එදා තමා සිතූ පරිදි එම නිගණ්ඨ අසපුව ලඟ තමන්ගේ "අභය" යන නාමයත් "ගිරි" නිගණ්ඨ ශ්‍රාවකයාගේ "ගිරි" නාමයත් එකතු කර විහාරයක් කරවූවේ ය. එය තමාගේ ජයග්‍රහණයට උදව් කළ කුපික්කල තිස්ස තෙරුන් වහන්සේට පෞද්ගලිකව පූජා කළේ ය. එහෙත් පෞද්ගලික විහාරයක් පිළිගැනීම ශාසනික පිළිවෙතට පටහැනි ක්‍රියාවකැයි එම පූජාව මහා විහාරීය භික්ෂූන්වහන්සේලා අනුමත නොකළහ. පසු කලෙක අභයගිරි නිකායේ මූලස්ථානය වූයේ මෙම විහාරය යි. භික්ෂූන් වහන්සේලා පන්දහසක් පමණ මෙහි වැඩ සිටි බව මෙරටට පැමිණි හියුං සාන් සහ පාහියන් යන භික්ෂූන් වහන්සේලාගේ වාර්තාවල සඳහන්ව ඇත.

වළගම්බා රජතුමා කළ තවත් කටයුත්තක් වූයේ එදා පලා යද්දී දෝලාවේ බර වැඩි නිසා ඉන් බැස සිය කැමැත්තෙන් ම සතුරාට ගොදුරු වූ සෝමා දේවිය ඔවුන්ගෙන් මුදා ගැනීම යි. එදා තමා වෙනුවෙන් සෝමා දේවිය කළ ඒ උදාර පරිත්‍යාගය සදානුස්මරණීය කරලනු වස් චෛත්‍යයක් හා විහාරයක් කරවන ලදී.

වළගම්බා රජතුමාගේ කාලයේදී සිදුවූ තවත් වැදගත් සිදුවීමක් නම් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමයි. එතෙක් ත්‍රිපිටක ධර්මය පැවත ගෙන

ආවේ කටපාඩම් කිරීමෙනි. එලෙස රැකගත් ත්‍රිපිටක ධර්මය භික්ෂූන් වහන්සේලා පුස් කොළ පොත්වල ලියන ලද්දේ මාතලේ අලු විහාරයේදී ය.



වළගම්බා රජතුමා බොහෝවිට අනුගමනය කළේ දුටුගැමුණු රජතුමාගේ ක්‍රියා කලාපය යි. දුටුගැමුණු රජතුමා මෙන් බුදුදහමට විශේෂ අනුග්‍රහයක් දැක්වූයේ ය. මෙතුමාට දැඩි අධිෂ්ඨාන ශක්තියක් තිබූ බව එතුමන්ගේ චරිතයෙන් පැහැදිලි වේ.

රජකම තමන් අතට ගැනීමට වළගම්බා කුමරුට අවශ්‍ය වූයේ තම පෞද්ගලික සුඛ විහරණය පිණිස නොවේ. සොළීන්ගෙන් රට මුදවාගෙන බුදුදහමට නිසිතැන ලබා දෙමින් රාජ්‍යයේ පුනර්ජීවයක් ඇති කර ලනු සඳහාය. එම ශ්‍රේෂ්ඨ අරමුණ උදෙසා වසර දාහතරක් ම වනගත ව සිටීමට තරම් එතුමාට ආත්ම ශක්තියක් තිබුණි. රාජ සම්පත් නොමැතිව හරිහැටි කුසට අහරක් නොලබා වසර දාහතරක් ම වනගත ව සිටීම ඉතා ම අපහසු කාර්යයෙකි.

මේ සියලු ම කාරණාවලින් ප්‍රකට වන්නේ එතුමා සතුව පැවති නිර්භීත භාවය, කෘත වේදීත්වය, යුද උපායෙහි කෞශල්‍ය බව, ස්ථානෝචිත ප්‍රඥාව, අධිෂ්ඨාන ශක්තිය ආදී විශිෂ්ට ගුණයන්ය. වළගම්බා රජතුමා දැයේ පිනට පහළ වූ වීරෝදාර නරපතින් අතර යුග පුරුෂයෙකි.

**ක්‍රියාකාරකම්:**

1. වළගම්බා රජතුමා සහ කාන්තාව අතර ඇති වූ සාකච්ඡාවෙන් අපට ලබාගත හැකි ආදර්ශ මොනවාද?
2. වළගම්බා රජතුමා හැඳින්වෙන තවත් නමක් ලියන්න.
3. වළගම්බා රජතුමා කළ සේවාවන් දෙකක් නම් කරන්න.
4. වළගම්බා රජතුමාගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ මොනවාද?
5. වළගම්බා රජතුමා විසින් කරන ලද ලෙන් විහාර පිළිබඳව ගුරුතුමා සමඟ සාකච්ඡා කරන්න.

## 19 පාඩම

### නුවණ යොදවා දිවිය සුරකිමු

අප සැබැවින් ම පෙර පින් කරන ලද අය වෙමු. එබඳු නිගමනයකට පැමිණෙන්නේ කුමන කරුණක් නිසා ද? අප මනුෂ්‍යයන් වශයෙන් උපත ලබා සිටීම ඊට හේතුව යි. මිනිසුන් ලෙස උපත ලබන්නේ පෙර පින් කරන ලද අය යැයි බුදු දහමෙහි ඉගැන්වේ. අප දන්නා ලෝකයෙහි සිටින අනෙකුත් සතුන්ගේ සංඛ්‍යාව සමඟ සසඳා බල විට මිනිසුන් සිටින්නේ සුළු ප්‍රමාණයකි. "**කිච්ඡෝ මනුස්ස පටිලාභෝ**" යන්න බුද්ධ වචනයකි. එහි තේරුම "මනුෂ්‍ය ආත්මභාවයක් ලැබීම අපහසුය" යන්නයි. මෙම බුදු වදන අනුව යමින් "**දුකකිනි මිනිසත් බව ලැබ ගන්නේ**" යනුවෙන් ලෝවැඩ සඟරාවෙහි සඳහන් කැරෙන්නේ.

සංඛ්‍යාත්මක වශයෙන් හෙවත් ගණනින් මිනිසුන් අඩු වුවද ගුණාත්මක වශයෙන් අනෙක් සෑම ප්‍රාණියෙකුට ම වඩා ඉදිරියෙන් සිටින්නේ මිනිසාය. දෙවියන් බඹුන් සහිත සියලු සතුන් අතර උත්තරීතර වන්නේ බුදුරජාණන් වහන්සේය. උන් වහන්සේ මිනසකු මිස දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ නොවෙති. එයින් පැහැදිලි වන්නේ ප්‍රාණීන් අතර උසස් ම ප්‍රණියා මිනිසා බවය.

**මනුස්ස** යන වචනයෙන් ම ද මිනිසාගේ උතුම් බව පැවසේ. මනුස්ස යන වචනය විස්තර කැරෙන්නේ **උසස් මනසක් ඇති හෙයින් මනුස්ස නම් වේ** කියාය. මනසේ උසස් බව නම් අනෙක් සතුන්ට වඩා දියුණු වූ ද තවදුරටත් දියුණු කළ හැකි වූ ද ස්වභාවයකින් යුක්ත බවයි. මිනිස් මනස බුද්ධත්වය තෙක් ම දියුණු කළ හැකි ය. ලෝකයේ නව සොයා ගැනීමක් හෝ නිර්මාණාත්මක ක්‍රියාවක් හෝ කර තිබෙනම් එය කර තිබෙන්නේ මිනිසකු විසින් ම ය. අප දන්නා පරිදි නිර්මාණාත්මක ලෙස භාෂාවක් භාවිත කරන්නේද මිනිසා ය. අනෙක් බොහෝ සතුන් තම සිතැඟි පැවසීමට යොදා ගන්නේ සීමා සහිත ශබ්ද රටා කීපයකි. එම ශබ්ද වැඩි දියුණු කර ජීව භාෂාවක් බවට පත්

කර ගැනීමේ කුසලතාවක් එම සතුන්ට නැත. ඉතිහාසයෙහි ශිෂ්ටාචාරයක් ගොඩනැගී ඇත්තේ ද මිනිස් වර්ගයා අතින් මිස අනෙක් සත්ව කොට්ඨාසයක් අතින් නොවේ. මේ කරුණු අනුව මිනිසාගේ උසස් බව තේරුම් ගැනීම පහසුය.

ඉහත සඳහන් ආකාරයේ උතුම් බවක් හිමි කර ගත් මනුෂ්‍ය ආත්ම භාවයක උපත ලද අපට එය රැක ගැනීමේ වගකීමක් ඇත. ශාරීරිකව මෙන්ම අධ්‍යාත්මිකව ද අප ආරක්ෂා විය යුතු ය. ශාරීරිකව ආරක්ෂා වීමේ දී ලෙඩ රෝගවලින් ආරක්ෂා වීම වැදගත් ය. රෝගාබාධ වැළදීමට ඇති ඉඩකඩ වළක්වා ගැනීම ගැන මෙන් ම රෝගී වූ විටෙක නිසි ප්‍රතිකාර සැලකිල්ලෙන් ගැනීම ගැන ද අපගේ අවධානය යොමු විය යුතු ය. රෝගාබාධ වළක්වා ගැනීමට හැකියාව තිබිය දී ඒ ගැන නොසැලකිල්ල නිසාත් රෝගයක් වැළඳුණු පසුව නිසි ප්‍රතිකාර නිසි පරිදි නොගැනීම නිසාත් මෙම වටිනා මිනිස් ජීවිතය අකාලයේ නැති කර ගන්නෝ වෙති. ඒවා දැකදැකත් ඒ පිළිබඳ පුවත් අසමිනුත් අපි අපේ ජීවිත එබඳු අවාසනාවන්ත තත්වයකට පත්වීමට ඉඩ හරිමුද? එය නොවිය යුත්තකි.

නොගැළපෙන ආහාරපාන, අපිරිසිදු ආහාරපාන ගැනීමෙන් අප වැළකිය යුතු ය. සුදුසු ආහාරපාන කලට වේලාවට ගැනීමට පුරුදු විය යුතු ය. බොහෝ ලෙඩ රෝගවලට හේතුවන්නේ ආහාරපාන ගැන නොසැලකිලිමත් වීම යි. ඇඟපත වෙහෙසවන වැඩක නොයෙදීම හා ව්‍යායාම් නොකිරීම ද ශාරීරිකව ගිලන් වීමට හේතු වේ. අප ආරක්ෂා වීමට නම් ඒවා ගැන ද සැලකිලිමත් විය යුතු ය.

ඇස කන නාසය ආදි ඉන්ද්‍රියයන් අපේ සිරුරෙහි පිහිටා තිබෙන්නේ ඒවා අවශ්‍ය නිසාය. ඇස් නොපෙනී ගිය හොත්, කන් නොඇසී ගිය හොත් අපට අත්වන තත්වය කුමක් ද? ඇස් නොපෙනෙන කන් නොඇසෙනෙන පුද්ගලයන් ලෙස ජීවත්වීමට අප කැමති ද? නැහැ නේද? එසේ නම් අපේ ඇස කන රැක ගැනීම ගැන සැලකිලිමත් වෙමු. දත කට පිරිසිදු නොකිරීම, අධික ලෙස නිදිවැරීම, අවේලාවේ ජලස්නානය ආදිය නිසා ඇස් රෝග ඇති වේ. කල්පනාවෙන් තොරව නොසැලකිලිමත් ලෙස දුව පැන ඇවිදීමෙන්ද අනතුරු සිදුවීමෙන් ද

ඇසට හානි විය හැකිය. ඒ ගැන අපේ අවධානය යොමු විය යුතු ය. අනෙකුත් ඉන්ද්‍රියයන් රැක ගැනීම ගැනද ඒ ආකාරයෙන් සැලකිලිමත් විය යුතු ය.

මත් වතුර, මත් කුඩු, මත් පෙති ගැනීම ද ශරීරයට බරපතල හානි පමුණුවයි. මොළය, අක්මාව, වකුගඩු ආදිය දුබල වීමට මත් වතුර ආදිය බලපාන බැවින් කිසිදු මත්ද්‍රව්‍යයක් නොගැනීමට කුඩා කල සිට ම අප පුරුදු විය යුතු ය. ඒවාට තමන් පෙළඹවීමට උත්සාහ කරන පව්ටු මිතුරන්ගෙන් ඈත්වීම සඳහා දැඩි අදිටනින් ක්‍රියා කිරීමට අපට සිදු වේ.

ශාරීරික අඟ පසඟ රැක ගැනීමෙන් පමණක් අප ආරක්ෂා වීණැයි කිවහැකි නොවේ. අපේ චරිතය ද ආරක්ෂා විය යුතුය. නුවණ තිබෙන කෙනෙක් නම් තම ජීවිතයේ යාම තුනෙන් එක යාමයක්වත් මැනවින් රැක ගන්නේයයි බුද්ධ දේශනාවෙහි සඳහන් වෙයි. මෙහි යාම තුන නම් බාල කාලය, තරුණ කාලය සහ වැඩිහිටි කාලයයි. මෙම කාල පරිච්ඡේදවලින් එකකදීවත් වැරදිවලින් මිදී යහපත් ක්‍රියාවන්හි නිරත වීම තම ආධ්‍යාත්මික ජීවිතය ආරක්ෂා කර ගැනීමකි. එම යාම තුනෙන් අප අද ගත කරන්නේ පළමු යාමය යි. එනම් ළමා අවධිය යි. අප මේ කාලය ආරක්ෂා සහිතව ම ගත කළයුතු වෙමු. ඒ සඳහා කළ යුත්තේ පවින් වැළකී යහපත් නිවැරදි වැඩවල යෙදීම යි.

අප කිසිම ප්‍රාණියකු විනාශ කිරීමෙන් වැළකී සියලුම ප්‍රාණීන්ට දයාව කරුණාව හිතවත්කම දක්වමු. තමන්ට නුදුන් දෙයක් කිසිවකුගෙන් හෝ කිසිම ආයතනයකින් පැහැර ගැනීමෙන් වැළකී දුන් දෙයක් පමණක් ගැනීමට පුරුදු වෙමු. තම වයසට ගැළපෙන ලෙස කුමර කුමරි බඹසර රැක ගෙන ජීවත් වීමට හුරු පුරුදු වෙමු. බොරු කීමෙන් වැළකී ඇත්ත කථා කරමු. පුද්ගලයන් අතර හෝ සංවිධාන අතර අසමගිය ඇති කෙරෙන කතාබහින් වැළකී සමගිය ඇති කෙරෙන වචන ම කථා කරමු. සැර පරුෂ අසභ්‍ය වචන කීමෙන් වැළකී ප්‍රිය ජනක වචන ම කථා කරමු. කිසිවකුට ප්‍රයෝජනයක් නැති වචන පැවැසීමෙන් වැළකී ප්‍රයෝජනවත් දෙයක් ම කථා කරමු. අපේ සිහිය අවුල් කර ජීවිතය විනාශ කරන මත් වතුර මත් කුඩු ආදියෙන් සම්පූර්ණයෙන් ම වළකිමු.

අපි උදේ සවස තෙරුවන් නැමැඳ දෙගුරුන් වඳිමු. ගුරුතුමන්ට වැඩිහිටියන්ට ගරු සැලකිලි දක්වමු. සුළු මොහොතක් හෝ භාවනා කරමු. පෝදා අටසිල් සමාදන් වෙමු. නැතිබැරි අයට උදව් කිරීමට පුරුදු වෙමු. ගිලන් වූවන්ට කරුණාවෙන් දයාවෙන් සලකමු. එසේ කරන විට අපේ ජීවිතය ආරක්ෂා වූයේ වෙයි. පාපයන්ගෙන් වැළකුණු විට අප ආරක්ෂා වන්නේ මේ ජීවිතයෙහි පමණක් නොවේ. පරලොවදී ද අපේ ජීවිතය ආරක්ෂා වේ. පරලොව ආරක්ෂා වීම නම් මරණින් පසු අපාගත වීමෙන් වැළකී යහපත් උපතක් ලැබීම යි. එසේ වන්නේ පව් කිරීමෙන් වෙන් වී පින්වත් ජීවිතයක් ගොඩනගා ගැනීමෙනි.

**ක්‍රියාකාරකම්:**

1. අපේ ශරීරයේ ආරක්ෂාව සඳහා අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග 4ක් ලියා දක්වන්න.
2. චරිතය ආරක්ෂා කර ගත් ළමයකුගේ ලක්ෂණ 10ක් හඳුන්වා දෙන්න.

**පුහුණුවට:**

කිසිම සතකු නොපෙළන්න පුතේ
කවුස්සකුට හූනකු හට වත්
ලේනෙකු බළලෙකු මොකෙකුට වත්
හිංසාවක් නොම කරන් පුතේ

යන්තම් පොඩි බඩුවකුත් පුතේ
අන් සන්තකයක් ගන්ට එපා
මගේ දෙයක් වත් නුදුන් එකක්
මට නොකියා අර ගන්න එපා

ගුරුවරයා හෝ පියාම හෝ
ගහතත් බණිතත් සැර කරතත්
බොරුවක් නම් තෙපලන්න එපා
ඇත්තම නුඹ හෙළිකරන් පුතේ

- *භක්ති ගීත* - යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නාහිමි.

## 20 පාඩම

### හැදෙන ලොවකට ඇවැසි විලිබිය

විලි නම් ලැජ්ජාව යි. බිය නම් තැති ගැනීම යි, බිය වීම යි, අපේ බණ පොත්වල ඒ දෙක සඳහන් කර තිබෙන්නේ හිරි සහ ඔත්තප්ප කියායි. හිරි ඔතප් යනුවෙන් ද සඳහන් වෙයි. පව්කම්, වැරදි වැඩ, නරක වැඩ කිරීමට ලැජ්ජා වීම, එබඳු ක්‍රියා පිළකුල් කිරීම හිරිය යි. වැරදි වැඩ, නරක වැඩ, පව්කම් කිරීමට බිය වීම ඔත්තප්පය යි. බුදුරජාණන් වහන්සේ විසින් ලෝක පාලක ධර්ම ලෙස ද, මේ කරුණු දෙක හඳුන්වා දෙනු ලැබ ඇත. මුළු ලෝකයේ ම ශීලාචාරකම ශිෂ්ට සම්පන්න භාවය දැහැමි බව ඇති වන්නේ මිනිසුන් විලිබිය දෙකින් යුක්ත වූ විට ය. බුදුරජාණන් වහන්සේ මේ පිළිබඳව කළ දේශනාවක් පහත සඳහන් වෙයි.

"මහණෙනි, මේ යහපත් ධර්ම දෙක ලොව පාලනය කරයි. කුමන ධර්ම දෙක ද? හිරි සහ ඔත්තප්ප යන දෙක යි. මහණෙනි මේ වැදගත් ධර්ම දෙක ලෝකය පාලනය කරන්නේ නැත්නම් තමන්ගේ මව ය කියා හෝ සුළු මව ය කියා හෝ නැන්දනිය කියා හෝ ගුරුතුමන්ගේ බිරිඳ ය කියා හෝ කිසිදු වෙනසක් නොදක්වන තරමට ලෝකයා පහත් තත්වයට වැටෙනු ඇත. කුකුළන් ඌරන් මෙන්ද, බල්ලන් සිවලුන් මෙන් ද අශීලාචාර ව හැසිරෙනු ඇත. මේ යහපත් වැදගත් ධර්ම දෙක ලෝකය පාලනය කරන නිසා ම තම මව ය කියා හෝ සුළු මව ය කියා හෝ නැන්දනිය කියා හෝ ගුරුතුමන්ගේ බිරිඳ ය කියා හෝ විශේෂ ගරුත්වයක් ඇතිව ආචාරශීලීව කටයුතු කරනු දක්නට ලැබෙයි."

ලොකු කුඩා, ස්ත්‍රී පුරුෂ, ගිහි පැවිදි කවුරුන්ගේ වුව ද ජීවිතයක් අංග සම්පූර්ණ වීම සඳහා දැන උගත්කම පමණක් ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා සිල්වත්කම ද, අවශ්‍ය ම වේ. සිල්වත්කම ඇති කර ගැනීමට හා පවත්වා ගැනීමට පුද්ගලයා හිරි ඔතප් දෙකින් යුක්ත විය යුතුම ය.

ඒ නිසා ම සිල්වත් වීමට අවශ්‍ය කාරණය ලෙස නොහොත් සීලයේ පදනම ලෙස දැක්වෙන්නේ මෙම ගුණධර්ම දෙක යි.

මෙම ගුණධර්ම දෙකේ වෙනස පැහැදිලි කිරීමට සාමාන්‍ය උපමාවක් දැක්විය හැකිය. "හිරි" හොඳට හැදුණු තැනැත්තකු මෙනි. "ඔත්තප්ප" නිතරම අනාචාරයේ හැසිරෙන කෙනකු මෙනි. ශීලාචාර අයෙකු වැරදි වැඩ නොකරන්නේ කවුරු හෝ දකිනු ඇතැයි සිතා හෝ දෝෂාරෝපණ එල්ල වෙතැයි කියා හෝ නොවේ. තමන් සැබවින් ම එම වැරදි ක්‍රියාව පිළිකුල් කරන බැවිනි. මුළු හිතින් ම එයට අකමැති බැවිනි. නිතර ම අනාචාරයේ හැසිරෙන අයකු නම් ඇතැම් තැනකදී එම නරක ක්‍රියාව නොකරන්නේ ඇතැම් විට සමාජයට හෝ නීතියට හෝ ඇති බිය නිසා යි. තම ඇතුළතින් වරදට පෙළඹවීමක් ඇති වුණත් බිය නිසා එම නරක ක්‍රියාවේ යෙදීමෙන් හෙතෙම වළකී.

කුමන හේතුවක් නිසා හෝ වරදින් මිදීම හොඳ ය. වඩාත් වැදගත් වන්නේ අවබෝධයෙන් යුතුව පාපක්‍රියාවන්ගෙන් වැළකීම යි. එබැවින් ඔත්තප්පයට වඩා හිරිය වැදගත් වෙයි. එසේ වුව ද වරදින් මිදෙන ගමන අප යන්නේ පියවරින් පියවර ය. අනුපිළිවෙලින් ය. එනිසා මුලදී බිය නිසා හෝ වරදින් මිදීම වැදගත්මය. ශීලාචාර මවක, මවකට නොගැළපෙන වැඩ නොකරන්නේ එබඳු වැඩ තම මව් පදවියට නොගැළපෙන බව දැනගෙන ය. ශීලාචාර පියකු පියකුට නොගැළපෙන වැඩ නොකරන්නේ තම පිතෘත්වයට එබඳු වැඩ නොගැළපෙන බව මුළු සිතින් ම පිළිගෙන ය. දරු දැරියන් ද, තම වයසට, තමන් අදහන ආගමට නොගැළපෙන වැඩවලින් බැහැර විය යුත්තේ ඒවා තමන්ට නොගැළපෙන බව පිළිගෙන මිස කිසිවෙකුට ඇති බිය නිසා නොවේ. මෙසේ ඔවුනොවුන් වරදකින් මිදෙන්නේ නම් එතැන ක්‍රියාවට නැගෙන්නේ "හිරි " යයි.

ඔත්තප්පය ඇති කර ගැනීමට පදනම් කර ගත හැකි කරුණු හතරක් බුදු දහමේ දැක්වේ.

1. තමාගේ සිත තමන්ට දොස් කියනු ඇත්දැයි විමසිලිමත් වීම.
2. අනුන්ගෙන් දොස් අසන්නට වේදැයි විමසිලිමත් වීම.
3. දඩුවම් විඳීමට සිදුවේදෝයි විමසිලිමත් වීම.
4. මරණින් පසු දුගතියෙහි උපදීදෝයි විමසිලිමත් වීම.

මෙම කරුණු නිසා වැරදි කිරීමට බිය ඇති කර ගැනීම පිළිවෙළින් හඳුන්වා තිබෙන්නේ

1. **අත්තුපවාද භය** 2. **පරූපවාද භය**
3. **දණ්ඩ භය** 4. **දුග්ගති භය කියා යි.**

අප කරන වැරදි වෙන කෙනකු නොදැනගත්තත් අපේ සිත දනියි. එම වැරදි කළ නිසා කවදා හෝ අපේ සිත ම අපට දොස් කියනු ඇතැයි අප තුළ බියක් තිබිය යුතු ය. මේ වැරදි වැඩේ මා කළොත් නැවණැතියන්ගෙන්, ගරුදෙගුරුන්ගෙන්, වැඩිහිටියන්ගෙන්, ස්වාමීන් වහන්සේගෙන් දොස් අසන්නට වෙත්දෝයි බියක් තිබිය යුතු ය. එසේ ම මේ ක්‍රියාව නිසා මට ගුරුදෙගුරුන්ගෙන් හෝ රජයෙන් හෝ දඬුවම් විඳීමට සිදුවේදෝයි කියා අප තුළ බියක් තිබිය යුතු ය. එපමණක් නොව මරණයෙන් පසුව අපායේ ඉපදීමට මේ ක්‍රියාව හේතුවේදෝයි සිතා බිය වීමද, අපේ ආරක්ෂාවට හේතු වේ. මේ කුමන බියක් නිසා හෝ වරදින් මිදෙන්නේ නම් එය බෙහෙවින් ම වැදගත් වේ.

ඉහත සඳහන් කවර ආකාර බියක් හෝ පුද්ගලයන් තුළ නැත්නම්, එම වරද පිළිකුල් කිරීමට තරම් ශීලාචාරකමක් නැත්නම් ඕනෑම වැරදි වැඩක් කිරීමට, ඕනෑම අපචාරයක යෙදීමට පුද්ගලයන් පෙළඹීම ස්වභාවිකය. එබඳු අයට මවය කියා හෝ සුළු මවය කියා හෝ නැන්දනිය කියා හෝ දුවය කියා හෝ වෙනසක් නොපෙනෙනු ඇත. ඔවුන් තැනක් නොතැනක් ගැන නොසලකනු ඇත. එබඳු අයට ඕනෑම තැනක ඕනෑම දෙයක් කිරීමට කිසිම ලැජ්ජාවක්, කිසිම බියක් ඇති නොවේ. තිරිසනුන්ට මෙනි. **එබැවින් මිනිස් සමාජය තිරිසන් තත්වයට නොවැටී ආරක්ෂා වීමට නම් විලිබිය දෙක අවශ්‍ය ම ය.** සියලුම දෙනා ඒ උතුම් ගුණධර්ම දෙකින් යුක්ත වෙත්නම් ඔවුන් ජීවත් වන ලෝකය මොනතරම් ධාර්මික වනු ඇත්ද? **මිනිස් ඝාතන, වංචා හා**

දූෂණ, ළමා අපයෝජන, කාම අපචාර ආදී සියල්ල සිදුවන්නේ විලිබිය නැතිව ගිය විට ය. නීතිරීති, සම්ප්‍රදාය, ගුණවත්කම් ආදිය සුරැකෙන්නේද හිරි ඔත්තප් දෙක නිසා ය. එබැවින්ය බුදුරජාණන් වහන්සේ විසින් විලිබිය දෙක ලෝකය ම පාලනය කරන ධර්ම ලෙස හඳුන්වනු ලැබ ඇත්තේ. අපි විලිබිය ඇති දරුවන් වී සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීමට-දායක වෙමු.

භාවිතයට :

1. හිරි සහ ඔත්තප්ප යන දෙකේ වෙනස ඔබේ වචනයෙන් පැහැදිලි කර ලියන්න.
2. හිරි ඔතප් දෙකින් යුක්ත වීම ශිෂ්‍ය ජීවිතයක සාර්ථකත්වයට හේතුවන අයුරු පහදමින් ඔබට කථාවක් පැවැත්වීමට සිදුවුව හොත් ඔබ ඉදිරිපත් කරන කරුණුවල සාරාංශයක් ලියන්න.

## 21 පාඩම

### ලක්සසුන එකලු කළ පඩිරුවන්

රට ජාතිය හා බුදු සසුන රැකගැනීම සඳහා පෙරමුණ ගෙන ක්‍රියා කළේ මෙරට මහා සංඝරත්නයයි. අඳුරු යුගයේ සිංහල බෞද්ධයින්ගේ ගුණ නුවණ දියුණු කර ගැනීමට අවශ්‍ය ධර්ම ඥානය සහ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා උදාර මෙහෙවරක් ඉටු කළ තෙරවරුන් අතර කැපී පෙනෙන තුන් නමක් පිළිබඳව මෙම පාඩමෙන් ඉගෙන ගනිමු.

**හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි**



"ගුරු දේවයාණනි, ඉගෙනීම පිණිස මා මෙරටට පැමිණෙන බව අසා මගේ ඥාති මිත්‍රාදීහු එය විහිළුවක් කොට සිතූහ. රාවණාගේ රටේ වෙළඳාමක් කරනවා මිස ඉගෙන ගන්න දෙයක් හෝ උගන්වන කෙනෙකු හෝ නැතැයි කීහ. ගුරු දේවයාණනි, එහෙත් ඔබගෙන් තබා ඔබගේ ශිෂ්‍ය මාගේ සහෝදර ඥාණිස්සර යතිවරයාණන්ගෙන් අපේ ම භාෂාව වූ සංස්කෘත පවා මට ඉගෙනීමට සිදුවිය. ගුරු දේවයාණනි, මීට වසර පන්සියයකට පෙර ලක්දිව විසූ රාහුල තෙර ඔබ වහන්සේය. එදා ඔබේ අතවැසි රාමචන්ද්‍ර භාරතී වූයේ මා ය."

මෙහි සඳහන් වූයේ ඉන්දියාවේ මහ පඬිවරයෙකු වූ විද්‍යාභූෂණ මැතිඳුන් විසින් කරන ලද ප්‍රකාශයකි. ඒ වෙන කිසිවෙකු ගැන නොව විද්‍යෝදය පිරිවෙනෙහි ආදි කතුවරයන් වහන්සේ වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් පිළිබඳ කරන ලද ප්‍රකාශයකි.

ජාතියේ ආරක්ෂාව සහ බුදු සසුනේ පැවැත්ම උදෙසා උදාර මෙහෙවරක යෙදීමට අවශ්‍ය හැකියාව කුඩා කල සිට ම හික්කඩුවේ නාහිමියන් සතුව පැවතිණ. බුදු දහම පිළිබඳ ගැඹුරු අවබෝධයක් භාෂා ශාස්ත්‍ර පිළිබඳ හසල දැනුමක් උන්වහන්සේ ලබාගත්තේ රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙන ඇසුරෙනි. වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමිපාණන් මෙන්ම බටුවන්තුඩාවේ දේවරක්ඛිත පඬිතුමාත් උන්වහන්සේගේ ගුරුවරුන් ය.

ශ්‍රී සුමංගල නාහිමියන් තුළ පැවති උසස් බුද්ධිමත්බව ප්‍රකට කෙරෙන සිද්ධි උන්වහන්සේගේ චරිතය තුළින් දත හැකිය. එක් අවස්ථාවක සියම් දේශයෙන් පැමිණි භික්ෂූන් වහන්සේලා පිරිසකට පාලි භාෂාවෙන් තොරතුරු විස්තර කර දුන්නේ එම තෙරවරුන් පුදුමයට පත් කරවමිනි. මල්වතු මහා විහාරයේ දී උපසම්පදාව ලබාගැනීමට පළමුව පරිවාර පාලිය කටපාඩමෙන් ඉදිරිපත් කිරීමත් දළදා අෂ්ඨකය නම් කෘතියක් ලියා ඉදිරිපත් කිරීමත් තුළින් උන්වහන්සේගේ විශේෂ හැකියාව ප්‍රකට කරයි. කලක් රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙනෙහි අධිපති ධූරය හෙබවූ ශ්‍රී සුමංගල හිමිපාණෝ 1873 වසරේ දී මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන ආරම්භ කළහ. එය උන්වහන්සේගේ උසස් ශාස්ත්‍රීය හා ශාසනික සේවය ලෙස හැඳින්විය හැකිය. ශ්‍රී සුමංගල හිමිපාණන්ගේ මූලිකත්වයෙන් පවත්වාගෙන ගිය රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙනෙන් සහ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනෙන් දහම් අධ්‍යාපනය ලබා නික්ම ගිය උගත්තු රැසක් වෙති. විශේෂයෙන්ම ඒ අතර අප රටට අගනා සේවයක් කළ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා, වලිසිංහ හරිස්චන්ද්‍රතුමා මෙන්ම සෙන්පති හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ද සඳහන් කළ හැකිය. එතුමන්ලාගේ පුරෝගාමිත්වයෙන් පිහිටුවනු ලැබූ මහාබෝධි සමාගම සහ පරම විඥානාර්ථ බෞද්ධ සමාගම මෙරට බුදු දහමේ පැවැත්ම සඳහා අගනා මෙහෙයක් ඉටුකළ ආයතන දෙකකි. විශේෂයෙන්ම ඉරුදින දහම්

පාසල් ආරම්භ කිරීම සහ බෞද්ධ දරුවන්ට ඉංග්‍රීසි පාසල් පිහිටුවාලීම සඳහා ද ශ්‍රී සුමංගල නාහිමියන්ගෙන් ලැබුනේ අගනා සහායකි.

සිංහල පොතපත සුලභව නොතිබුණ එවැනි අවධියක අත්‍යවශ්‍ය පොත්පත් රාශියක්ම සුමංගල නාහිමියන් විසින් සංස්කරණය කරන ලදී. පාලි මහාවංශ පරිවර්තනය සිදත් සඟරා සන්නය, පාලි වර නැගිල්ල, කාව්‍යශේඛරය හා බාලාවතාර නම් පාලි ව්‍යාකරණ පොත ද ඒ අතර වේ. බත්තරමුල්ලේ ශ්‍රී සුභූති ස්වාමීන් වහන්සේ වැනි තෙරවරුන් විසින් කරන ලද ප්‍රසිද්ධ වාදවල දී අවශ්‍ය කරුණු සපයාදීමෙන් ද සුමංගල නාහිමියන්ගෙන් සිදුවූයේ අගනා මෙහෙයකි.

1827 ජනවාරි 20 වන දින දකුණු පළාතේ හික්කඩුවේ හෙට්ටිගොඩ ගමේ දී උපත ලද හික්කඩුවේ ශ්‍රී සුමංගල ස්වාමීන්ද්‍රයන් වහන්සේ 1911 දී අපවත්වී වදාළහ. උන්වහන්සේගේ ශ්‍රී නාමය දෙස් විදෙස් බෞද්ධයන් අතර සදානුස්මරණීයය.

**රත්මලානේ ශ්‍රී ධර්මාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේ**



දහනවවන සියවසේ අගභාගයේ මෙරට විසූ ශ්‍රේෂ්ඨ පඬිවරයකු වූ බටුවන්තුඩාවේ ශ්‍රී දේවරක්ෂිත පඬිතුමා විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් රත්මලානේ ශ්‍රී ධර්මාලෝක ස්වාමීන් වහන්සේ 'මම ධර්ම ශාලාවක් හදනවා' යනුවෙන් පවසා ඇත. එසේ සඳහන්

කළේ උන්වහන්සේගේ ශිෂ්‍ය රත්මලානේ ශ්‍රී ධර්මාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේ පිළිබඳව ය.

කුඩා කාලයේදී ම තම ගුරු හාමුදුරුවන්ගේ පුස්කොළ පොත් අව්වේ තබා වේලා ගැනීමට උදව් වූ ධර්මාරාම හාමුදුරුවෝ එම පුස්කොළ පොත් කියවා දැනුම රැස්කර ගැනීමට තරම් උනන්දුවක් දැක්වූහ.

අවුරුදු 14 තරම් ලාබාල වියේදී ම සිංහල පාලි සංස්කෘත භාෂා පිළිබඳ මනා දැනුමක් උන්වහන්සේ තුළ තිබිණි. කුඩා කල සිටම කියවීමටත් දේශන පැවැත්වීමටත් උන්වහන්සේ දක්ෂයෙක් වූහ. විසිවන විය තරම් වනවිට භාෂා ශාස්ත්‍රය පිළිබඳ හසල දැනුමක් ඇතිව සිටි උන්වහන්සේ සංස්කෘත ශ්ලෝක නිර්මාණය කිරීමෙහි දක්ෂතාවක් ඇති තෙර නමක් වූහ.

1887 දී විද්‍යාලංකාර පරිවෙනාධිපති ධූරයට පත් ශ්‍රී ධර්මාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේ පිරිවෙන අංග සම්පූර්ණ ආයතනයක් බවට පත් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කළහ. පැරණි පොතපත සංශෝධනය කිරීමෙහි නිරත වූ උන්වහන්සේ තොටගොමු අවධියෙන් පසුව ශාස්ත්‍රීය පර්යේෂණයන්හි යෙදුණ මහා පඬිවරයන් අතර කැපී පෙනුණු තෙර නමකි.

ශ්‍රී ධර්මාරාම මාහිමිපාණන් වහන්සේගෙන් සිදුවූ අගනා ම ශාස්ත්‍රීය මෙහෙවර නම් සිංහල භාෂාවෙහි න, ණ, ල, ළ යන අක්ෂර ව්‍යවහාරය පිළිබඳ විශේෂ රීතීන් පැහැදිලි කිරීමයි. බොහෝ පඬිවරුන්ගේ ද ප්‍රශංසාවට ලක් වූ මේ කාර්යය නිසා පැරණි සිංහල පොත්වල පැවති ඇතැම් දෝෂ සහිත පාඨ සංශෝධනය කර ගැනීමට අවස්ථාව සැලසිණි. පැරණි සිංහල වියරණ ග්‍රන්ථයක් වන සිදත් සඟරාවට ශ්‍රී ධර්මාරාම නාහිමියන් විසින් කරන ලද විවරණය උගතුන් අතර ප්‍රසාදයට පාත්‍ර වූවකි. ලාංකික කිවිවරයෙකු හැටියට සැලකෙන කුමාරදාස කිවියාගේ ජානකී හරණ මහාකාව්‍යයෙහි ඒ වනවිට ඉතිරිව පැවතියේ සන්නය පමණකි. ශ්‍රී ධර්මාරාම නාහිමියන් වහන්සේ එම සන්නය ප්‍රයෝජනයට ගනිමින් නැවත සංස්කෘත ශ්ලෝක සම්පූර්ණ කොට පෙළ ද සකස් කළහ. මෙය ධර්මාරාම නාහිමියන් තුළ පැවති සකුබස පිළිබඳ හසල දැනුමත්, කවිත්වයත් ප්‍රකට කරන්නකි.

ශ්‍රී ධර්මාරාම නාහිමියන් විසින් ආරම්භ කොට පවත්වාගෙන යනු ලැබූ "සත්‍ය සමුච්චය" නම් ශාස්ත්‍රීය සඟරාව උන්වහන්සේගේ ධර්ම ශාස්ත්‍රීය සේවාව ප්‍රකට කරන්නක් විය. එකල මතභේදයට ලක්ව පැවති බොහෝ කරුණු පිළිබඳව වාද කිහිපයක් ගැන සත්‍ය සමුච්චයෙහි සඳහන් වෙයි. බුද්ධ වර්ෂ ව්‍යවහාර වාදය, පාරුපන වාදය, න, ණ, ල, ළ ව්‍යවහාර වාදය එවැනි වාද කීපයකි.

ප්‍රාචීන භාෂෝපකාර සමිතියේ සහ රාජකීය ආසියාතික සමිතියේ සාමාජිකත්වය දරමින් ශ්‍රී ධර්මාරාම ස්වාමීන් වහන්සේ එම සමිතිවලින් බලාපොරොත්තු වූ සේවාවන් ඉටුකිරීමට කැපවීමෙන් ක්‍රියා කළහ. දෙස් විදෙස් ගිහි පැවිදි බෞද්ධයන් අතර අතිශය ගෞරවයට ලක්ව වැඩ විසූ රත්මලානේ ශ්‍රී ධර්මාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේ ආරම්භ කළ සේවාවන් පවත්වාගෙන යෑමට තරම් දක්ෂ සිසු පරපුරක් තනා 1918 මැයි මස 3 වන දා අපවත්වී වදාළහ.

**වස්කඩුවේ ශ්‍රී සුභූති නාහිමි**



ගුණවත්, නැණවත් දරුවන් ඇති දේශය ලෝවැසියන්ගේ ගෞරවයට පාත්‍ර වෙයි. 1880 දී එංගලන්තයේ සියම් තානාපතිවරයෙක් ලංකාවට පැමිණි අවස්ථාවක එක්තරා ස්වාමීන් වහන්සේ නමක් මුණගැසීමට පැමිණියේ ය. උන්වහන්සේගේ ගුණ නුවණ කෙරෙහි පැහැදීමට පත්ව නැවත 1896 දී මෙරටට පැමිණි එම කුමාරයා ජිනවංශ නමින් එම

තෙරණුවන් සමීපයෙහි පැවිදි විය. උන්වහන්සේ නම් අප මෙහිදී හඳුන්වා දෙනු ලබන වස්කඩුවේ ශ්‍රී සුභූති ස්වාමීන් වහන්සේය. උන්වහන්සේට රාජගුරු යන ගෞරව නාමය ලැබුණේත් උන්වහන්සේ වෙත රාජ කුමාරයකු පැවිදි වූ නිසාය.

ලාභ, කීර්ති, ප්‍රශංසා ආදිය අපේක්ෂාවෙන් තොරව භික්ෂූන් වහන්සේ නමකගේ වගකීම හරිහැටි අවබෝධ කරගෙන උසස් ශාස්ත්‍රීය සේවයක යෙදුනු මහ පඬිවරයෙකි, වස්කඩුවේ ශ්‍රී සුභූති ස්වාමීන්ද්‍රයන් වහන්සේ. 1835 වර්ෂයේ වස්කඩුවේ සම්භාවනීය පවුලක උපත ලද කුමරුවා මූලික අධ්‍යාපනය ලැබීමෙන් පසුව කලමුල්ලේ ශ්‍රී සුමනාරාම විහාරස්ථානයේ දී වස්කඩුවේ ශ්‍රී සුභූති නමින් පැවිදි බිමට පත්විය. අනතුරුව ඉඳුරුවේ ශ්‍රී සුමංගල හිමියන් වෙතින් සිංහල, පාලි මෙන්ම සකුබසත් උගත්තේය. විශේෂයෙන්ම සකුබස හදාරන ලද්දේ බටුවන්තුඩාවේ දේවරක්ඛිත පඬිතුමන් වෙතිනි. එදා අද මෙන් පොත පත සුලභව පැවති යුගයක් නොවී ය. එබැවින් උන්වහන්සේ සියතින්ම පුස්කොළ පොත් පිටපත් කර ගනිමින් ස්ව උත්සාහයෙන් යුක්තව ආගම ධර්මය හා භාෂා ශාස්ත්‍ර ඉගෙන ගත්හ. "උත්සාහය හා වීර්යය ජීවිතය ආලෝකවත් කරයි" යන ප්‍රකාශය සැබෑ කරමින් වැඩිකල් නොගොස්ම ශ්‍රී සුභූති ස්වාමීන් වහන්සේ කීර්තිමත් පඬිවරයෙකු බවට පත්වූහ.

ශ්‍රී සුභූති ස්වාමීන් වහන්සේ පෙරදිග සංස්කෘතික උරුමය අපරදිගුන්ට හඳුන්වා දුන්හ. සිංහල, පාලි සංස්කෘත ආදී පෙරදිග භාෂාවන් ගැඹුරු දර්ශන ශාස්ත්‍ර ප්‍රකාශ කළ හැකි භාෂා බව බටහිර පඬිවරයන්ට පෙන්වා දුන්හ. බුදු දහමට එරෙහිව නැගෙමින් ආ මිෂනාරී අභියෝගවලට විරුද්ධව සටන් කළ වීරවරයන්ට නොමඳව තම හැකියාවෙන් ධෛර්යය දුන්හ.

ශ්‍රී සුභූති තෙරණුවන් වැඩසිටි ආරාමය පෙරදිග භාෂා, ශාස්ත්‍ර ඉගැන්වීමට සුදුසු අධ්‍යාපන ආයතනයක් බවට පත් කළේය. භාෂා ඉගෙනීමට එන ශිෂ්‍යයන්ට ඉතාමත් සුදුසු පරිසරයක් ගොඩනැගූහ.

ලංකාවේ සිවිල් සේවකයකුව සිටි බ්‍රිතාන්‍ය ජාතික චිල්ඩර්ස් පඬිතුමා ශ්‍රී සුභූති ස්වාමීන් වහන්සේගෙන් පාලි භාෂාව ඉගෙන පාලි අකාරාදියක් ද සම්පාදනය කළේය. සියම් රජයේ ආරාධනයෙන් මහ පිරිත් පොත ක්‍රමවත් ලෙස සංස්කරණය කොට සියම් අකුරෙන් මුද්‍රණය කරවීමට සැලැස්වීම සුභූති නාහිමියන්ගේ කීර්තිය විදෙස් රටවල පැතිරයාමට හේතු විය.

පොතපත ලිවීමට මෙන්ම බෞද්ධ දර්ශනයේ ගැටලුතැන් නිරාකරණයට උන්වහන්සේ දැරූ උත්සාහය ප්‍රශංසනීයයි. ගයිගර්, ඕල්ඩන්බර්ග්, මැක්ස්මුලර් වැනි යුරෝපීය උගතුන් සුභූති තෙරණුවන්ගේ පණ්ඩිත භාවය පිළිබඳව පැහැදීමට පත්ව සිටි බව වාර්තා වෙයි.

මිගෙට්ටුවත්තේ ගුණානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් කරන ලද පානදුරාවාදය සඳහා ද විශේෂ සහායක් ශ්‍රී සුභූති ස්වාමීන් වහන්සේගෙන් ලැබිණි. එම වාදයේ දී ගුණානන්ද හිමියන්ට වාදය සඳහා අවශ්‍ය වූ ධර්ම කාරණා ත්‍රිපිටකයෙන් උපුටා දීමෙන් වාදය ජයගැනීමට මහඟු සේවයක් ඉටු කළහ. ජාතියේ පිනෙන් අප රටට පහළ වූ ඒ ශ්‍රේෂ්ඨ පඬිවරයාණගේ උදාර චරිතයෙන් අපේ ජීවිතයට ආදර්ශ ගැනීමට අදිටන් කර ගනිමු.

**ක්‍රියාකාරකම්:**

1. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, රත්මලානේ ශ්‍රී ධර්මාරාම නාහිමි සහ වස්කඩුවේ ශ්‍රී සුභූති නාහිමි යන තෙරවරුන්ගේ චරිතවල දක්නට ලැබුණු විශේෂතා ලැයිස්තුගත කරන්න.
2. රත්මලානේ ශ්‍රී ධර්මාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් කරන ලද සේවාවන් හතරක් හඳුන්වා දෙන්න.
3. වස්කඩුවේ ශ්‍රී සුභූති ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ උපුටා දක්වන්න.
4. මෙම පාඩමේ සඳහන් තෙරවරුන්ගේ චරිත ඔබ අගය කරන්නේ ඇයිදැයි සඳහන් කරන්න.
5. පාඩමේ සඳහන් තෙරවරුන්ගේ ඡායාරූප සොයා පිටපත් කරන්න.

## 22 පාඩම

# සුපසන් බොදු නිවසක්

මිහිඳුපුර මෙත්මල්යාය ගම්මානයට මා ගියේ අපේ පාසලේ බුද්ධ ධර්මය විෂයය ඉතාමත් සාර්ථකව උගන්වමින් දිගු කලක් සේවය කර සිය ගම් පළාතට මාරුවීමක් ලබාගෙන ගිය කල්‍යාණ ප්‍රිය සුගතරත්න මහතා සමග සුහද හමුවක් සඳහාය. බසයෙන් බැස ප්‍රධාන පාරෙන් හැරී මිතුරා දන්වා තුබුණු මග සලකුණු ඔස්සේ දෙවැට දිගේ ගමන් කළේ ගම්බද පරිසරයේ මිහිරියාව විඳ ගනිමිනි.

සුගතරත්න මහතාගේ නිවස පිහිටා තුබුණේ බැලූ බැල්මට පන්සලකට වුවද උචිත පරිසරයකය. නිවස කරා යන මග දෙපස විවිධ මල් වර්ග රෝපණය කර අලංකාර පරිසරයක් ගොඩනගා තිබිණි. ලස්සනට පිළිවෙළට ඇමඳ තුබුණු පාරේ පොල් අතු රටාව ඒ වන විටත් සම්පූර්ණයෙන්ම මැකී ගොස් නොතිබිණි. නිවස පිහිටි ඉඩම කුඩා වුවද එය මනා සැලසුමක් ඇතිව සංවර්ධනය කර ඇති බව පැහැදිළි වුයේ නිවසට යන පාර දෙපස බිම් තීරුවල මල් පමණක් නොව එළවලු බෙහෙත් පැළ ආදිය ද රෝපණය කර තිබුණු බැවිනි.

මා දුටු ගමන්ම සිනාමුසු මුහුණින් යුතුව කල්‍යාණප්‍රිය මිදුලට පැමිණියේ ධර්මේ, ආයුබෝවන් තෙරුවන් සරණයි, යන ආශිර්වාදය පළ කරමිනි. මා ද පෙරලා ආයුබෝවන් තෙරුවන් සරණයි කීයේ එය වඩාත් ගැළපෙන අර්ථ සම්පන්න ආශිර්වාදයක් ලෙස මුළු හදවතින්ම පිළිගෙන ඇති බැවිනි. ඔහු අපේ පාසලේ දී දරුවන්ට ඉගැන්වූ බොදු සිරිත් නොකඩ කොට තමන්ද මනාව අනුගමනය කරන බවට එය හොඳම සාධකයකි.

කල්‍යාණප්‍රියගේ නිවසේ නාමය ලෙස සටහන්ව තුබුණේ "ප්‍රියංවදා" යන්නය. ප්‍රධාන දොරටුවෙන් ඇතුල් වන විට ම ඉදිරිපස බිත්තියේ ද දකින්නට ලැබුණේ "ආයුබෝවන් තෙරුවන් සරණයි"

යන ආශීර්වාදය කලාත්මකව ලියන ලද පුවරුවකි 'එන්න වාඩිවෙන්න' යන කාරුණික ආරාධනාව කරමින් මැද සාලයට මා කැඳවාගෙන ගියේ මිතුරු සෙනෙහස මැනවින් විදහා පාමිනි. 'ස්තූති යි බොහොම පින්' කියමින් මා වාඩි වුයේ සැටියේ ඉඳගෙන සිටි වයෝවෘද්ධ පියතුමාට දණගසා වැඳීමෙන් අනතුරුවය. සමාවෙන්න අප්පච්චිත් එක්ක ටිකක් කථා කරන්නකෝ මම විනාඩියෙන් එන්නම්. කියූ මිත්‍රයා ගේ ඇතුළට ගොස් මොනවදෝ යමක් හෙමින් කියා ආපසු පැමිණ මා ළඟින්ම වාඩි වුණේ ය. පසුව මට තේරුම් ගියේ මගේ පැමිණීම ගැන සිය බිරිඳ දැනුවත් කිරීම අල්ප ශබ්දතාවෙන් යුතුව කළ බවය. මැද සාලයේ සිට මුළුතැන් ගෙට ඇසෙන සේ හඬ නැගුයේ නම් මහත් ඝෝෂාකාරී බවක් දැනෙනු ඇත. අල්ප ශබ්දතාව හා සංවරශීලී බව බෞද්ධ නිවසක තිබිය යුතු ම ලක්ෂණයක් බව කල්‍යාණප්‍රිය නිතර පවසන දෙයකි. එබඳු නිවසක ගුවන්විදුලි යන්ත්‍රය රූපවාහිනී යන්ත්‍රය ක්‍රියාත්මක කළත් එය කරන්නේ තම නිවසට තම කාමරයට පමණක් ඇසෙනසේය.

කල්‍යාණප්‍රියගේ බිරිඳ කල්‍යාණී ප්‍රියංවදා සාලයට පැමිණියේ තේ එකකුත් රැගෙනය. ආයුබෝවන් තෙරුවන් සරණයි කියමින් එය මට පිළිගැන් වුයේ මා පැමිණි විගස ම සාලයට පැමිණීමට නොහැකි වීම ගැන කණගාටුව පළ කරමිනි. ඇය මුළුතැන්ගෙයි ආහාර පිළියෙල කිරීමේ කටයුතුවල නිරතව සිටි බව මම දැන ගතිමි. මා තේ එක භාර ගත්තේ 'බොහොම ස්තූතියි පින් සිදුවේවා' යි කියමිනි. කල්‍යාණ ප්‍රියගේ පියතුමන් දෙසට හැරුණු ප්‍රියංවදා 'අප්පච්චිටත් තේ එකක් ගෙනෙන්නදැයි' ඉතා කාරුණිකව විමසූ විට එතුමා කියා සිටියේ 'එපා දුවේ දැන්ම ඕනෑ නැහැ' කියා යි. තේ එක පානය කරන ගමන් 'කෝ පුතාලා' යන ප්‍රශ්නය මා යොමු කළේ දෙදෙනා වෙත ම ය. 'අද දහම් පාසල් දවසනේ' දහම් පාසල් දවසට ගෙදර මොන වැඩ තුබුණත් පුතාලා නවත්වා ගන්න බෑ. හරිම ආශාවෙන් යන්නේ. ගෙදරදීත් බුද්ධ වන්දනා කරන්න, පිරිත් කියන්න, බණ අහන්න හරිම කැමතියි. සමහර ළමයින් නම් ටිකක් ලොකු මහත් වෙන විට දහම් පාසල් යෑමට වැඩි උනන්දුවක් නැහැනේ. ඒකට අපේ දෙන්නා පුදුම උනන්දුවකින් දහම් පාසල් යන්නේ' ඒ ප්‍රියංවදාගේ වචන ය. 'හොඳ අම්මලාගේ තාත්තලාගේ දරුවෝ එහෙම තමයි' ඒ මගේ වචන ය.

දහම් පාසල ඇරී නිවසට පැමිණි චින්තකයි දර්ශනායි පළමුව කළේ පොත් ටික මේසය මත තබා 'ආයුබෝවන් තෙරුවන් සරණයි' යනුවෙන් මට ආශීර්වාද කර දණගසා වැඳීම ය. ඒ දෙදෙනා ම අපේ පාසලේ දී මගෙන් ඉගෙන ගත් අයයි. 'බුදු සරණයි පුතේ' කියා ආශීර්වාද කළ මම ඔවුන් සඳහා රැගෙන ගිය තෑගි බෝග පිරිනැමුයෙමි. ඔවුන් ඒවා භාර ගත්තේ ස්තුතියි බොහොම පින් යන සුපුරුදු ආශිර්වාදය කරමිනි. දරුවන් සමග කථා කරන ගමන් මගේ දෑස් යොමු වුයේ සාලයේ බිත්ති දෙසටය. ඒවායේ අශෝභන පින්තූර කිසිවක් නොමැත. එහි දක්නට ලැබුණේ පැරණි චිත්‍ර ශිල්පීන් විසින් අඳින ලද බුද්ධ චරිතයේ වැදගත් සිද්ධි නිරූපනය වන චිත්‍රය. ශාලාවේ කෙළවරේ කුඩා කාමරය හැඳින්වී තුබුණේ 'බුදු කුටිය' කියාය. පවුලේ සැම දිනපතා වන්දනා කරන තැනයි ඒ.

දිවා ආහාරයට අපි සියලු දෙනාම කෑම කාමරයට ගියෙමු. එහි බිත්තියක එල්ලා තුබුණු පුවරුවක සටහන් වුයේ 'විනීතව ආහාර ගනිමු' කියායි. එය ආගන්තුකයන්ගේ අවධානය පිණිස එල්ලන ලද්දකැයි මා නිගමනය කළේ කල්‍යාණප්‍රිය පවුලේ අයට නම් එබඳු සිහිපත් කිරීමක් අනවශ්‍ය බව පැහැදිලිව දක්නට ලැබුණු බැවිනි.

පළමුව ම ආහාර බෙදුණේ කල්‍යාණප්‍රියගේ පියාණන්ගේ පිඟානටය. එය සිදුවුයේ පොඩි පුතා අතිනි. තමන්ගේ පිඟානට පමණක් ආහාර බෙදා නොගෙන අනෙක් අයගේ පිඟන්වලටත් යමක් බෙදමින් ආහාර ගැනීම එම කෑම මේසයේ සිරිත විය. කල්‍යාණප්‍රිය නම් එදා වැඩි අවධානයක් යොමු කළේ මට සංග්‍රහ කිරීම ගැනය.

භික්ෂූන් වහන්සේ සඳහා දේශනා කර ඇති සේඛියා ධර්ම ඇසුරෙන් ගොඩනගා ගත් ආහාර ගැනීමේ ආචාර ධර්ම එම කෑම කාමරය තුළ ඉතා මැනවින් ක්‍රියාත්මක විණි. ඇතැමුන් ආහාර ගන්නා විට ඇසෙන චපු චපු, සූරු සූරු වැනි අමිහිරි ශබ්ද එහි නොවීය. ආහාර ගන්නා ගමන් හෙමිහිට කථා කළත් ආහාර මුඛයෙහි තබාගෙන කථා නොකිරීමේ වැදගත් බෞද්ධ ලක්ෂණය දරු දෙදෙනා තුළ ද දක්නට ලැබිණි.

ඉඳුල් අතින් භාජන නොඇල්ලීම, අත ලෙව නොකෑම, තොල් ලෙව නොකෑම, මේසය අපිරිසිදු වන සේ ආහාර නොගැනීම, වැනි විරිත් එම කෑම මේසයේ ක්‍රියාත්මක වන විට ඇත්තට ම මේ පවුල මොන තරම් ආචාරශීලී ද ආදර්ශ සම්පන්නදැයි මම මට ම කියා ගතිමි.

දිවා ආහාරයෙන් පසු චින්තකට සහ දර්ශනට අවශ්‍ය වූයේ තම නිවසේ බාහිර පරිසරය අලංකාර කිරීමට තමන් දායක වී ඇති ආකාරය මට පෙන්වීමටය. පොඩිපුතා, දර්ශන පළමුව ම මට ආරාධනා කළේ නෙලුම් පොකුණ නැරඹීමටය. ප්‍රියංවදා හැර අපි සියල්ලෝ ම එහි ගියෙමු. පොඩි පුතා අත කිරි අල කොළයක් ද විය. ඒ පොකුණේ සිටින මාලුවාගේ කෑමය. පොඩි පුතාගේ නෙළුම් පොකුණ බෙහෙවින් අගය කළ මගේ ඇස ඊළඟට යොමු වූයේ 'ඔසු උයන' යන නාම පුවරුව දෙසටය. ඒ ඔසු උයන චින්තකගේය. එහි වූයේ වඩා උසට නොවැඩෙන බෙහෙත් පැල වර්ග ය. බලන කෙනෙකුට බෙහෙත් පැලය හැඳින ගැනීමට පහසු වන පරිදි කටුකුරුඳු, කටු කරෝසන, ඉඟුරු ආදී නාම පුවරු එහි දක්නට ලැබිණි. අවශ්‍ය අයට බෙහෙත් පැළ වර්ග ලබා දී නිරාමිස සතුටක් ලැබීම තම අරමුණක් බව චින්තක පැවැසීය.

අසල තණ තිල්ලේ මදවේලාවක් සතුටු සාමීචියේ යෙදී සිටි අප යළි නිවසට පැමිණියේ මා ඉක්මනින් පිටත් විය යුතු බැවිනි. සුහද ආගන්තුක සත්කාර පිළිබඳ කල්‍යාණප්‍රිය පවුලේ සැමට කාරුණික ස්තුතිය පළ කළ මට ඔවුන් සමු දුන්නේ පාරේ කඩුල්ල තෙක් පසුගමන් කරමිනි.

**ක්‍රියාකාරකම්:**

> **පන්තිය කුඩා කණ්ඩායම් තුනකට බෙදී පහත සඳහන් මාතෘකාවන්ගෙන් ගුරුතුමා තමන්ට පවරන මාතෘකාවට මෙම පාඩම් ඇසුරෙන් කරුණු රැස්කර වාර්තාවක් ලෙස පන්තියට ඉදිරිපත් කරන්න.**

(1) බෞද්ධ නිවසක ඇතුළත සහ අවට පරිසරය පිරිසිදුව, විධිමත්ව හා ආදර්ශ සම්පන්නව තබා ගැනීමට අපට කළ හැකි දේ මොනවාද?

(2) බෞද්ධ නිවසක කථාබහ කිරීමේ දී තිබිය යුතු ආචාරශීලී බව සහ සහයෝගය කල්‍යාණප්‍රිය මහතාගේ නිවසෙහි දක්නට ලැබෙන අයුරු නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

(3) ආචාරශීලී කෑම මේසයක ස්වභාවය මෙම පාඩම ඇසුරෙන් පෙන්වා දෙන්න.

## 23 පාඩම

### කිසිම සතකු නොමරමු අපි නොමරවමු

'ඉගෙන ගන්න දේ අනුව ක්‍රියා කරන්න කීවාට හැම තිස්සෙම එහෙම කරන්න බැහැ නේද'යි විමල් ඇසුවේය.

'ඇයි එහෙම කියන්නෙ, මොනවද කරන්න බැරි? සුගත්ගේ ප්‍රශ්නය විය.

'සතුන් මරන්න එපා කීවට ඇඟේ මදුරුවෙක් වහන කොට නොමරා ඉන්න බැහැ' විමල්ගේ පිළිතුර විය.

'ඔව් ඩෙංගු හැදිල අපේ ගේ කිට්ටුව ළමයෙකුටත් අමාරුයි. මදුරුවන් මරන්නෙ නැතුව ලෙඩ බෝ වෙන්න අරින්න බැහැ' රාජිත එය අනුමත කළේය.

'මදුරුවන් මරන්නෙ නැතුව ලෙඩ බෝවෙලා මිනිසුන් මැරෙන එක හොඳද? ජයන්ත ප්‍රශ්න කළේය.

'අපි කිසි කරදරයක් කරන්නෙ නැතුව සතුන් අපට කරදර කරනව නම් උන් මරණ එක වැරදි ඇයි?' විමල්ගේ තර්කය විය.

මේ අවස්ථාවේ පන්තියට පැමිණි ගුරුතුමාට සිසු දරුවන් විසින් තමන්ගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන ලදී. ගුරුතුමා කරුණු පැහැදිලි කළේය.

'බොහොම හොඳයි සාකච්ඡා කර කරුණු තේරුම් ගන්න එක. මිනිසාගේ යහපත සඳහා සතුන් මැරීම නරක නැතැයි උගන්වන සමහර ආගම් තියෙනවා. ඒත් බුදු දහම උගන්වන්නෙ කිසි සතකු මැරීම නරක බවයි.'

'අපට තේරුම් ගන්න බැරි නරක ඇයි කියල' යි ජයන්ත තම අදහස ඉදිරිපත් කළේය.

'ඉන්න. මම එයට හේතුව කියන්නම්. දිනක් බුදු හාමුදුරුවෝ මේ කරුණ වේළුද්වාර කියන ගමේ මිනිසුන්ට පැහැදිලි කරලා දුන්නා.

හැම මිනිසාම කැමතියි නේද ජීවත් වෙන්න. ඒ වගේම අකමැති නේ ද මැරෙනවාට. ඒ හැම දෙනාම සැප ලබන්නත් කැමතියි නේද. දුක් කරදර ලැබීමට අකමැති නේද?

එය එසේම බව හැම දෙනාම පිලිගත්හ.

'ඒත් අපි කථා කරන්නෙ සතුන් ගැන නෙ.' විමල් කීය.

'ඔව් මිනිසුන් වගේම තමයි, සතුනුත් සිතන්නෙ.'

'සතුන් සිතන හැටි ගැන අපි දන්නෙ නැහැනෙ' ඒ රාජිතගේ වචන යි.

'අපේ බල්ලට ගහනවට ඌ කැමති නැහැනෙ'
ඌව මරණවට කොහොමටවත් කැමති නැති බව ඒකෙන්ම පේනවනේ.' සුගත් විස්තර කළේය.

'අපේ බල්ල වගේ තමයි අනෙක් බල්ලනුත්.
බල්ලන් විතරක් නෙවෙයි සැම සතාමත් එහෙම තමයි. ගුරුතුමා පැහැදිලි කර දුන්නේය.

'දැන් නම් තේරෙනවා සතුන් මැරීම වැරදියි කියන එක' විමල් කීවේ ය.

'මේ කරුණු සලකා බලා තමයි බුදු හාමුදුරුවො දේශනා කළේ තමන් උපමාවට ගෙන අන් අය ඝාතනය නොකරන්න කියලා' ගුරුතුමා තවදුරටත් අවධාරණය කළේය.

මේ කතාබහ අසාගෙන මෙතෙක් වෙලා නිහඬව සිටි චරිත්, ඉල්ලා සිටියේ තමන් උපමාවට ගන්නා සැටි තව ටිකක් විස්තර කරන ලෙසයි.

"බුදු හාමුදුරුවෝ එය මේ විදියට පැහැදිලි කළා. මෙසේ සිතන්න. මම ජීවත් වීමට කැමතියි. නොමැරී සිටීමට කැමතියි. සැප ලැබීමට කැමතියි. දුකට අකමැතියි. එසේ කැමති මා, කිසිවකු විසින් මරනු ලබනවා නම් එය මට අප්‍රිය කරුණක්. ඒ ආකාරයට ම සිතන අන් අයද මා විසින් මරනු ලැබීම ඔවුනට අප්‍රිය කරුණක්. මට අප්‍රිය වන, අමනාප වන කරුණක් මා අන් අයට කරන්නේ කෙසේද? එසේ තමා උපමා කොට සිතා ප්‍රාණ ඝාතයෙන් වළකියි. අනුන් ද ප්‍රාණ ඝාතයෙහි යෙදීමෙන් වළක්වයි. ප්‍රාණ ඝාතයෙන් වෙන්වීමේ ගුණ ද කියයි. මෙසේ තුන් ආකාරයකින් පිරිසිදුව ත්‍රිකෝටි පාරිශුද්ධව ප්‍රාණ ඝාතය අත්හරියි."

'දැන් මේ දරුවන් හැමදෙනාට ම පැහැදිලිනේ ද, තමා උපමාවට ගෙන අන් අයට හිංසා පීඩා නොකර, අන් සතුන් නොමරා සිටීමේ පිළිවෙත ? මෙය අත්තූපනායික ධම්ම පරියාය යනුවෙන් හැඳින්වෙනවා.'

'අතීත් වැරදිවලින් වෙන් වී සිටීමේත් බෞද්ධ පිළිවෙත මෙය ම තමා. එහෙත් මෙහි දී අපි විශේෂයෙන් කතා කරන්නේ ප්‍රාණ ඝාතයෙන් වෙන්වීම ගැනයි. එය අප දිනපතා සමාදන් වන පංචශීලයේ පළමුවන ශික්‍ෂා පදයයි.

'මේ දරුවන්ට, ඒ ගැන තව ප්‍රශ්න තිබෙනව ද?'

එතකොට, මදුරුවන් නොමරා ලෙඩ බෝවෙන්න අරින එක හොඳද කියල තවම තේරෙන්නෙ නැහැ.' රාජිත කීවේය.

'ඔව් ඒකට අපි විසඳුමක් සොයා ගන්න ඕනෑ; හැබැයි බෞද්ධයින් වගේ. කාටවත් කියන්න පුළුවන් ද, එයට කරන්න ඕනෑ මදුරුවන් මරා දමන එක ද වෙන දෙයක් ද කියලා ?

'මදුරුවන් මරන්න, මරන්න තව තවත් එනවනෙ. ඒක එහෙම ඉවර කරන්න බැහැනෙ.' යි චරිත් කීවේය.

"බොහොම හොඳයි. මදුරුවන් මරන එක නියම පිළිතුර නෙවෙයි. එහෙනම් මොකද කරන්න පුළුවන්. පන්තියේ දරුවෝ කිහිප දෙනෙක් ම එකවර මෙසේ කියා සිටියහ.

'මදුරුවන් බෝවෙන්න ඉඩ තියෙන තැන් නැති කරන්න ඕනෑ.'

"හරි ඒක තමයි කළ යුතු. මදුරුවන් නැති වෙන්නෙ මදුරුවන් ඇතිවෙන තැන් නැති කළොත් පමණයි. මදුරුවන් බෝවෙන තැන් හදන්නෙත් අපි තමයි. ඒක තේරුම් ගෙන ඒ තැන් නැතිකර දැම්මොත් මදුරු ප්‍රශ්නය ඉවරයි. බෞද්ධ පිළිතුරත් එයයි. අනතුර ඇතිවන හේතුව සොයා එය නැතිකර දැමීමයි."

තව මොනවත් දැන ගන්න තියෙනව ද?

"ඉස්සර වෙලා කළ විස්තරයෙ තිබුනනේ තුන් ආකාරයකින් පිරිසිදු වීම ගැන. ඒක පැහැදිලි මදි." විමල්ගේ අදහසය.

එයත් අපි හොඳින් දැන ගන්න ඕන කාරණයක්. මේ ගැන බුදු හාමුදුරුවො විස්තර කර දී ඇත්තේ මෙහෙමයි.

1. තමන් සතුන් නොමැරීම.
2. අනුන් ලවා සතුන් නොමැරවීම හා ඒ අය සතුන් මැරීමෙන් වැළැක්වීම.
3. සතුන් මැරීම අනුමත නොකිරීම හා සතුන් නොමැරීමේ ආනිශංස කියා දීම.

ත්‍රිකෝටික පාරිශුද්ධි සීලය කියන්නෙ මේ විදියට තුන් ආකාරයකින් සිල්වත් වෙනවාටයි.

"හොඳයි. අද පාඩමෙන් ඉගෙන ගත් කරුණු ප්‍රයෝජනයට අරගෙන, දැන් මේ පළාතෙත් පැතිරිලා තියෙන මදුරු ප්‍රශ්නයට අපි බෞද්ධයින් වශයෙන් හොඳ විසඳුමක් සොයමු."

ළමයි ගුරුතමා සමග සාකච්ඡා කිරීමෙන් පසු මේ තීරණයට එළඹුණහ.

1. පන්තියේ ශිෂ්‍යයින් සහයෝගයෙන්, එක එක ශිෂ්‍යයාගේ ගෙවත්තේ මදුරුවන් බෝවිය හැකි තැන් පිරිසිදු කිරීම.

2. අසල්වැසි ගෙවල්වල අයට ඔවුන්ගේ වතුවල ඇති මදුරුවන් බෝවිය හැකි තැන් පෙන්වා දී ඒ තැන් පිරිසිදු කරවීම සහ එයට ශ්‍රමදානයෙන් උදව් කිරීම.

ඊ ළඟ සති අන්තයේ සිට එයට සහභාගි වීමට සියලු දෙනා ම ඉතා සතුටින් එකඟ වූහ.

**ක්‍රියාකාරකම්:**

1. සතුන් මැරීම වරදක් බවට දැක්විය හැකි හේතු මොනවා ද?
2. ත්‍රිකෝටි පාරිශුද්ධි සීලය හඳුන්වා දෙන්න.
3. අත්තූපනායික ධම්මපරියාය අනුව මුසාවාදා වේරමණී ශික්ෂාපදය ආරක්ෂා කරන ආකාරය පෙන්වා දෙන්න.
4. ශිෂ්‍යයින් කිරීමට තීරණය කරගත් ශ්‍රමදානයේ දී ත්‍රිකෝටි පාරිශුද්ධිය සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

# 24 පාඩම

## කඨින පූජෝත්සවය

අපේ විහාරස්ථානවල උත්සව ශ්‍රීයෙන් පැවැත්වෙන පින්කම් අතර කඨින පින්කමට විශේෂ තැනක් හිමි වෙයි. එක් විහාරස්ථානයක වසරකට පැවැත්විය හැක්කේ එක් කඨින පූජෝත්සවයක් පමණකි. එය ද කළ හැකි වන්නේ වප් පුර පසළොස්වක පොහොය සහ ඉල් පුර පසළොස්වක පොහොය අතර කාලයේ ය. ඒ කාලය හැඳින්වෙන්නේ චීවර මාසය කියා යි. එනම් සිවුරු පූජා කරන මාසය යි. අනෙක් සිවුරු පිරකර වසරේ ඕනෑම කාලයක පූජා කළ හැකි නමුත් කඨින සිවුරක් පූජා කළ හැක්කේ චීවර මාසය තුළ පමණකි. එය කළ හැකි වන්නේ ද අදාළ පන්සලේ කඨින සිවුරක් භාර ගැනීමට සුදුසුකම් ඇති හාමුදුරුනමක් වැඩසිටියහොත් පමණකි. උන්වහන්සේට තිබිය යුතු ප්‍රධාන ම සුදුසුකම වස් කාලය පුරාම එම විහාරස්ථාන පරිශ්‍රය තුළ වැඩ සිටි භික්ෂු නමක් වීම යි. එසේ ම උන් වහන්සේ වප් පුර පසළොස්වක් පෝය දවසෙහි පවාරණය නමැති විනය කර්මය සිදු කළ හාමුදුරුනමක් විය යුතුය.

දායක පිරිස කඨින පින්කමට මූලිකව ම සූදානම් වන්නේ ඇසළ පුර පසළොස්වක පොහෝ දිනයේ ය. ඒ ස්වාමීන් වහන්සේට වස් විසීම සඳහා ආරාධනා කිරීමෙනි. ඉදිරි මාස තුන විහාරස්ථානයේ වස් එළඹ වැඩ වෙසෙන ලෙස ආරාධනා කරන්නේ එම කාලය තුළ සිව් පසයෙන් උපස්ථාන කරන බවට ද පොරොන්දු වෙමිනි. සිවු පසය නම් චීවර (සිවුරු) පිණ්ඩපාත (දානය) සේනාසන (වාසස්ථාන) ගිලාන පච්චය (ගිලන් පස) යන සතරයි. වස් කාලය තුළ වැඩ සිටීමට සුදුසු තැන් පිළියෙල කිරීමෙන්, දානය පූජා කිරීමෙන්, ගිලන්පස පිළිගැන්වීමෙන් උපස්ථාන කරන දායකයා අවසානයේ එනම් චීවර මාසය තුළ සිවුරු පිරිකර පූජා කරයි. ඒ පූජා කරන සිවුරු පිරිකර

අතර ප්‍රධාන වන්නේ කඨින චීවරයයි. වෙනත් සිවුරක් පූජා කරනවාට වඩා කඨින සිවුරක් පූජා කිරීමෙන් පින් සිදුවන නිසා එම පින්කම සිදු කර ගැනීමේ අදහස ඇතුව ම යි වස් ආරාධනා කෙරෙන්නේ.

වස් කාලය තුළ විවිධ පින්කම්වලට සහභාගි වන දායක පිරිස, චීවර මාසය තුළ යොදාගත් දිනෙක කඨින පින්කම සිදු කරති. කඨින චීවර පූජාව සිදුවන දිනට පෙරදින රාත්‍රියෙහි පිරිත් දේශනාවක් යොදා ගැනීම බොහෝ විහාරස්ථානවල සිරිතක්ව පවතී. ඇතැම් විහාරස්ථානවල කෙරෙන්නේ කඨින චීවර පූජාවට පෙර, දින කීපයක් ධර්ම දේශනා මාලාවක් පැවැත්වීම හෝ චීවර පූජා පින්කමට කලින් දවසේ රාත්‍රි ධර්ම දේශනාවක් පැවැත්වීම යි. පින්කම් මාලාව ආරම්භ කෙරෙන්නේ විහාරස්ථාන පරිශ්‍රය සුද්ධ පවිත්‍ර කර ගොක් සැරසිලි, බෞද්ධ කොඩි, විදුලි බුබුළු ආදියෙන් අලංකාර කිරීමෙනි.

පින්කම් දිනට පෙර කඨින වස්ත්‍රය පන්සලට රැගෙන එන්නේ නැත. එය රැගෙන එන්නේ චීවර පූජාව සිදු කෙරෙන දින අළුයම කාලයේ ය. කලින් යොදාගත් දායක නිවසක සිට, නියමිත දින අළුයම කඨින වස්ත්‍රය පන්සලට වැඩම කෙරෙන්නේ පෙරහරකිනි. ඇතැම් විහාරස්ථානයක ඒ සඳහා යොදා ගැනෙන්නේ මල් පෙරහරක් පමණකි. හේවිසි, හොරණෑ, බෙර දවුල්, අලි ඇතුන්, නැටුම් කණ්ඩායම් ආදියෙන් විසිතුරු වූ පෙරහරකින් කඨින චීවරය වැඩමවන අවස්ථා ද ඇත. බාල, තරුණ, වැඩිහිටි පිරිස ඒ පෙරහරට ඉමහත් කැමැත්තකින් එකතු වන්නේ පන්සලට, සංඝරත්නයට පූජා කිරීම සඳහා කවරම හෝ පූජා භාණ්ඩයක් ද අතැතිව ය. එසේ කෙරෙන්නේ කඨින චීවර පූජාවට සම්බන්ධ කර කුමන පූජා භාණ්ඩයක් පූජා කළත් එයින් කඨිනානිසංස ලැබෙන බව පිළිගැනීම නිසාය. ගමේ පාරවල් දිගේ, නගරයේ වීථි ඔස්සේ පෙරහර ගමන් කරන්නේ වැඩි දෙනකු මෙම පින්කමට සම්බන්ධ කර ගැනීම පිණිස ය. පාර දෙපස සිට පෙරහර නරඹන්නෝ ද, පෙරහරේ ගමන් කරන්නන්ට ආහාර පානවලින් සංග්‍රහ කරන්නෝ ද වෙති. බොහෝ දෙනකු පාර දෙපස රැස්වන්නේ කඨින චීවරයට අත ගසා, සම්මාදම් වී පින් සිදුකර ගැනීමට ය. පෙරහර නැරඹීමෙන් ඔවුහු ධාර්මික ප්‍රීතියක් ද ලබති. පෙරහරේ ගමන් කරන්නන් ලබන්නේ ද ධාර්මික ප්‍රීතියකි.

අලියකු පිට හෝ ඇතකු පිට හෝ විශේෂ මණ්ඩපයක හෝ පෙරහරේ වැඩමවන සුදු රෙද්ද හෝ සිවුරු පාට රෙද්ද හෝ හඳුන්වනු ලබන්නේ **කඨින දුස්ස** නමිනි. එය අළුයමින් ම රැගෙන අවුත් සංඝයාට පූජා කරන්නේ එදින ම එයින් සිවුරක් සකස් කර කඨිනය ඇතිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දීමට ය. දායකයින් පූජා කරන්නේ "ඉමං කඨින දුස්සං සංඝස්ස දේම" යන වාක්‍යය තෙවරක් ප්‍රකාශ කරමිනි. එම කඨින වස්ත්‍රය පිළිගත් සඟ පිරිස ඊළඟට කරන්නේ එම පන්සලේ වස් එළඹ පවාරණය කළ භික්ෂූන් වහන්සේ අතුරින් වඩා සුදුසු භික්ෂු නම තෝරා එම වස්ත්‍රයෙන් සිවුරක් සකස් කර කඨිනය ඇතිරීම සඳහා පැවරීමයි. එම භික්ෂු නම තමන්ට පැවරුණු කාර්යය සිදු කරන්නේ අනෙක් භික්ෂූන් වහන්සේගේ ද සහාය ලබා ගෙන ය. කඨින චීවරයට අමතරව, වස් විසූ භික්ෂූන් සඳහා පූජා කෙරෙන අනෙක් සිවුරුවලට කියන්නේ **වස්සාවාසික** සිවුරු කියා යි.

එක් පන්සලක වසරකට එක් වරක් පමණක් පැවැත්වෙන මෙම පින්කමට මහත් උනන්දුවක් දක්වන්නේ එයින් විශාල පිනක් සිදුවන බැවිනි. කඨින සිවුරක් මසන්ට ලැබීම ද මහත් පිනකි. කඨින චීවර පූජාව බුදු සසුන පවත්වාගෙන යෑමට ද දායක වීමකි. පෙරහර පැවැත්වීමාදියෙහි සංස්කෘතික වටිනාකමක් ද ඇත. නොගැළපෙන අංග පෙරහරට එකතු වීම වළක්වා ගත හොත්, රහමෙර පානය කර පෙරහරේ ගමන් කිරීම හා පෙරහරේ ගමන් කරන විට අධාර්මික ලෙස විනෝදවීම වළක්වා ගත හොත් කඨින පෙරහර මහත් සංස්කෘතික වටිනාකමක් ඇති එකක් බවට පත්වනු ඇත. චීවරයට හා සංඝරත්නයට ගරු කළා වන්නේ පෙරහර ද බෞද්ධකමට ගැළපෙන ලෙස සකස් වුවහොත් පමණකි.

කඨින චීවර පූජාවට වැඩම කෙරෙන හාමුදුරුවන්ට දානය පූජා කිරීමත් එදින රාත්‍රියෙහි කඨිනානිසංස ධර්ම දේශනාව පැවැත්වීමත් කඨින පින්කමේ ම අංගයන් ය. එම අවස්ථාවන්ට සහභාගි වී කඨින පින්කමේ සිරිත් විරිත් හැඳිනගෙන ඒවා රැක ගැනීමට ළමා පිරිසට ද දායක විය හැකිය.

ක්‍රියාකාරකම් :

1. පන්තිය කණ්ඩායම් කීපයකට බෙදී සාකච්ඡා කර කඨින පින්කමට ඔබට දායක විය හැකි ආකාරය පැහැදිලි කරමින් වාක්‍ය පහ බැගින් ලියන්න.

2. කඨින පෙරහරක් චිත්‍රයට නගන්න.

# 25 පාඩම

## වන්දනා ගාථා නිවැරදිව භාවිත කරමු

රජමහා විහාර දහම් පාසලේ හත්වන ශ්‍රේණිය භාර ස්වාමීන් වහන්සේ එදිනට නියමිත පාඩම ආරම්භ කෙළේ සත්සතිය සහ සොළොස්මස්ථාන වන්දනා කරන ගාථා වැරදි ලෙස සහ නිවැරදි ලෙස භාවිත කෙරෙන ආකාරය දැක්වෙන පුවරු දෙකක් ප්‍රදර්ශනය කරමිනි.

සත් සතිය වන්දනා කරන ගාථාව (වැරදි)

පටමං බෝදි පල්ලක්කං – දුතියං ච අනිබ්බිසං
තතියං චක්කමනං සෙට්ටං – චතුත්තං රතනාගරං
පච්චමං අජපාලංච – මුදලින්දේන ජට්ටමං
සත්තමං රාජායතනං – වන්දේටං මුනි සේවිතං

සත් සතිය වන්දනා කරන ගාථාව (නිවැරදි)

පඨමං බෝධි පල්ලංකං – දුතියං ච අනිමිමිසං
තතියං චංකමනං සෙට්ඨං – චතුත්ථං රතනාඝරං
පඤ්චමං අජපාලංච – මුචලින්දේන ඡට්ඨමං
සත්තමං රාජායතනං – වන්දේතං මුනි සේවිතං

සොළොස්මස්ථාන වන්දනා කරන ගාථාව (වැරදි)

මයියංගනං නාගදීපං – කලහානං පදලාංචනං
දිවාගුහං දීඝවාපී – චෙත්‍යයං මුතියංගනං
තිස්ස මහා විහාරං ච – බෝදිං මිරිසවට්ටියං
ස්වර්ණ මාලි මහා චෛත්‍යං – තුපාරාම බයාගිරින්
ජේතවනං ශේල චෛත්‍යං – තතා කාතරගාමකං
ඒතේ සොළස ඨානානි – අහං වන්දාමි සබ්බදා

සොළොස්මස්ථාන වන්දනා කරන ගාථාව (නිවැරදි)

මයියංගණං නාගදීපං – කල්‍යාණං පදලාංඡනං
දිවාගුහං දීඝවාපී – චේතියං මුතියංගණං
තිස්ස මහා විහාරං ච – බෝධිං මරිචවට්ටියං
සොණ්ණමාලි මහා චෙතියං – ථූපාරාම භයාගිරිං
ජේතවනං සේල චෙතියං – තථා කාචරගාමකං
ඒතේ සෝළස ඨානානි – අහං වන්දාමි සබ්බදා

ස්වාමීන් වහන්සේ මෙම ගාථාවල ඇති වෙනස්කම් පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කළේ ඉන් පසුවය. සිසුහු ඒ තුළින් ගාථාවල වැරදි සහ නිවැරදි භාවිතය ඉගෙන ගත්හ. එහි දී සිසුන් නොදත් කරුණු කීපයක් ද ස්වාමීන් වහන්සේ විසින් මතක් කරන ලද්දේ මේ අයුරිනි.

දරුවනි,
පාලි භාෂාවෙන් රචනා කළ ගාථාවක් සංස්කෘත වචන හෝ සිංහල වචන එකතුකර භාවිත කළොත් එහි උච්චාරණ දොස් ඇතිවෙනවා. බෝදි, බෝධි, චෛත්‍ය, චේතිය, මුදලින්දේන, මුචලින්දේන, ස්වර්ණමාලි, සොණ්ණමාලි වචන උදාහරණ ලෙස දක්වන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. සමහර වචන භාවිත කළාම අදහස් පවා වෙනස් වෙනවා. අනිබ්බිසං කියන්නේ බෝධිඥානය නැහැ කියන එක. අනිම්මිසං වචනයේ තේරුම ඇසිපිය නොහෙළන බව. කාතර කියන්නේ බැගෑපත් වෙනවට. දැන් බලන්න. සෙල - ශෛල වචන දෙක. පාලි භාෂාවේ තියෙන්නේ දන්තජ "ස" යන්න විතරයි. මූර්ධජ "ෂ" යන්නත් තාලුජ "ශ" යන්නත් පාලි භාෂාවේ නැහැ. මේ ගැනත් අපේ දරුවන් දැනගෙන ඉන්න ඕනෑ. එබැවින් දරුවනි. මෙම වචන නිවැරදිව හඳුනාගෙන බුද්ධ වන්දනාවේ දී භාවිත කරන්න පුරුදු පුහුණු වන්න.

අපි දැන් එම ගාථා නිවැරදිව කීප වරක් සජ්ඣායනා කරමු.

දරුවන් සියලු දෙනාට ම තෙරුවන් සරණයි.

ක්‍රියාකාරකම්:

1. සජ්ඣායනා කළ ගාථාවල වැරදි හා නිවැරදි තැන් පහත දැක්වෙන ලෙස සකස් කරගත් වගුවක ලියා පෙන්වන්න.

| වැරදි භාවිතය | නිවැරදි භාවිතය |
|---|---|
| | |

2. සත් සතිය වන්දනා කරන ගාථාවේ පාඨ අදාළ ලෙස යොදාගෙන සත් සතිය ගත කළ ආකාරය චිත්‍රයට නගන්න.

3. මෙම ගාථා නිවැරදිව උච්චාරණය කරමින් මතකයෙන් කියන්න.

# පාලි

## පාලි භාෂාව ඉගෙනීමේ අවශ්‍යතාව

කුමන රටක සමාජයක වුවත් සියලු මනුෂ්‍යයෝ ම කිසියම් ආගමක් අදහති. ආගම ඇදහීමේ දී ශ්ලෝක, ස්තෝත්‍ර, යාඥා ආදිය ගායනා කරති. ඒ සෑම ආගමික ගායනයක්ම ඒ ඒ ආගමට ආවේනික භාෂාවෙන් ම ගායනා කරති.

මහින්දාගමනයත් සමඟ මෙරට වාසී වූ අපි තෙරුවන් සරණ ගියෙමු. අපේ ආගමික භාෂාව පාලි නාමයෙන් හැඳින්වේ. සිංහලයා බුදුදහම හදාරන්නේත් පත පොත ලියන්නේත් සිංහල භාෂාවෙන් වුව ද බුදුරජාණන් වහන්සේ දහම් දෙසුවේත්, එම දේශනා එක් රැස් කොට සංග්‍රහ කළ ත්‍රිපිටක ග්‍රන්ථ රචනා කොට ඇත්තේත් පාලි භාෂාවෙනි. ත්‍රිපිටකයට ලියූ අටුවා ග්‍රන්ථත් රසවාහිනිය වැනි සාහිත්‍ය කෘතින් මහාවංසා දී වංශ කථාත් පාලි භාෂාවෙන්ම රචනා වී තිබේ. මෙරට සිංහල භාෂාවේ හා සාහිත්‍යයේ පෝෂණයටද පාලි භාෂාව බලපා ඇත.

බෞද්ධ වූ අපි තෙරුවන් සරණ ගොස් පන්සිල්, අටසිල්, දසසිල් සමාදන් වෙමු. තෙරුවන් වන්දනා කරමු. බුද්ධ පූජා, බෝධි පූජා පවත්වමු. පිරිත් සජ්ඣායනා කරමු. පින් අනුමෝදන් කරමු. අන්‍යයන්ට සෙත් පතමු. මේ සියල්ල සිදු කරන්නේ ආගමික භාෂාව වූ පාලියෙන් රචනා කොට ඇති ගාථා හා ගද්‍ය පාඨ උපයෝගී කර ගෙනයි.

සමාජය කොතරම් වෙනස් වූවත් ශාසනික කටයුතු සිදු කිරීමේ දී යොදා ගන්නා පාලි ගාථා හා පාලි පාඨ ඉවත් කිරීම සුදුසු නැත. ශාසනික භාෂාව මුළුමනින්ම ඉවත් නොකිරීම අපේ සම්ප්‍රදායයි.

දහම් පාසල් නව විෂය නිර්දේශය යටතේ පාලි පාඩම් සකස් කිරීමේ දී ගැඹුරු ලෙස පාලි ව්‍යාකරණය හැදෑරීමට වඩා දෛනික ජීවිතයේ ශාසනික කටයුතුවලදී භාවිත කෙරෙන වන්දනා ගාථා හා තෙරුවන් ගුණ පාඨ ආදිය ඇසුරින් සරල දැනුමක් ලබා ගැනීමට මග පෙන්වීමක් අපේක්ෂා කෙරේ.

පාලි භාෂාව ප්‍රගුණ කිරීමේ දී ඊට අයත් ගාථා හා පාලි පාඨ ශබ්දනගා කියවීමත්, නිවැරදිව උච්චාරණය කිරීමත් අත්‍යවශ්‍යය. ඒ තුළින් භාෂා ඥානය පමණක් නොව ශ්‍රද්ධාව, රසවින්දනය, ගායන කුසලතාව ආදී පෞරුෂාංග රැසක පෝෂණය ද සිදුවේ.

පාලි භාෂාව සරලය. එය කනට මිහිරිය. උච්චාරණයට පහසුය. ධර්මය ඉගෙනීමට, ඉතිහාසය හැදෑරීමට, භාෂා කුසලතා වර්ධනයට මෙන් ම චරිත සංවර්ධනයට ද පාලි භාෂා ඥානය මහෝපකාරී වෙයි. මෙම පාඩම් මාලාව ක්‍රමානුකූලව හැදෑරීමෙන් දෛනික ජීවිතය ඵලදායි කර ගැනීමට මෙන් ම ශාසනික කටයුතු වඩාත් සාර්ථකව සිදු කර ගැනීමට ද අවබෝධය හා කුසලතාව ලැබෙනු ඇත.

මෙහි දී විශේෂ අවධානය යොමු කළ යුතු කරුණක් ඇත. එනම්.

1. දීර්ඝ 'ඒ' හා දීර්ඝ 'ඕ' ලිවීමේ දී හල්කිරීම් දක්වා ඇත.

2. රස්ස 'එ' හා 'ඔ' ලිවීමේ දී හල්කිරීම් දක්වා නැත.

ගාථා හා පාඨවල හල්කිරීම් යොදා ඇති තැන්වල දීර්ඝ ලෙස උච්චාරණය කිරීමත්, හල් කිරීම් යොදා නැති තැන්වල කෙටි ලෙස උච්චාරණය කිරීමත් කළ යුතුය.

# පළමු පාඩම

## පාලි අක්ෂර මාලාව හැඳින ගනිමු.

(අ) පාලි භාෂාවේ අකුරු හතළිස් එකකි. (41) ඒවා ස්වර හා ව්‍යඤ්ජන යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.

ස්වර අකුරු අටකි.

අ ආ ඉ ඊ උ ඌ ඒ ඕ

ව්‍යඤ්ජන අකුරු තිස් තුනකි.

ක ඛ ග ඝ ඞ

ච ඡ ජ ඣ ඤ

ට ඨ ඩ ඪ ණ

ත ථ ද ධ න

ප ඵ බ භ ම

ය ර ල ව

ස හ ළ අං

(ආ) **ස්වර** : වෙනත් අකුරක ආධාරයක් නැතුව තනිව ශබ්ද කළ හැකි අකුරු ස්වර නමින් හැඳින්වේ. ස්වර සංඛ්‍යාව අටකි. පාලි භාෂාවේ මේවා **සර** නමින් ද සිංහලයෙහි **පණකුරු** (ස්වර) නමින් ද හැඳින්වේ. කෙටි කාලයකින් උච්චාරණය කළ හැකි අකුරු **රස්ස සර** (කෙටි ස්වර) නමින් ද ඊට වඩා දිගු කලෙකින් උච්චාරණය වන අකුරු **දීඝ සර** (දීර්ඝ ස්වර) නමින් ද හැඳින්වේ.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| කෙටි ස්වර | අ | – | ඉ | – | උ | | | | |
| දීර්ඝ ස්වර | ආ | – | ඊ | – | ඌ | – | ඒ | – | ඕ |

(ඇ) **ව්‍යඤ්ජන** : තනි තනිව ශබ්ද කළ නොහැකි අකුරු ව්‍යඤ්ජන නමින් හැඳින්වේ. උච්චාරණය කිරීම සඳහා ස්වර අකුරුවල ආධාරය ලැබිය යුතු ම ය. ව්‍යඤ්ජන අකුරු සංඛ්‍යාව තිස් තුනකි. මේවා සිංහලයෙහි **ගතකුරු** නමින් හැඳින්වේ.

(ඈ) ව්‍යඤ්ජන අකුරු තිස් තුන උච්චාරණය කිරීම සඳහා ස්වර අකුරු අට එකතු කළ යුතුය. එවිට විවිධ අකුරු රටා ගොඩ නැගෙයි. **ක්** ව්‍යඤ්ජන අකුරට ස්වර අකුරු අට එක් වූ විට මෙසේ අකුරු රටා ගොඩ නැගෙයි.

| ව්‍යඤ්ජන | | ස්වරය | | අකුරු රටාව |
|---|---|---|---|---|
| ක් | + | අ | = | ක |
| ක් | + | ආ | = | කා |
| ක් | + | ඉ | = | කි |
| ක් | + | ඊ | = | කී |
| ක් | + | උ | = | කු |
| ක් | + | ඌ | = | කූ |
| ක් | + | ඒ | = | කේ |
| ක් | + | ඕ | = | කෝ |

(ඉ) අකුරු රටා වචන බවට පත්වන හැටි :

පහත සඳහන් වචනවලට අකුරු දෙකක් ද ශබ්ද හතරක් ද එකතු වේ.

මාතා ම් + ආ + ත් + ආ = මාතා – මව

පිතා ප් + ඉ + ත් + ආ = පිතා – පියා

ලතා ල් + අ + ත් + ආ = ලතා – වැල

පහත සඳහන් වචනවලට අකුරු දෙකක් ද ශබ්ද හයක් ද එකතු වේ.

බාලකෝ බ් + ආ + ල් + අ + ක් + ඕ = බාලකෝ – පිරිමි ළමයා

මූසිකෝ ම් + ඌ + ස් + ඉ + ක් + ඕ = මූසිකෝ – මීයා

දාරකෝ ද් + ආ + ර් + අ + ක් + ඕ = දාරකෝ – දරුවා

**ක්‍රියාකාරකම් :**

01. 1. පාලි භාෂාවේ අක්ෂර මාලාව ලියා දක්වන්න.

2. ව්‍යඤ්ජන අකුරුවලට ස්වර එකතු කොට අකුරු රටා ගොඩනගන්න.

උදා: බ් + අ = බ

3. බුද්ධෝ - ධම්මෝ - සංඝෝ - පුරිසෝ - ලෙඛකෝ මේවායේ ස්වර ව්‍යඤ්ජන වෙන් කොට දක්වන්න.

02. හිස්තැන් සම්පූර්ණ කොට අකුරු රටා ගොඩනගන්න.

| | | | | |
|---|---|---|---|---|
| බ් | + | අ | = | බ |
| බ් | + | ඉ | = | ............... |
| ප් | + | ............... | = | පූ |
| ............ | + | එ | = | පෙ |
| ප් | + | ඔ | = | ........... |
| බ් | + | ඊ | = | ........... |
| ........... | + | ඔ | = | බො |
| හ් | + | ........... | = | හෙ |

## දෙවැනි පාඩම

### තෙරුවන් සරණ යෑම

අ.) බුද්ධං සරණං ගච්ඡාමි

ධම්මං සරණං ගච්ඡාමි

සංඝං සරණං ගච්ඡාමි

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි

දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි

දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි

තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි

තතියම්පි සංඝං සරණං ගච්ඡාමි

මෙහි මුල් වාක්‍ය කීමෙන් ම තෙරුවන් සරණ යා හැකිය. එම වාක්‍ය නිවැරදිව ශබ්ද නගා කියවීම අවශ්‍ය වේ. නිවැරදි උච්චාරණය තුළ ම තිසරණය පිහිටයි. තෙවරක් කීම බෞද්ධ සම්ප්‍රදාය යයි. එබැවින් දුතියම්පි - (දෙවනුව ද) තතියම්පි - (තෙවනුව ද) යැයි කියා තෙරුවන්

සරණ යා යුතු වේ. මෙහි පදයෙන් පදයට අර්ථය කීමේ සහ ලිවීමේ හැකියාව ඇති කර ගත යුතු වේ.

ආ.) ඉහත පාලි වාක්‍යවල තේරුම හැඳින ගනිමු.

බුද්ධ රත්නය සරණ යමි.

ධර්ම රත්නය සරණ යමි.

සංඝ රත්නය සරණ යමි.

දෙවනුවද බුද්ධ රත්නය සරණ යමි.

දෙවනුවද ධර්ම රත්නය සරණ යමි.

දෙවනුවද සංඝ රත්නය සරණ යමි.

තෙවනුවද බුද්ධ රත්නය සරණ යමි.

තෙවනුවද ධර්ම රත්නය සරණ යමි.

තෙවනුවද සංඝ රත්නය සරණ යමි.

ඇ.) පාලි වචනවල තේරුම හැඳින ගනිමු.

බුද්ධං - බුදුරජාණන් වහන්සේ

සරණං - සරණ (පිහිට)

ගච්ඡාමි - යමි

ධම්මං - ධර්මරත්නය

සංඝං - සංඝරත්නය

දුතියම්පි - දුතියං අපි > දුතියම්පි - දෙවනුවද

තතියම්පි - තතියං අපි > තතියම්පි - තෙවනුවද

ඇ.) සරල පාලි වාක්‍ය ගොඩනගන්නට ඉගෙන ගනිමු.

'තෙරුවන් සරණයෑම' තුළ 'ගච්ඡාමි - යමි' යනුවෙන් එක ම ක්‍රියා පදයක් යෙදෙයි. මෙය උත්තම පුරුෂ ඒක වචන ක්‍රියාපදය යි. මේ අනුව උත්තම පුරුෂ බහුවචන ක්‍රියා පදයත් ඒ සමඟ යෙදෙන නාම පද දෙකත් සරල වාක්‍යවල යෙදෙන හැටි පහත සඳහන් වගු ඇසුරෙන් දැන ගනිමු.

වගුව I

ගච්ඡාමි - යමි

අහං ගච්ඡාමි - මම යමි

| | | | |
|---|---|---|---|
| අහං | බුද්ධං<br>ධම්මං<br>සංඝං<br>තිසරණ | සරණං | ගච්ඡාමි |

වගුව I I

ගච්ඡාම - යමු

මයං ගච්ඡාම - අපි යමු

| | | | |
|---|---|---|---|
| මයං | බුද්ධං<br>ධම්මං<br>සංඝං<br>තිසරණ | සරණං | ගච්ඡාම |

ඉ.) ක්‍රියාකාරකම්:

1. තෙරුවන් සරණ යෑම නිවැරදිව කියන්න.
2. එහි අර්ථය ලියන්න.
3. ඉහත සඳහන් වගු 1 සහ 11 අනුගමනය කරමින් ඒ යටතේ දැක්වෙන ක්‍රියා පදවලට සුදුසු උක්ත පද යොදා සරල වාක්‍ය ගොඩනගන්න.

ඊ.) පඨාමි - පාඩම් කරමි
වන්දාමි - වඳිමි
ලිඛාමි - ලියමි
සුණාමි - අසමි
භුඤ්ජාමි - අනුභව කරමි
සයාමි - නිදමි
පිබාමි - පානය කරමි

4. හිස්තැන් පුරවන්න

1. අහං පණ්ණසාලං .......................... .
2. .......................... විහාරං ගච්ඡාම.
3. අහං .......................... සරණං ගච්ඡාමි.
4. .......................... ධම්මපාඨසාලං .................. .
5. දුතියම්පි .......................... බුද්ධං .................... ගච්ඡාමි.
6. තතියම්පි මයං ධම්මං ......................  .................. .

අලුත් වචන

පණ්ණසාලං - පන්සල
ධම්මපාඨසාලං - දහම් පාසල
විහාරං - විහාරය

## තෙවැනි පාඩම

### පන්සිල් සාමදන් වීම

අ. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
සුරා මේරය මජ්ජ පමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

ඉහත ශික්ෂාපද (සිල්පද) පහ කීමෙන් ම පන්සිල් සමාදන් විය හැකිය. එම ශික්ෂාපද නිවැරදිව ශබ්ද නගා කියවීම අවශ්‍ය වේ. නිවැරදි උච්චාරණය තුළ ම ශීල සමාදානය ඇති වේ. මෙහි පදයෙන් පදයට අර්ථය කියන්නටත් ලියන්නටත් හැකියාව ඇති කර ගනිමු. එහි ශික්ෂා පද උච්චාරණය කිරීමේදී "සික්ඛා" යන්නත් "පදං" යන්නත් කෙරෙහි අවධානය යොමු කරමු. එහි "සික්ඛා" යන්නෙහි අග යෙදෙන මහාප්‍රාණ "ඛා" යන්න ශබ්ද නගා උච්චාරණය කරමු. "පදං" යන්නෙහි මුල යෙදෙන "ප" යන්න ද මුඛය විවෘත කොට උච්චාරණය කරමු.

**ආ. ඉහත ශික්ෂා පදවල තේරුම හැඳින ගනිමු.**

ප්‍රාණ ඝාතයෙන් වැළකීමේ සිල් පදය සමාදන් වෙමි.
නොදුන් දේ ගැනීමෙන් වැළකීමේ සිල් පදය සමාදන් වෙමි.
කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමේ සිල් පදය සමාදන් වෙමි.
බොරු කීමෙන් වැළකීමේ සිල් පදය සමාදන් වෙමි.
මදයට හා ප්‍රමාදයට හේතුවන රහමෙර පානයෙන් වැළකීමේ සිල් පදය සමාදන් වෙමි.

**ඇ. පාලි වචනවල තේරුම් හැඳින ගනිමු.**

පාණාතිපාතා - (පාණ+අති+පාතා) පණ ඉවත හෙළීමෙන්, මැරීමෙන්
වේරමණී - වැළකීමේ
සික්ඛාපදං - (සික්ඛා+පදං) සිල් පදය

සමාදියාමි - සමාදන්වෙමි
අදින්නාදානා - (අදින්න + ආදානා) නොදුන් දේ ගැනීමෙන්
මුසාවාදා - බොරු කීමෙන්
සුරා මේරය මජ්ජ පමාදට්ඨානා- (සුරා+මෙරය+මජ්ජ+පමාද+ඨානා)
මදයට හා ප්‍රමාදයට හේතුවන
රහමෙරින්

**ඈ. සරල පාළි වාක්‍ය ගොඩනගන්නට ඉගෙන ගනිමු.**

'පන්සිල් සමාදන්වීම' තුළ 'සමාදියාමි - සමාදන්වෙමි', යනුවෙන් එක ම උත්තම පුරුෂ ඒකවචන ක්‍රියාපදයක් යෙදෙයි. මේ අනුව උත්තම පුරුෂ බහුවචන ක්‍රියාපදයත් ඒ සමඟ යෙදෙන නාම පද දෙකත් සරල වාක්‍යවල යෙදෙන හැටි පහත සඳහන් වගුවට අනුව දැන ගනිමු.

සමාදියාමි - සමාදන් වෙමි සාමාදියාම - සමාදන් වෙමු.
අහං සමාදියාමි - මම සමාදන් වෙමි. මයං සමාදියාම - අපි සමාදන් වෙමු.

වගුව

| | | | |
|---|---|---|---|
| අහං<br><br><br>මයං | පාණාතිපාතා<br>අදින්නාදානා<br>කාමේසු මිච්ඡාචාරා<br>මුසාවාදා<br>සුරාමේරය මජ්ජපමාදට්ඨානා | වේරමණී සික්ඛාපදං | සමාදියාමි<br><br>සමාදියාම |

**ඉ. ක්‍රියාකාරකම්.**

1. පන්සිල් සමාදන්වීමේ වාක්‍ය නිවැරදිව කියන්න.
2. ඒවායෙහි අර්ථ ලියන්න.

3. ඉහත සඳහන් වගුව ඇසුරෙන් වාක්‍ය 10ක් ලියන්න.

4. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. **සෝ සීලං රක්ඛති**

ii. **තේ සීලානි රක්ඛන්ති**

iii. **ත්වං පඤ්චසීලං සමාදියසි.**

iv. **තුම්හේ පඤ්චසීලං සමාදියථ.**

v. **අහං අට්ඨංගසීලං සමාදියාමි.**

vi. **මයං උපොසථං උපවසාම**

**ඉහත**

i.ii අංක යටතේ ඇත්තේ ප්‍රථම පුරුෂ වාක්‍ය දෙකකි.
iii.iv අංක යටතේ ඇත්තේ මධ්‍යම පුරුෂ වාක්‍ය දෙකකි.

**අළුත් වචන**

| | | |
|---|---|---|
| සෝ | - | හෙතෙම |
| තේ | - | ඔවුහු |
| ත්වං | - | නුඹ/ඔබ |
| තුම්හේ | - | නුඹලා/තෙපි |
| රක්ඛති | - | රකියි |
| උපොසථං | - | උපෝසථය |
| උපවසාම | - | එළඹ වාසය කරමු. |

# සිව්වැනි පාඩම

## ත්‍රිවිධ චෛත්‍ය වන්දනාව

අ) වන්දාමි චේතියං සබ්බං - සබ්බඨානෙසු පතිට්ඨිතං
සාරීරිකධාතු මහාබොධිං - බුද්ධරූපං සකලං සදා

ඉහත සඳහන් වන්නේ ශාරීරික චෛත්‍යය, පාරිභෝගික චෛත්‍යය හා උද්දේසික චෛත්‍යය වඳින ගාථාවයි. අපි උදය හා සවස තෙරුවන් වැඳීමේ දී ත්‍රිවිධ චෛත්‍යය ද වන්දනා කරමු. එබැවින් මේ ගාථාව නිවැරදිව ශබ්ද නගා කියවීම අවශ්‍ය වේ. ඊට පසුව පදයෙන් පදයට අර්ථය කියන්නට හා ලියන්නට හැකිවන පරිදි අර්ථාවබෝධය ලබා ගනිමු. ඒ සඳහා මෙසේ පද පිළිවෙළ අනුව අර්ථය දැන ගනිමු.

### ආ) ගාථාවෙහි පද පිළිවෙළ හැඳින ගනිමු

(අහං) සබ්බඨානෙසු පතිට්ඨිතං සබ්බ චෙතියං (ච) සාරීරිකධාතුං (ච) මහාබොධිං (ච) සකලං බුද්ධරූපං (ච) සදා වන්දාමි.

### ඇ) ගාථාවෙහි තේරුම දැන ගනිමු

(මම) සියලු තැන්වල පිහිටි සියලු දාගැබ් (ද) ශාරීරික ධාතූන් වහන්සේ (ද) ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ (ද) සියලු බුදු පිළිම වහන්සේ (ද) සැමදා වඳිමි.

### ඇ) පාලි වචනවල තේරුම් හැඳින ගනිමු

| | | |
|---|---|---|
| වන්දාමි | - | වඳිමි |
| චෙතියං | - | චෛත්‍යය, සෑය, දාගැබ, වෙහෙර |
| සබ්බං | - | සියලු |

සබ්බට්ඨානෙසු - සියලු තැන්වල, සියලු තැන්හි
පතිට්ඨිතං - පිහිටියා වූ
සාරීරිකධාතු - ශාරීරික ධාතූන් වහන්සේ
මහාබොධිං - ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ

**ඉ) සරල පාලි වාක්‍ය ගොඩනගන්නට ඉගෙන ගනිමු.**

ත්‍රිවිධ චෛත්‍ය වන්දනා ගාථාවේ 'වන්දාමි - වඳිමි' යන එක ම උත්තම පුරුෂ ඒකවචන ක්‍රියාපදයක් යෙදෙයි. මේ අනුව 'පඨමපුරිස, මජ්ඣිම පුරිස, උත්තම පුරිස' ඒකවචන හා බහුවචන ක්‍රියාපදත් ඊට අදාළ උක්ත පදත් සරල වාක්‍යවල යෙදෙන හැටි පහත වගු ඇසුරෙන් ඉගෙන ගනිමු.

**වගුව I**

<table>
<tr><td rowspan="2">පඨම පුරිස<br>(ප්‍රථම පුරුෂ)</td><td>සො</td><td rowspan="6">චේතියං<br>සොණ්ණමාලි චේතියං<br>ථූපාරාම චේතියං<br>මරිචවට්ටියං<br>භයාගිරිං<br>මහා බෝධිං<br>දාඨාධාතුං<br>ලලාට ධාතුං<br>සාරීරික ධාතුං</td><td>වන්දති</td></tr>
<tr><td>තෙ</td><td>වන්දන්ති</td></tr>
<tr><td rowspan="2">මජ්ඣිම පුරිස<br>(මධ්‍යම පුරුෂ)</td><td>ත්වං</td><td>වන්දසි</td></tr>
<tr><td>තුම්හෙ</td><td>වන්දථ</td></tr>
<tr><td rowspan="2">උත්තම පුරිස<br>(උත්තම පුරුෂ)</td><td>අහං</td><td>වන්දාමි</td></tr>
<tr><td>මයං</td><td>වන්දාම</td></tr>
</table>

ඉහත වගුව අනුව එක් පුරුෂයකට වාක්‍ය 18 බැගින් පුරුෂ තුනට ම සරල වාක්‍ය 54ක් ගොඩනැගිය හැකිය. ඒ අනුව නිවැරදිව පද ගළපමින් සරල පාලි වාක්‍ය ගොඩනගන්න.

ඉහත ගාථාවට අනුව වාක්‍ය ගොඩනගමු.

වගුව II

| | | | | |
|---|---|---|---|---|
| අහං | සබ්බඨානෙසු | පතිට්ඨිතං | සබ්බචෙතියං<br>සාරීරික ධාතුං<br>මහාබෝධිං | වන්දාමි |
| මයං | | | සකලං බුද්ධරූපං | වන්දාම |

ඊ) ක්‍රියාකාරකම්:

1. ත්‍රිවිධ චෛත්‍ය වන්දනා ගාථාව නිවැරදිව කියන්න.
2. එම ගාථාවෙහි අර්ථය කියැවෙන සරල සිංහල වාක්‍ය තුනක් ලියන්න.

3. හිස්තැන් පුරවන්න.

i. මයං සාරීරික ධාතුං ....................
ii. ................ භයාගිරිං වන්දාමි.
iii. තුම්හෙ මහාබෝධිං .................. .
iv. .................... ථූපාරාම චෙතියං වන්දසි.
v. තෙ දාඨාධාතුං .................. .
vi. ................. මරිචවට්ටියං වන්දති.
vii. අහං .............. වන්දාමි.
viii. ................ ලලාටධාතුං වන්දන්ති

4. සිංහලට නගන්න.

i. අහං සකලං බුද්ධරූපං වන්දාමි.
ii. තුම්හෙ මහබොධිං වන්දථ
iii. මයං සබ්බඨානෙසු පතිට්ඨිතං සබ්බං චෙතියං වන්දාම.
iv. සො සාරීරික ධාතුං වන්දති.
v. තෙ අනුරාධපුරෙ පතිට්ඨිතං භයාගිරිං වන්දන්ති

## පාලි

# පස්වැනි පාඩම

## පහන් පූජා කිරීම

අ) සද්ධාය සම්පදිත්තේන - දීපේන තමධංසිනා
තිලොකදීපං සම්බුද්ධං - පූජයාමි තමෝනුදං

ඉහත සඳහන් වන්නේ පහන් පූජා කිරීමේ ගාථාවයි. මෙය ශබ්ද නගා කියවීම අවශ්‍ය වේ. ඊට පසුව පදයෙන් පදයට අර්ථය කියන්නට හා ලියන්නට හැකිවන පරිදි අර්ථාවබෝධය ලබා ගනිමු. ඒ සඳහා මෙසේ පද පිළිවෙළ අනුව අර්ථය දැන ගනිමු.

### ආ) ගාථාවෙහි පද අනුපිළිවෙළ හැඳින ගනිමු

(අහං) තමො නුදං තිලෝකදීපං සම්බුද්ධං සද්ධාය තම ධංසිනා සම්පදිත්තේන දීපෙන පූජයාමි.

### ඇ) ගාථාවෙහි තේරුම හැඳින ගනිමු

(මම) (මෝහ නමැති) අන්ධකාරය දුරු කරන තුන් ලොවට පහනක් වූ සම්බුදුරජාණන් වහන්සේ සැදැහැ සිතින්, අඳුර දුරුවන දීප්තිමත් වූ පහනින් පූජා කරමි.

### ඈ) පාලි වචනවල තේරුම් හැඳින ගනිමු

| | | |
|---|---|---|
| සද්ධාය | - | සැදැහැ සිතින්, ශ්‍රද්ධාවෙන් |
| සම්පදිත්තේන | - | දිලිසෙන, බබළන, දීප්තිමත් වූ |
| දීපේන | - | පහනින් |
| තම | - | අන්ධකාරය, අඳුර |
| ධංසිනා | - | දුරුවෙන, පහවන |
| තිලොකදීපං | - | තුන්ලොවට පහනක් වූ |

සම්බුද්ධං - සම්බුදුරජාණන් වහන්සේ
පූජයාමි - පුදමි, පූජා කරමි.
තමො - (මෝහ නමැති) අඳුර, අන්ධකාරය
නුදං - පහකරන, දුරු කරන

### ඉ) සරල පාලි වාක්‍ය ගොඩනගන්නට ඉගෙන ගනිමු.
### (පද අනුපිළිවෙළ අනුව සැකසීම අවශ්‍ය වේ)

පහන් පූජා කරන ගාථාව ඇසුරෙන් සරල වාක්‍ය ගොඩනැගීමට හැකිය. එහි සඳහන් 'පූජයාමි - පූජාකරමි', යන ක්‍රියාපදයට අනුව පහත වගුව ඇසුරෙන් වාක්‍ය ගොඩනගමු.

වගුව I

| | | | | |
|---|---|---|---|---|
| අහං | සද්ධාය | දිපේන<br>ගන්ධේන<br>පානීයේන | සම්බුද්ධං<br>භගවන්තං<br>අරහන්තං | පූජයාමි |
| මයං | ගාරවේන | ආහාරේන<br>පුප්ඵේන<br>කුසුමේන | ලොකනාථං<br>සුගතං<br>සත්ථාරං | පූජයාම |

පහත වගුවට අනුව පද ගළපමින් සරල වාක්‍ය ගොඩනගන්න.

වගුව II

| | | | |
|---|---|---|---|
| අහං | සම්පදිත්තේන දීපේන<br>සුගන්ධේන පුප්ඵේන<br>සාලංකාරේන කුසුමේන | සම්බුද්ධං | පූජයාමි |
| මයං | පණීතේන ඛජ්ජභොජ්ජේන<br>මධුරේන ආහරේන<br>මධුරේන පානීයේන<br>ඉමිනා ගිලානපච්චයේන | | පූජයාම |

ඊ) ක්‍රියාකාරකම්:

1. පහත් පූජා කරන ගාථාව නිවැරදි උච්චාරණයෙන් කියන්න.

2. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. සෝ සද්ධාය සම්පදිත්තේන දීපේන සම්බුද්ධං පූජේති.
ii. සා සද්ධාය සංඝං වන්දති.
iii. ත්වං පණීතේන ඛජ්ජභොජ්ජේන භගවන්තං පූජේසි.
iv. තේ සුගන්ධේන පුප්ඵේන සත්ථාරං පූජෙන්ති.
v. තුම්හේ මධුරාහාරේන අරහන්තං පූජේථ.

3. පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. අපි සුවඳ මලින් වෙහෙර වහන්සේ පුදමු.
ii. ඔබ සුවඳ පැනින් බෝධීන් වහන්සේ පුදහි.
iii. මම ආදරයෙන් මවට වදිමි.
iv. ඔවුහු ප්‍රියවචනයෙන් සංග්‍රහ කරති.
v. නුඹලා මෛත්‍රියෙන් වැඩ කරව්.

අලුත් වචන

| | | |
|---|---|---|
| ගාරවේන | - | ගෞරවයෙන් |
| ගන්ධේන | - | සුවඳින් |
| පානීයේන | - | පානයෙන් |
| ආහාරේන | - | ආහාරයෙන් |
| පුප්ඵේන | - | මලින් |
| කුසුමේන | - | මලින් |
| භගවන්තං | - | භාග්‍යවතුන් වහන්සේ |
| අරහන්තං | - | රහතන් වහන්සේ |
| ලොකනාථං | - | ලෝකනාථයන් වහන්සේ |
| සා | - | ඕ තොමෝ ඇය |

| | | |
|---|---|---|
| සුගතං | - | සුගතයන් වහන්සේ |
| සත්ථාරං | - | ශාස්තෘන් වහන්සේ |
| සාලංකාරේන | - | ලස්සන |
| පණීතේන | - | ප්‍රණීත, මිහිරි |
| ඛජ්ජභොජ්ජේන | - | කෑ යුතු දේවලින්/බුදිය යුතු දේවලින් |
| ගිලානපච්චයේන | - | ගිලන්පසින් |
| සාදරේන | - | ආදරයෙන් |
| පියවචනේන | - | ප්‍රියවචනයෙන් |
| මෙත්තේන | - | මෛත්‍රියෙන් |

පාලි

# සවැනි පාඩම

## මල් පූජා කිරීම

අ) වණ්ණගන්ධ ගුණෝපේතං — එතං කුසුම සන්තතිං
පූජයාමි මුනින්දස්ස — සිරිපාද සරෝරුහේ

පූජේමි බුද්ධං කුසුමේනනේන — පුඤ්ඤේන මේතේන ලභාමි මොක්ඛං
පුප්ඵං මිලායාති යථාඉදම්මේ — කායෝ තථායාති විනාසභාවං

ඉහත සඳහන් වන්නේ මල් පූජා කිරීමේ ගාථා දෙකයි. ඒවා ශබ්ද නගා කියවීම අවශ්‍ය වේ. ඊට පසුව පදයෙන් පදයට අර්ථය කියන්නට හා ලියන්නට හැකිවන පරිදි අර්ථාවබෝධය ලබා ගනිමු. ඒ සඳහා මේසේ පද පිළිවෙළ අනුව අර්ථය දැන ගනිමු.

ආ) ගාථාවන්හි පද අනු පිළිවෙළ හැඳින ගනිමු

(අහං) වණ්ණ ගන්ධ ගුණොපේතං එතං කුසුම සන්තතිං මුනින්දස්ස සිරිපාද සරෝරුහේ පූජයාමි.

(අහං) අනේන කුසුමේන බුද්ධං පූජේමි (අහං) එතේන පුඤ්ඤේන මොක්ඛං ලභාමි. යථා ඉදං පුප්ඵං මිලායාති තථා මේ කායෝ විනාසභාවං යාති.

ඇ) (මම) පැහැයෙන් ද සුවඳින් ද ගුණයෙන් ද යුක්ත වූ මේ මල් රැස බුදුරජාණන් වහන්සේගේ සිරිපා පියුම්වලට පූජා කරමි.

(මම) මේ මලින් බුදුරජාණන් වහන්සේ පුදමි. (මම) ඒ පිනෙන් නිවන ලබම්වා. යම් සේ මේ මල මැලවෙයි ද එසේ මාගේ කය (ශරීරය) විනාශයට යයි.

## ඈ) පාලි වචනවල තේරුම් හැඳින ගනිමු

| | |
|---|---|
| වණ්ණ | – පැහැය, වර්ණය |
| ගන්ධ | – සුවඳ |
| ගුණෝපේතං | – (ගුණ+උපෙතං) ගුණයෙන් යුක්ත වූ |
| ඒතං | – ඒ |
| කුසුම සන්තතිං | – මල් රැස, මල් පොකුර, මල් කළඹ |
| පූජයාමි | – පූජා කරමි |
| මුනින්දස්ස | – බුදුරජාණන් වහන්සේගේ |
| සිරිපාද | – සිරිපා |
| සරොරුහේ | – පියුම, පද්මය |
| පූජෙමි | – පුදමි |
| බුද්ධං | – බුදුරජාණන් වහන්සේ |
| කුසුමේනනේන | – (අනේන+කුසුමේන) මේ මලින් |
| පුඤ්ඤේන මේතෙන | – (එතෙන+පුඤ්ඤෙන) ඒ පිනෙන් |
| ලභාමි | – ලබම්වා |
| මොක්ඛං | – නිවන, මෝක්ෂය |
| පුප්ඵං | – මල |
| මිලායාති | – මැලවෙයි |
| යථා | – යම්සේ |
| ඉදම්මෙ | – (ඉදං+මෙ) මේ මාගේ |
| කායෝ | – කය, ශරීරය |
| තථා | – එසේ |
| යාති | – යයි |
| විනාසභාවං | – විනාශයට, විනාශ භාවයට |

මෙහි පද අනුපිළිවෙළ අනුව තේරුම් දීම අවශ්‍ය වේ.

## ඉ) සරල පාලි වාක්‍ය ගොඩනගන්නට ඉගෙන ගනිමු

මල් පූජා කරන ගාථා ඇසුරෙන් සරල වාක්‍ය ගොඩනැගිය හැකිය. පහත දැක්වෙන වගු ඇසුරෙන් වාක්‍ය ගොඩනගන්න.

## වගුව I

| | | | |
|---|---|---|---|
| අහං | අනේන කුසුමේන<br>අනේන පායාසේන<br>අනේන ගිලානපච්චයේන<br>අනේන බොජනේන<br>අනේන පානීයේන | බුද්ධං | පූජයාමි |
| මයං | | | පූජයාම |

## වගුව II

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| යථා | පුප්ඵං මිලායාති<br>සූරියං අත්‍ථංගමයති<br>පක්කානි ඵලානි පතන්ති<br>බුබ්බුලකං (භින්දති)<br>මත්තිකභාජනං<br>(භින්දති) | තථා | ඉදං | මෙ | කායො | විනාසභාවං | යාති |

## වගුව III

| | | | |
|---|---|---|---|
| අහං | එතේන පුඤ්ඤේන | සුගතිං<br>මොක්ඛං<br>නිබ්බානං<br>සග්ගං<br>සන්තිපදං | ලභාමි |
| මයං | | | ලභාම |

**ක්‍රියාකාරකම්:**

1. මල් පූජා කරන ගාථාව නිවැරදි උච්චාරණයෙන් ගයන්න.
2. එහි අර්ථය සරල බසින් ලියන්න.
3. ඉහත වගු ඇසුරෙන් පාලි වාක්‍ය 10ක් ගොඩනගන්න.

04. මේවා පාලියට නගන්න.

(i) හෙතෙම මේ ගිලන්පස බුදුරදුන්ට පූජා කරයි.

(ii) ඕ තොමෝ මේ සුවඳින් බුදුරදුන් පූජා කරයි.

(iii) ඔබ ඒ පිනෙන් සුගතිය ලබහි.

(iv) ඔවුහු සැදැහැ සිතින් ආහාරයෙන් භාග්‍යවතුන් වහන්සේ පුදති.

(v) නුඹලා ඒ පිනෙන් ශාන්ති පදය ලබහු.

(vi) යම් සේ සූර්යයා අවරට යයි ද එසේ මේ කය විනාශයට යයි.

අලුත් වචන

| | | |
|---|---|---|
| සූරියං අත්‍ථංගමයති | – | හිරු අවරට යයි |
| පක්කානි ඵලානි පතන්ති | – | ඉදුණු ගෙඩි වැටෙත්, වැටෙයි |
| බුබ්බුලකං | – | දිය බුබුල |
| මත්තිකභාජනං | – | මැටි බඳුන |
| සුගතිං | – | සුගතිය |
| මොක්ඛං | – | මෝක්ෂය, නිවන |
| නිබ්බානං | – | නිවන |
| සග්ගං | – | ස්වර්ගය, දෙව්ලොව |
| සන්තිපදං | – | නිවන |

අභිධර්මය

# 1 පාඩම

## සිත

සිදුහත් බෝසතාණන් වහන්සේ උපතින් තිස්පස් වන වසරෙහි දී බුදු බවට පත්වූහ. එතැන් සිට හතළිස්පස් වසරක් මුළුල්ලෙහි උන්වහන්සේ ලෝක සත්ත්වයාට කළ දේශනා සියල්ල ධර්මය සහ විනය යනුවෙන් දෙකොටසකට බෙදා දක්වා ඇත. එයින් "විනය" යන කොටස විනය පිටකයට අයත් වෙයි. "ධර්මය" යන කොටස නැවත ධර්මය – අභිධර්මය යනුවෙන් දෙකොටසකට බෙදා දක්වා ඇත. එයින් "ධර්මය" යන කොටස සූත්‍ර පිටකයට අයත් වෙයි. "අභිධර්මය" යන කොටස අභිධර්ම පිටකයට අයත් වෙයි.

මෙසේ මුළු බුද්ධ දේශනාව ම පිටක වශයෙන්

1. විනය
2. සූත්‍ර
3. අභිධර්ම යනුවෙන් කොටස් තුනකට බෙදා දක්වා ඇත.

අපි මෙම ශ්‍රේණියේ දී අභිධර්ම පිටකයට අයත් කරුණු අතරින් සිත ගැන ඉගෙන ගනිමු.

පාලි භාෂාවෙන් සිතට "චිත්ත" යන නම යෙදේ. සිතේ ලක්ෂණය අරමුණු දැන ගැනීමය. ඇසට පෙනෙන රූපය අරමුණකි. කනට ඇසෙන ශබ්දය අරමුණකි. නාසයට දැනෙන ගඳ (දුගඳ – සුගඳ) අරමුණකි. මෙසේ තවත් අරමුණු ඇත.

අරමුණු දැන ගන්නා ලක්ෂණයෙන් සිත එකක් වුවද සිතේ ස්වභාවය අනුව කොටස් පහකට බෙදේ. ඒ මෙසේය.

1. අකුසල සිත් – ලෝභ, දෝස, මෝහ යන අකුසල හේතු සමග උපදින සිත්
2. කුසල සිත් – අලෝභ, අදෝස, අමෝහ යන කුසල හේතු සමග උපදින සිත්
3. අහේතුක සිත් – අකුසල හේතු තුනත් කුසල හේතු තුනත් නැතිව උපදින සිත්
4. විපාක සිත් – උපදවා ගත් කුසල සිත්වලට විපාක වශයෙන් ලැබෙන සිත්
5. කිරිය සිත් – බුදු - පසේ බුදු - රහත් යන උතුමන් වහන්සේලාට කුසල් සිත් වෙනුවට උපදින්නේ කිරිය සිත්ය. ලෝකෝත්තර සිත්වල කිරිය සිත් නැත.

මෙම සිත් තවදුරටත් භූමි වශයෙන් සතර වැදෑරුම්ය. ඒ කාමාවචර, රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර යනුවෙනි. භූමි භේදයෙන් හා සිතේ ස්වභාවය අනුව බෙදී යන අයුරු පහත දක්වා ඇති වගුවෙන් වඩාත් පැහැදිලි වනු ඇත.

| | ස්වභාවය අනුව සිත් | | | | | |
|---|---|---|---|---|---|---|
| භූමි අනුව | අකුසල | අහේතුක | කුසල | විපාක | කිරිය | සියල්ල |
| කාමාවචර සිත් | 12 | 18 | 8 | 8 | 8 | 54 |
| රූපාවචර සිත් | – | – | 5 | 5 | 5 | 15 |
| අරූපාවචර සිත් | – | – | 4 | 4 | 4 | 12 |
| ලෝකෝත්තර සිත් | – | – | 4 | 4 | – | 08 |
| සියල්ල | 12 | 18 | 21 | 21 | 17 | 89 |

මෙම වගුවෙහි ඇතුළත් කාමාවචර කුසල සිත් 8, විපාක සිත් 8 හා කිරිය සිත් 8 කාමසෝභන සිත් යනුවෙන් හඳුන්වනු ලැබේ.

එසේම රූපාවචර සිත් 15 හා අරූපාවචර සිත් 12 මහග්ගත සිත් යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ක්‍රියාකාරකම්:**

දත් දෙන අදහසින් යුතුව

දානය පිළිගන්නා අය කෙරෙහි මෛත්‍රී සිතිවිලි ඇතිව

දානයෙහි විපාක ඇතැයි යන හැඟීමෙන් දානයක් දෙන විට, ඇතිවන්නේ –

1. කුසල හේතුද? අකුසල හේතුද?
2. එම හේතු මොනවාද?

**මීළඟ පාඩමෙන් අපි කාමාවචර සිත් පිළිබඳව ඉගෙන ගනිමු.**

# 2 පාඩම

## කාමාවචර සිත්

පළමු පාඩමෙහි දක්වන ලද වගුවෙහි ඇතුළත් කාමාවචර සිත් 54 පිළිබඳව මෙම පාඩමෙන් ඉගෙන ගනිමු.

**අකුසල් සිත් 12**

අකුසල් සිත් කොටස් තුනකට බෙදේ.

1. ලෝභ මූලික සිත් 08
2. දෝස මූලික සිත් 02
3. මෝහ මූලික සිත් 02 යනුවෙනි.

**ලෝභ මූලික සිත් 08**

1. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිත
2. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික සිත
3. සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික සිත
4. සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික සිත
5. උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිත
6. උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික සිත
7. උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික සිත
8. උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික සිත

**සෝමනස්ස සහගත**: සොම්නස් (සැප) වේදනාවෙන් යුතු
**උපෙක්ඛා සහගත** : මැදහත් වේදනාවෙන් යුතු

**දිට්ඨිගත සම්පයුත්ත:** පව් කිරීම වරදක් නැතැයි යන හැඟීමෙන් යුතු
**දිට්ඨිගත විප්පයුත්ත:** පව් කිරීම වරදක් නැතැයි යන හැඟීමෙන් තොර

**අසංඛාරික :** තමාගේ හෝ අනුන්ගේ හෝ පෙළඹවීමක් නැති
**සසංඛාරික :** තමාගේ හෝ අනුන්ගේ හෝ පෙළඹවීමක් ඇති

*උදා :* ධනවත් කෙනෙකු සතු යම් මුදලක් දුටු කෙනෙක් පාපයක් නැතැයි යන හැඟීමෙන් සතුටු සිතින් යුතුව වහාම එම මුදල ගන්නා විට පළමුවන ලෝභ සිත උපදී.

**දෝස මූලික සිත් 02**

1. දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත අසංඛාරික සිත
2. දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත සසංඛාරික සිත

**දෝමනස්ස සහගත** : දොම්නස් (දුක්) වේදනාවෙන් යුතු
**පටිඝ සම්පයුත්ත** : අරමුණෙහි ගැටීමෙන් යුතු

විනෝදයට දඩයමේ ගොස් සතෙකු මැරුවත් යටත් පිරිසෙයින් මදුරුවෙකු මැරුවත් එය සිදුවන්නේ ද්වේශ සිතකින් ම ය. සතුන් මැරීම අපායෙහි ඉපදීමට මෙන්ම මිනිසෙකු වූ විට අඩු ආයුෂයකින් මිය යාමටත් හේතු වෙයි. සතුන්ට හිංසා කිරීම ලෙඩ රෝග බහුල පුද්ගලයකු වීමට ද හේතු වෙයි.

**මෝහ මූලික සිත් 02**

1. උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුත්ත සිත
2. උපෙක්ඛා සහගත උද්ධච්ච සම්පයුත්ත සිත

මෙම මෝහ සිත් දෙක ලෝභ සිත්, දෝස සිත් මෙන් බරපතල නොවේ. දෙවන මෝහ සිතට අපායෙහි ඉපදවීමට ශක්තියක් නැත.

**ක්‍රියාකාරකම්:**

1. වාහනයකට හසු වී තුවාල වූ කෙනෙකුට ඔබ බෙහෙත් දමා සුවපත් කළ හොත් ඒ පිනෙන් ඔබට ලැබෙන විපාකය කුමක් ද?

2. යම් මිනිසෙක් සතුන් මරා මස් විකුණා මුදල් ලබා සුව පහසු ජීවිතයක් ගත කරයි. ඔහුට සතුන් මැරීම නිසා ලැබෙන විපාක මොනවා ද?

**අහේතුක සිත් 18**

1. අහේතුක අකුසල විපාක සිත් 7
2. අහේතුක කුසල විපාක සිත් 8
3. අහේතුක කිරිය සිත් 3

| *අහේතුක අකුසල විපාක සිත් 7* | *අහේතුක කුසල විපාක සිත් 8* |
|---|---|
| 1. උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය | 1. උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය |
| 2. උපෙක්ඛා සහගත සෝත විඤ්ඤාණය | 2. උපෙක්ඛා සහගත සෝත විඤ්ඤාණය |
| 3. උපෙක්ඛා සහගත ඝාණ විඤ්ඤාණය | 3. උපෙක්ඛා සහගත ඝාණවිඤ්ඤාණය |
| 4. උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණය | 4. උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණය |
| 5. දුක්ඛ සහගත කාය විඤ්ඤාණය | 5. සුඛ සහගත කාය විඤ්ඤාණය |
| 6. උපෙක්ඛා සහගත සම්පටිච්ඡනය | 6. උපෙක්ඛා සහගත සම්පටිච්ඡනය |
| 7. උපෙක්ඛා සහගත සන්තීරණය | 7. සෝමනස්ස සහගත සන්තීරණය |
| | 8. උපෙක්ඛා සහගත සන්තීරණය |

**අහේතුක කිරිය සිත් 3**

1. උපෙක්ඛා සහගත පංචද්වාරාවජ්ජන
2. උපෙක්ඛා සහගත මනෝද්වාරාවජ්ජන
3. සෝමනස්ස සහගත හසිතුප්පාද

අකුසල් සිතකින් පාපයක් කරන පුද්ගලයා මිය ගිය විට එම අකුසලය හේතුවෙන් අපායෙහි උපදී. එම උපත සිදුවන්නේ අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතෙනි.

යම් පුද්ගලයෙක් ඉතාමත් ම දුර්වල කුසල කර්මයක් කරයි. ඔහු මියගොස් එම කුසල කර්මයෙහි විපාක ලෙස මිනිස් ලොව උපදින්නේ උපතින් අන්ධයකු හෝ බිහිරකු හෝ නපුංසකයකු ආදි හෝ ස්වරූපයකිනි. එම උපත සිදුවන්නේ කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතෙනි.

## අභිධර්මය

# 3 පාඩම

## මහග්ගත සිත්

දෙවන පාඩමෙහි දක්වන ලද කාමාවචර සිත්වලින් පසුව අපට ඉගෙනුමට ලැබෙන්නේ රූපාවචර හා අරූපාවචර සිත්ය. ඒවා **මහග්ගත සිත්** වශයෙන් හැඳින්වේ. පහත දැක්වෙන්නේ එම මහග්ගත සිත්ය.

**රූපාවචර සිත් 15**

භාවනා කරන විට සිත කිළිටි කරන ධර්ම හෙවත් කෙලෙස් යටපත් වෙයි. එම කෙලෙස් නීවරණ නම් වේ. ප්‍රිය රූපදැකීම, ප්‍රිය ශබ්ද ඇසීම ආදියට ඇති කැමැත්ත ආශාව කාමච්ඡන්දය යි. තරහව ව්‍යාපාදය යි. අලසකම ථීනමිද්ධය යි. මේ ආදී නීවරණ පහක් ඇත. මෙසේ නීවරණ යටපත්වීමත් සමඟ වෙනත් කරුණු පහක් උපදී. ඒවා ධ්‍යාන අංග නම් වේ. විතක්ක, විචාර, පීති, සුඛ, ඒකාග්ගතා යන මේ අංග ඇතිව උපදින සිත් ධ්‍යාන සිත් නම් වේ. මෙම ධ්‍යාන සිත් රූපාවචර කුසල සිත්ය. එවා පහකි. ක්‍රමයෙන් ධ්‍යාන අංග අඩුවෙමින් කුසල් සිත් පහ ලැබෙන අන්දම පහත දැක්වේ.

**කුසල සිත් 5**

1. විතක්ක,විචාර, පීති, සුඛ, ඒකග්ගතා සහිත පඨමජ්ඣාන කුසල සිත
2. විචාර, පීති, සුඛ, ඒකග්ගතා සහිත දුතියජ්ඣාන කුසල සිත
3. පීති, සුඛ, ඒකග්ගතා සහිත තතියජ්ඣාන කුසල සිත
4. සුඛ, ඒකග්ගතා සහිත චතුත්ථජ්ඣාන කුසල සිත
5. උපෙක්ඛා ඒකග්ගතා සහිත පංචමජ්ඣාන කුසල සිත

## විපාක සිත් 5

ඉහත සඳහන් ඕනෑම රූපාවචර කුසල සිතක් උපදවා ගෙන එම සිතින් මියගොස් බඹලොව උපදින විට ඇතිවන සිත රූපාවචර විපාක සිතකි. ඒවාද 5කි. කුසල යන පදය වෙනුවට විපාක යන පදය යොදා එම සිත් පහ හඳුන්වනු ලැබේ.

උදා:- විතක්ක, විචාර, පීති, සුඛ, ඒකග්ගතා සහිත පඨමජ්ඣාන විපාක සිත

## කිරිය සිත් 5

රහතන් වහන්සේලාට උපදින්නේ රූපාවචර කිරිය සිත්ය. ඒවාද පහකි. කුසල යන පදය වෙනුවට කිරිය යන පදය යොදා කිරිය සිත් පහ හඳුන්වනු ලැබේ.

උදා:- විතක්ක, විචාර, පීති, සුඛ, ඒකග්ගතා සහිත පඨමජ්ඣාන කිරිය සිත

## අරූපාවචර සිත් 12

රූපාවචර ධ්‍යාන උපදවා ගත් කෙනකුට කැමති නම් ඊට වඩා උසස් ධ්‍යාන හතරක් උපදවා ගත හැකිය. එම ධ්‍යාන "අරූපාවචර ධ්‍යාන" නමින් හඳුන්වා ඇත. එම ධ්‍යාන උපදවා ගත්තා විට ඇතිවන සිත් අරූපාවචර කුසල සිත් නම් වේ.

### කුසල සිත් 4

1. ආකාසානඤ්ච - ායතන කුසල සිත
2. විඤ්ඤාණඤ්ච - ායතන කුසල සිත
3. ආකිඤ්චඤ්ඤ - ඤායතන කුසල සිත
4. නේව-සඤ්ඤා- නාසඤ්ඤා - යතන කුසල සිත

සැ.යු. මෙහි ඉරිවලින් වෙන්කර ඇත්තේ උච්චාරණ පහසුව පිණිසය.

**ලෝකෝත්තර සිත්**

ඉහත සඳහන් ලෝක තුනෙන් එතරවීම සඳහා උපකාරවන සිත් ලෝකෝත්තර සිත් නම් වේ. එම සිත් මෙසේය.

| කුසල සිත් 4 | | විපාක සිත් 4 | |
|---|---|---|---|
| සෝතාපත්ති | මග්ග සිත | සෝතාපත්ති | ඵල සිත |
| සකදාගාමී | මග්ග සිත | සකදාගාමී | ඵල සිත |
| අනාගාමී | මග්ග සිත | අනාගාමී | ඵල සිත |
| අරහත්ත | මග්ග සිත | අරහත්ත | ඵල සිත |

මාර්ග සිතක් උපන්විට ඊලඟට උපදින්නේ එම ඵල සිතයි. නොවරදවාම මාර්ග සිතට අනතුරුව ඵල සිත උපදින්නේම ය.

**සෝවන් පුද්ගලයා** යනු සෝතාපත්ති ඵල සිත උපදවාගත් පුද්ගලයා ය. ඔහුගේ සසර කෙටිය. කොතෙක් පමා වූවද අටවෙනි වරට නොඉපදී තුන් ලෝකයෙන් ම එතෙර වෙයි.

**සකදාගාමී පුද්ගලයා** යනු සකදාගාමී ඵල සිත උපදවාගත් පුද්ගලයා ය. ඔහු මරණින් පසු කාමලෝකයෙහි එක් වරක් උපදී. තුන් ලෝකයෙන් එතෙර වෙයි.

**අනාගාමී පුද්ගලයා** යනු අනාගාමී ඵල සිත උපදවාගත් පුද්ගලයා ය. ඔහු මරණින් පසු රූපාවචර බඹලොව උපදී. එහිදීම රහත්ව ලෝකයෙන් එතෙර වෙයි.

**අරහත්ත පුද්ගලයා** යනු අරහත් ඵල සිත උපදවාගත් පුද්ගලයා ය. ඔහු මරණින් පසු උපදින්නේ නැත. ලෝකයෙන් එතෙර වූ හෙයිනි.

## සිත ගැන දැන ගැනීමෙන් ඇති ප්‍රයෝජන

දූරංගමං ඒක චරං
අසරීරං ගුහාසයං
යේ චිත්තං සඤ්ඤමෙස්සන්ති
මොක්ඛන්ති මාර බන්ධනා

දූරගමන්යන, තනිව හැසිරෙන
සිරුරක් නැති, ශරීරය නැමති ගුහාවෙහි වසන
මේ සිත යම් කෙනෙක් සංවර කර ගනිත්ද
ඔවුහු මාර බන්ධනයෙන් මිදෙති.

අප මෙතෙක් උගත් සිත් අතර ඇති කාමාවචර, රූපාවචර, අරූපාවචර යන සිත් ලෝකයට අයත් හෙවත් ලෞකික සිත්ය. ඒවායින් අකුසල සිත් දුරුකර කුසල සිත් උපදවා ගැනීමෙන් සහනසීලී ජීවිතයක් ගොඩනගා ගත හැකිය. ලෝකෝත්තර සිත් උපදවා ගැනීමෙන් ක්ලේශ මාරයාගෙන් මිදී නිවන් සුව ලබා ගත හැකිය.

**ක්‍රියාකාරකම:**

1. සිත් අටකට ලෝකෝත්තර යන නම යෙදී ඇත්තේ ඇයිදැයි පැහැදිලි කරන්න.

දහම් පාසල් සිසුන් සඳහා
නොමිලයේ
බෙදාදීම පිණිසයි